පිටපත් 750,000 ක් අලෙවි වූ ජනප්‍රියම නවකතාව...
750,000 copies SOLD...

සුජීව ප්‍රසන්න ආරච්චි

# නිලම්බරේ 4

සීතල හගුරන්කෙත කඳුකරයේ
මල් උයනකුත්
සුන්දර සිංගප්පූරුවත්
පසුබිම් කරගෙන
ගලාගෙන යන
අසිරිමත්
ආදර කතාවක්....



The Reader's Place
Novel..

**Nirwan**
age 23
ජීවිතයේ එකම වත්කම
ආදරය යැයි ඇදහූ තරුණයෙක්...

**Samadhi**
age 20
එක අහිංසක ඇසකින් ආදරයේ
දේව දූතයා දුටුව පසු එයම ඇදහූ යුවතියක්.....

පිට රටක සිට මව්බිමට එද්දී කොතරම් සතුටක් දැනෙනවාද... ඒත් මට ඒ සතුට නැත. මා කොතරම් පව්කාරයෙක්ද...

"ඔයාගේ අතත් වෙව්ලනවා සුදූ..."

සැබෑය... සමාධිගේ උකුල මත තිබූ මගේ අත ඇත්තටම වෙව්ලමින් තිබුණි.

"මොනවත් හිතන්නෙපා බ..බා..."

සමාධි මගේ වෙව්ලන අත පහත් වී නොනවත්වා සිපගත්තාය. මොනවා කීවද ඇයටද අහිමි වීමක වියෝගයක කම්පනය දැනෙමින් තිබෙනවා විය යුතුය.

"තව විනාඩියයි..."

සමාධි කීවාය. මම ඇය දෙසම බලා උන්නෙමි.

"මැරුණත් මං ඔයාගේ සුදූ..."

ඒ පොරොන්දුව මේ දුෂ්කර මොහොතේදී හිත හදා ගන්නට මට ඇතිය.

එකවරම යානය කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට ගොඩබැස්සවිණ. දැන් යානය යන්නේ කටුනායක ගුවන් පථය ඔස්සේය.

මව්බිමේ පොල් ගස් දෙස මම කුඩා කව්ළුවෙන් බලා උන්නෙමි.

"ම..ට අ..මා..රු..යි ව..ගේ ම..හ..ත්..ත..යෝ..."

සමාධි පපුවට අතක් තබාගෙන කීවාය. ඇගේ පපුවේ අමාරුව වැඩිවෙන්නට ඇත්තේ හදවතට දැනුණ කම්පනය නිසා විය යුතුය.

"අනේ මැණික... ඔයාව සනීපෙන් මට බාරදෙන්න ඕන... මේ ටැබ්ලට් එක අරන් ටිකක් රිලැක්ස් වෙන්න බබා..."

මම එහා හදිසි අවස්ථාවකට ගන්නා ටැබ්ලට් එක දුන්නෙමි. ඒත් සමඟම ගුවන් මගීන් ගුවන් යානයෙන් පිට වීමට නැඟිට්ටෝය. මම බිය මුසුව සමාධි දෙස බැලුවෙමි.

"ම..ට කලන්තේ වගේ ම..හත්තයෝ..."

පිට වීමට ප්‍රථම සමාධිට අමාරු වෙතැයි මම බිය වීමි. දෙවියන් මගෙන් පළිගන්නේ ඉතාම කුරිරු ලෙසය. මේ ආත්මයේ වරදක් පවක් නොකළද මා නම් පූර්ව ආත්මයක මහා පවක් කරන්නට ඇත. ගුවන් ගමන පුරාමත් ඊට කලිනුත් මම දහස්වර දෙවියන්ට මේ ගැන කීවෙමි. එහෙත්...

"තා..ත්..තලා හම්බවෙනකල් ටි..ක..ක් ඉවසන් ඉන්න සු..දූ.. ආ.. මේ පෙති දෙකත් බොන්න..."

මම සාමාන්‍ය පැරසිටමෝල් පෙති දෙකකුත් සමාධිට දුන්නෙමි. අප දෙදෙනාගේම දෑස් බලන්නට බැරි තරම් රතු වී තිබුණි.

අප අද වෙන් වුවද මම එක් දෙයක් ගැන සැනසෙමි. ඒ මට හමු වූ දා සිට මගේ බිරිඳ මට දෙවියෙකුට මෙන් ආදරය කළේ යැයි සිතාය. ඉන් පසුවත් ඇය මට එලෙසම ආදරය කරන බව මම දනිමි.

"අපි බහිමු සු..දූ..."

අප දෙදෙනා ගුවන් යානයෙන් බැස්සේ අන්තිමටය. සිංගප්පූරු ඇඳුමින් සැරසුණු ගුවන් සේවිකාව දෙස මම අවසන් වරටත් බැලුවෙමි.



The Reader's Place
Novel.

සුජීව ප්‍රසන්න ආරච්චි

# නිලම්බරේ 4

ප්‍රථම මුද්‍රණය 2014 අගෝස්තු

© සියළු හිමිකම් ප්‍රකාශකයන් සතුය.

## සුජීව ප්‍රසන්න ආරච්චිගේ ආදරණීය නිර්මාණ යාය...

- බොඳ මීදුම්
- බොඳ මීදුම් 2
- බොඳ මීදුම් 3
- ආත්මීය නවකතා
- ආත්මීය නවකතා 2
- කළුවර ඇයි විජිතයම මගේ
- කළුවර ඇයි විජිතයම මගේ 2
- චායා
- චායා 2
- චායා 3
- චායා 4
- මල් මිටියාවත
- මල් මිටියාවත 2
- සින්දූර්
- සින්දූර් 2
- සින්දූර් 3
- සින්දූර් 4
- නිලම්බරේ
- නිලම්බරේ 2
- නිලම්බරේ 3
- නිලම්බරේ 4
- ජීවිතයට ජයවේවා
- කුංකුම අංජන
- කුංකුම අංජන 2
- සඳා වාසනා
- සඳා වාසනා 2
- වර්ෂා
- වර්ෂා 2
- වර්ෂා 3
- වර්ෂා 4
- වර්ෂා 5
- වර්ෂා 6
- වර්ෂා 7
- වර්ෂා 8
- වර්ෂා 9
- වර්ෂා 10
- වර්ෂා 11
- මහමෙව්නා
- පත්තිනි වන්දනා
- පත්තිනි වන්දනා 2
- පත්තිනි වන්දනා 3
- පත්තිනි වන්දනා 4
- සෙනෙහස දූකක්
- සෙනෙහස දූකක් 2
- සෙනෙහස දූකක් 3
- මල් යහන්
- උතුම් පැතුම්
- උතුම් පැතුම් 2
- උතුම් පැතුම් 3
- උතුම් පැතුම් 4
- උතුම් පැතුම් 5
- උතුම් පැතුම් 6
- දෙහදක කතාවක්
- කඳුළක කැළලක්
- සපූ
- සපූ 2
- සපූ 3
- සපූ 4
- සපූ 5
- සපූ 6
- රත්තරු
- දේදුණු
- දේදුණු 2
- ලස්සන වැස්සක්
- දෙහදක් අතර
- English ගුරු
- English ගුරු 2
- English ගුරු 3
- තරු
- තරු 2
- පුංචි පාර ලස්සනයි
- දළදා වීදිය
- සීගිරි
- දෙනුවන්
- සුදු අක්කා
- සුදු අක්කා 2
- සුදු අක්කා 3
- නිම්නා
- දෙනෙත්
- සල්මල් මාවත
- සල්මල් මාවත 2
- හත්තානේ කතාව

The Reader's Place

Novel..

**NILAMBARE 4**

A Sinhala Novel

© සුජීව ප්‍රසන්න ආරච්චි

| | | |
|---|---|---|
| ප්‍රකාශන අධ්‍යක්ෂිකා | - | මධාරා වඩුගේ |
| කංචුක නිර්මාණය | - | නවීන්ද්‍ර වීරසේකර |
| පරිගණක අක්ෂර සංයෝජනය | - | නලීන් රණවීර/සමන්ත ගමගේ |
| ප්‍රකාශනය | - | මධාරා පොත්, තැ.පෙ. අංක 70, නුගේගොඩ. |
| මුද්‍රණය | - | තරංජී ප්‍රින්ටර්ස් |
| විද්‍යුත් තැපැල | - | madarabooks@yahoo.com |
| ෆැක්ස් | - | 0[illegible]11 |



# ප්‍රාර්ථනා

### කවිය

පාළු රැයක
දෑස පලා...
ගැලූ කඳුළ
සදා රැකිමි...

ඔබේ කඳුළ
ඔබට වඩා...
ළයේ තබා
සුරැකිමි මම...

මටත් වඩා
මට පෙමකළ...
ඔබ ගැන මම
කවක් ලියමි...

සදාතනික
ආදරයක...
සිහිවටනය
ඔබෙන් නෙලමි...

නටබුන් වූ
ආදරයක...
සුන්බුන් මැද
සදා සරමි...

අප ගිය මග
දුහුවිලි ගෙන...
ඔබේ දෙපා
සුවඳ සොයමි...

අප හමුවූ
අප වෙන්වූ...
අහස යටම
හඬා වැටෙමි...

ඔබ හැර මට
පතන්න තව...
කෙනෙක් නොමැති
තනිව මියෙමි...



The Reader's Place Novel..

සමාධි හිටි හැටියේම අසනීප වූයේ ඇයි... අවුරුදු විසි එකකදී යුවතියකට වැළඳිය හැකි අසනීපය කුමක්ද... මම කාලි මාතා කෝවිලේ සිට අනාථයෙකු සේ පැමිණ වාහනයට ගොඩ උනෙමි.

"මට හරි බයයි මචං..."

රවී මා දෙස අනුකම්පාවෙන් බලා උන්නේය. ඔහුවත් නොහිටියානම් ඇතිවන තත්වය මට සිතා ගැනීමට වත් නොහැක.

"අපි නංගිව ඉක්මනට සනීප කරගමු..."

"මේ කෙල්ලට හදිස්සියේ මොනව උනාද කියලා හිතාගන්න බෑ රවී... උඹට මතකනේ බර්ත් ඩේ එක දවසේ සිංදු කියලා ඩාන්ස් කරපු හැටි..."

"ඒකනේ... පව් කෙල්ලට අමාරු නැත්නම් ඔහොම ඉන්නෑ... මටත් හරි දුකයි..."

"උඹට කරදරයක් නැත්නම් පාන්දරම මාව හොස්පිට්ල් එකට ආනවද..."

"උඹ බයවෙන්නෙපා... මං එනවා... ලංකාවේ කොල්ලෙක්ව අපි එහෙම තනි කරනවද බං... මොකෝ මෙහේ අපිට අම්මා තාත්තා ඉන්නවා කියලද..."

රවී එසේ කීවද මේ ජීවිතයේ හැම බරක්ම ඔවුන් පිට දමන්නේ කෙසේද... අපේ ඇති දහසකුත් එකක් ප්‍රශ්න වලට ඔවුන් කුමක් කියා කරන්නද...

"උඹ ටිකක් ඇලවෙයන්..."

වාහනය නිවස අසළ නවතා රවී කීවේය.

"මට නින්ද යන්නෑ මචං... අපරාදේ මට තිබ්බේ හොස්පිට්ල් එක ගාව ඉන්න..."

"උඹට පිස්සුද මචං... උඹලට තාම වීසා හරියට ඉෂ්‍යූ කරලත් නෑ... පාස්පෝට් එකත් අතේ නෑ... මේ කරදර අස්සේ ජරමර දාගන්නෙපා... මං සමනයට කියන්නම් කෝපි එකක් හදලා එවන්න කියලා..."

අප දෙදෙනා ජීවත් වූ කුඩා කාමරයට මා ඇතුල් වී ප්‍රථම විනාඩිය තුළම මට ඇඬෙන්නට විය. සමාධි මා වටා කැරකෙද්දී කොතරම් පිරුණු හැඟීමක් මට එනවාද... ඇය ළඟ සිටිද්දී හිත වෙසක් පහන් කූඩුවක් මෙනි.

ඒ සැනසීම පිරුණ හැඟීම අද නැත. මුළු කාමරයම මළ සොහොන් බිමක් වැනිය.

මම ඇඳමතවත් වාඩි නොවී පිස්සෙකු මෙන් කුඩා කාමරයේ ඒ අතටත් මේ අතටත් කැරකුනෙමි. පපුව ගැහෙන්නේ පුදුමාකාර ලෙසිනි. මම සමාධි අවසන් වරට ඇඳ උන් රෑ ඇඳුම අතට ගත්තෙමි. ඉන් එන්නේ ඇගේ පපුවේ ගෑ බාම් සුවඳය.



මගේ දෑසින් නොනවත්වා කඳුළු ගලාගෙන යන්නට විය. කුඩා කාමරයේ තැනින් තැනින් මට සමාධිගේ මුහුණ මැවී පෙනෙන්නට විය.

"මං ඊයේ රෑ දැක්කා මං මැරිලා මිනී පෙට්ටියක ඉන්නවා..."

හඟුරන්කෙතට මහා වැසි ඇද හැලුනු පාන්දරක මගේ කාමරයට පැමිණ සමාධි කීවාය.

"මේ දවස් වල රෑට ගොඩාක් සීතලයිනේ..."

මම ඇය කියූ දේ ගණන් නොගෙන කීවෙමි.

"ම්... සීතලට පෙනිච්ච හීනයක් නෙමේ... ඇත්තටම මාව මැරෙයි... අපේ කොළඹ ගෙදර සාලේ මගේ පෙට්ටිය තියලා තිබ්බේ..."

"ඉතින්..."

"මං මේ පාන්දරම ආවේ ඒක අහන්න නෙමේ... මං මැරිලා ඉන්නවා... ඒත් මහත්තයා පේන්නවත් නෑ... කියනවා කොහෙද ගිහින් හිටියේ... මං මැරුණම මගේ මිනිය බදාගෙන අනේ සුදෝ මාව දාලා යන්නෙපා සුදූ පැටියෝ ගගා අඬන්න ඕනනේ..."

සමාධි එදා කීවේ ඇත්තටම තරහෙනි.

"බබාගේ මිනිය බදාගෙන අඬන්න මං නෑ තමයි..."

"ඇයි ඒ..."

"බබාට කලින් මං මැරිලනේ... මං ඔයා එනකල් තව්තිසාවේ ගේට් එක ළඟ බලන් ඉන්නවා..."

මම සිනාසී කීවෙමි.

"පලයන් යන්න..."

The Reader's Place
Novel..

සමාධි මට රවා අතින් ගැසුවාය.

“කවදාහරි මායි ඉස්සෙල්ලා මැරෙන්නේ... මට බෑ මහත්තයගේ මිනිය බදාගෙන අඬන්න... බෑම තමයි...”

“පිස්සුවටද මැරෙන කතා කියවන්නේ...”

“පිස්සු නෙමේ... ඒක නෙමේ... මිනියට අන්දවලා තිබ්බේ ලස්සන සුදු දිග ගවුමක්... ඇත්ත මට වඩා මිනිය ලස්සනයි නිර්වාන්... හරි සීදේවි පාටයි...”

“එම්බාම් එක හොඳට කරල ඇති...”

එදා හිතට සතුටක් ගෙනා මේ සිදුවීම මට මේ මොහොතේ සිහිවී පපුවම හැරී ගියේය.

The Reader's Place Novel..

“නිර්වාන්... ඇයි මේ උඹ ආඩිය දාගෙන... ටිකක් ඇලවෙලා හිටපන්...”

රවී නෙස්කැෆේ එකක්ද රැගෙන උඩට පැමිණ කීවේය. මම ඔහු අත තිබූ සිගරට් පැකට්ටුවෙන් දුම්වැටියක් දල්වා ගත්තෙමි.

සමාධි දින කිහිපයක් රෝහලේ නවත්වා ගතහොත්... මා ඒ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ කෙසේද... විදේශ රටක පෞද්ගලික රෝහලක වියදම් පුදුමාකාර තරම් මිල අධිකය. මට රෝහලේ ගාස්තු ගෙවා දමන්නට නොහැකි වුවහොත් ඔවුන් ප්‍රතිකාර නවත්වනු ඇත.

දැනටමත් සමාධිව පරීක්ෂණ කිහිපයකට යොමු කරවන්නට ඇත. ඒවා ඉතා මිළ අධික වෛද්‍ය පරීක්ෂණය.

මගේ පවුල් ජීවිතයේ කටුකම මොහොතට මා පැමිණ ඇතැයි මට සිතුණි. මට පිහිටක් ඉල්ලන්නට කෙනෙක් නැත. දුක කියා අඬන්නට වත් කෙනෙක් නැත. උන්නේ



එකම කෙනෙකි. ඒ සමාධිය. මේ ලෙස දුකට පත් වූයේද ඇයමය.

මම දුම්වැටිය දල්වාගෙන කවුළුවෙන් සිංගප්පූරු නගරයේ උස් ගොඩනැගිලි දෙස බලා උන්නෙමි. මේ නන්නාඳුනනා විසිතුරු නගරය මැද මා අද කොතරම් අසරණද...

ඇල්මක් බැල්මක් නැතිව මේ නගරයේ කෙසේ නම් දිවි ගෙවන්නද...

හදිස්සියේම සෙලියුලර් දුරකතනය නාද විය. මම වහා එය කනේ තබාගත්තෙමි.

“පු..තේ...”

කතා කළේ සමාධිගේ අම්මාය. දැන් ලංකාවේ වේලාවද මහ රෑය. ඇය මේ මහ රෑ කතා කරන්නේ ඇයි...

“ඇ..යි ඇ..යි අම්මේ...”

“පුතේ... කෙල්ලයි ඔයයි කරදරයක් නැතුව ඉන්නව නේද...”

මගේ පපුව පත්තු විය. ඇගේ දුව අද සිංගප්පූරුවේ රෝහලක නවත්වා ඇති බව මේ අම්මා දන්නවා නම්... ඒ බවක් ඇයට කියා ඇගේ පපුව ගිනි තබන්නට නොහැක.

“පු..තේ ඇයි පුතේ...”

“නෑ... අම්මේ... නි..දි..ම..තේ හිටියේ...”

මම බොරුවක් කළෙමි.

“ඔය දෙන්නට කරදරයක් නෑ නේද රත්තරන්...”

ඇය නැවත නැවතත් එසේ අසන්නේ ඇයි...

"ඇ..යි අම්මා එහෙම අහන්නේ..."

"මං පුතේ දැන් හරි නරක හීනයක් දැක්කා... ඒක දැකපු වෙලාවේ ඉඳලා මට නින්ද යන්නෑ... මං මේ බුදු පහනට බාරෙකුත් තියලා ඇවිත් පුතාට කතා කලේ..."

දරුවන්ට දුකක් කරදරයක් වූ කල එය දෙමව්පියන්ට පෙන්නුම් කරන්නේ පුදුමාකාර ලෙසිනි.

"නෑ අම්මේ... එ..හෙම කරදරයක් නෑ... අපි හොඳින් ඉන්නවා..."

"මට බය හිතුනා පුතේ..."

"අම්මා හැම වෙලාවෙම අපි ගැන හිත හිතනේ ඉන්නේ..."

"ඔයාලා ගැන නොහිතා මං කා ගැන හිතන්නද වස්තුවේ... තුණුරුවන්ගේම පිහිටයි... දැනුයි මගේ ඇඟට ලේ ටිකක් ඉනුවේ... කෙල්ලට ටිකක් දෙන්න පුතේ..."

මගේ පපුව රත් වූයේ එවිටය. දැන් මා ඇයට කතා කරන්නට දුවෙක් කොහෙන් හොයන්නද... මම මොහොතක් දුරකතනය තබාගෙන කල්පනා කළෙමි.

"බබා හොඳට නිදි අම්මේ... මං උදේ නැඟිට්ට ගමන් අම්මට ගන්න කියන්නද... අද ටිකක් රෑ වෙලා නිදාගත්තේ..."

"එහෙනම් ඇහැරවන්නෙපා පුතේ... පව්.. නින්දෙන් නැඟිට්ටුවහම ඉස්සර නම් හරියට කේන්තියනවා... මං තියන්නම් පුතේ... බුදු සරණයි..."

"බුදු සරණයි අම්මේ..."

දුරකතනය තබද්දී මගේ දෑසම තෙත්වී තිබුණි.

The Reader's Place Novel..



මේ එල දෙන්නේ කවර නම් පාපයක්ද...

මහා පාන්දරම මම සමාධිගේ ඇඳුම් කිහිපයක්ද ර ගෙන පහළට බැස්සෙමි. ගෙවී ගිය රැය පුරාම මම මොහොතකටවත් ඇහැ නොපියෙව්වෙමි. මගේ ජීවිතයේ මා ගත කළ කටුකම රාත්‍රිය පෙරදා රැය විය. ඒ රාත්‍රියේදී මම අමු අමුවේම දහස් වතාවක් මැරී මැරී ඉපදුනෙමි.

"උඹ මුළු රෑම නිදාගත්තේ නෑ නේද..."

රවී වාහනයේ යතුරද රැගෙන නිවසින් පිටවෙමින් කීවේය.

"නිදාගන්නේ කොහොමද මචං... කෙල්ලට මොනවා වෙලාද දන්නෑ..."

"බයවෙන්නෙපා... උඹේ කෙල්ලට මුකුත් වෙන්නෑ..."

මගේ හිත සනසන්නට රවී එසේ කීවද මගේ හිතට නම් නිවනක් තිබුණේම නැත. මම වාහනයට නැග්ගේ ගතින් පමණක් ජීවත්වන හදවතක් මැරුණු මළකඳක් බඳුවය.

වාහනය ශ්‍රී ලංකාරාමය අසළින් යද්දී මම දෑත් එක්කොට වැන්දෙමි. හඟුරන්කෙත පත්තිනි දේවාලයට බාර වී පටන්ගත් ආදරයකට මෙහෙම දුක් දෙන්නේ ඇයි. සිංගප්පූරුවට එන්නට ප්‍රථම ජය ශ්‍රී මහා බෝධියට අප ගොස් බාර වූ අයුරු මට සිහිවිය.

සමාධි මේ ගෙවන්නේ ඇගේ කරුම නොව මගේ කරුම යැයි මට සිතුණි. මා ඇත්තටම පව්කාරයෙකැයි මට සිතුණි.

"උඹ මොනවද කල්පනා කරන්නේ..."

"හිතට හරියට බයයි රවී... කෙල්ල දිගටම අසනීප උනොත් මං කොහොමද කෙල්ලව මෙහෙම සිංගප්පූරුවේ හංගගෙන ජීවත් වෙන්නේ..."

රවී කිසිවක් නොකියා කල්පනාවට වැටුණේ ඒ තත්වය ඒ තරමටම බරපතල නිසාය.

"ලංකාවේ උඹට උදව්වක් ගන්න කිසිම කෙනෙක් නැත්ද..."

මට සිහිවූයේ මධූවත් සුභාෂ්වත්ය.

"හිටියත් එහෙම කරදර කරන්නේ කොහොමද මචං... බලපන් අපි දැනටම උඹට දීලා තියෙන වදේ..."

"ඒක හිතන්න එපා නිර්වාන්..."

"මොනවත් කරන්න බැරි උනොත් මං කෙල්ලවත් අරන් ලංකාවට යනවා රවී..."

"එහෙම ගියොත්..."

"සමහර විට එයාව මට නැතිවෙයි... ඒත් ඊට වඩා මට මගේ කෙල්ලගේ ජීවිතේ වටිනවා... එයා කොහේ හරි ජීවත් වෙන්න ඕන... මං එක්ක ඇවිත් මෙහෙම දුක් විඳින්න දෙන්න බෑනේ..."

මට කළ හැකි එකම දේ එපමණය. මා සමාධිත් සමඟ ලංකාවට ගිය විගසම ජයසූරිය මහතාත් සුදේශුත් පැමිණ සමාධිව මගෙන් වෙන් කරනු ඇත. එහෙත් ඒ ඉරණමට බිය වී අසරණ කෙල්ලට නන්නාඳුනනා රටක නන්නාඳුනනා රෝහලක දුක් විඳින්නට දිය හැකිද...

"එයාට මෙහෙම දිගින් දිගට අසනීප වෙන්න ගත්තොත් මට රස්සාව කරන්නත් බෑනේ... මං දන්නවා



උඹලත් ජීවත් වෙන්නේ අමාරුවෙන්..."

"උඹයි කෙල්ලයි සිංගප්පූරුවේ ඉන්න තාක් කල් අපි පුළුවන් විදිහට උදව් කරන්නම් නිර්වාන්... උඹට කෙල්ලව අරන් ලංකාවට යන්න ඕන නම් අපි ඒකටත් උදව් කරන්නම්..."

සියල්ල ගැන තීරණයක් ගත යුත්තේ සමාධිගේ තත්වය බලාය. තුණුරුවන්ගේ පිහිටෙන් ඇයට අමාරුවක් නොවේවායි මම පැතුවෙමි.

එහෙත් දෙවියන් කරන්නේ අප පතනා දේම නොවේ. ඔහුට අවශ්‍ය දේය.

ඕර්චාඩ් මාවතේ මවුන්ට් එලිසබෙත් රෝහල ඉදිරිපිට වාහනය නවත්වද්දී හරියට එළියවත් වැටී නැත. මගේ පපුව අසාමාන්‍ය ලෙස ගැහෙන්නට විය.

"ඔක්කොටම ඉස්සෙල්ලා අපි අර සිංහල කෙල්ලව කන්ටැක් කර ගමු... ඒකි කියයි විස්තර... අපි සමාධි ගැන බලන්න කියලනේ ආවේ..."

රවී පිළිගැනීමේ කවුන්ටරයට ගොස් මේ රෝහලේ සේවය කරන ලංකාවේ යුවතියට පණිවිඩයක් ඇරියාය. ඇය එනතුරු අප රෝහලේ ඉදිරිපිටට වී බලා උන්නෙමු.

"කෙල්ල එනවා..."

මගේ හදවතේ ගැස්ම වැඩි විය. ඇය එද්දී මම ඇගේ මුහුණේ ඉරියව් පරීක්ෂා කළෙමි. ඒ මුහුණේ සතුටුදායක සිනහවක් නොවීය.

"කොහොමද චූටි අපේ නංගිට..."

රවී ඇසුවේය.

"මං මුළු රෑම හිටියේ එයා ළඟ... මගේ ඕෆ් එක ඒත් මං හිටියා..."

"එයාට කොහොමද... රෑ නිදාගත්තද..."

ඇය මගේ මුහුණ දෙසම මොහොතක් බලා උන්නාය. මගේ දෙපා පණ නැති වීගෙන ගියේය.

"රවී අයියා චුට්ටක් එනවද..."

රවීව පැත්තකට කර ඇය කියන්නට යන්නේ කුමක්ද... මාව ගැහෙන්නට විය.

"ක..ම..ක් නෑ... මට ඇත්ත කියන්න... එයාට අමාරුද... කියන්නකෝ..."

"ටි..ක..ක් අමාරුයි..."

ඒ කතාවෙන් මට අවබෝධ වූයේ සමාධිට ටිකක් නොව ගොඩක් අමාරු බවය.

"ඩොක්ටර්ස්ලා මොනවද කිව්වේ..."

"අද ටෙස්ට් කරන්න තියෙනවා... තව ටිකකිනුත් ටෙස්ට් එකකට ගන්නවා..."

"ඇයි ඒ..."

"මීට කලිනුත් අයියගේ මිසිස්ට පපුවේ අමාරුව ඇවිත් තියෙනවද..."

මම නැහැයි කියන්නට මෙන් හිස වැනුවෙමි. මේ මොහොතේ මගේ දෙනෙත් තිබුණේ තෙත්වය.

"පපුවේ නහරයක ප්‍රශ්නයක් තමා... හරියට තවම කියන්න බෑ..."

මම තොල් පට විකාගෙනම අසළ වූ කුළුණකට බර

The Reader's Place Novel..



උනෙමි. දෙවියනි අසරණ කෙල්ලට ඔබ එවැනි දෙයක් කළේ ඇයි.

"කලබල වෙන්නෙපා... ටෙස්ට් එක තවම ඉවර නෑනේ..."

"රෑත් අමාරු උනාද..."

"ඔව්... පස්සේ ඩොක්ටර්ස්ලා ඉන්ජෙක්ෂන් ගැහුවා... පාන්දර වගේ ටිකක් නින්ද ගියා... අමාරු වෙන හැම වෙලාවෙම ඔයාගේ නම කිය කියා තමයි කෑ ගැහුවේ..."

"ම..ට එ..යා..ව බලන්න බැරිද..."

ඇය කල්පනා කළාය.

"එන්නකෝ... තව පැයකින් තමයි බලන්න පුළුවන්... කමක් නෑ එන්න... මං ඒක බලාගන්නම්..."

ලිෆ්ට් එකේ සමාධි ඉන්නා වාට්ටුවට යද්දී මගේ හිසම කැරකැවෙන්නට විය. දැන් මේ විපත මා දරාගන්නේ කෙසේද... මගේ බිරිඳව මා සනීප කර ගන්නේ කෙසේද...

"එන්න..."

සමාධිව දමා තිබුණේ අයි.සී.යූ. යුනිට් වශයෙන් හඳුන්වන දැඩි සත්කාර ඒකකයට අදාල කාමරයකටය. සමාධිගේ තත්වය බරපතල බව හිතන්නට එය ප්‍රමාණවත්ය.

"අර ඉන්නේ... වැඩිය ටෙන්ෂන් දෙන්නෙපා... අයියා ගිහින් කතා කරන්න..."

රවීත් ඇයත් කාමරයේ පිටත රැඳී උන්නෝය. මම සෙමෙන් සෙමෙන් සමාධිගේ ඇඳ වෙත ගියෙමි. ඇය උන්නේ අනෙක් ඇලයට හැරී බලාගත් අත බලාගෙනය.

"බ..බා..."

මම හැඟීම් අමාරුවෙන් මැඩගෙන කතා කළෙමි. මගේ හදවතේ කවර කම්පනයක් තිබුණද එය ඇයට නොපෙන්විය යුතුය.

"අ..නේ.. ම..හ..ත්..ත..යෝ ඔ..යා ආව..ද..."

පළවෙනි වචනය කියද්දීම සමාධිගේ දෙනෙත් වලට කඳුළු ඉනුවේය.

"බයවෙන්නෙපා බබා... ඔයාට ඉක්මනට සනීප වෙයි..."

ඇය කිසිවක් කීවේ නැත. මගේ දෑතින්ම තදින් අල්ලාගෙන සමාධි හැඬුවාය.

"ම... ම.. ම..ට බෑ රත්තරන් ඔ..යා..ව දා..ලා ය..න්..න අ..නේ ම..ට බෑ..."

සීතල දෑතින් මගේ දෑත බදාගෙන සමාධි වෙව්ලමින් කියද්දී ඉබේටම මගේ දෑසද තෙත් විය.

"ක..වු..ද කිව්වේ බබා මාව දාලා යනවා කියලා... ඔයාට පිස්සුද... ඔයා කොහොමද මේ කොල්ලව දාල යන්නේ..."

"ම.. මට හා..රි අමාරුයි සුදූ... පපුව හිරවෙනවා... මං ඊයේ රෑත් මැරෙන්න වගේ ගියා... අනේ මං ඔයාව ඉල්ලලා කෑ ගැහුවා..."

"එහෙම මැරෙන්නෑ බබා..."

මට කිව හැකිව තිබුණේ එපමණකි.

"ඇයි මේ ගොඩාක් ටෙස්ට් කරන්නේ... මට මොකක්ද හැදිලා තියෙන ලෙඩේ..."



"ඔය බලන්න බබා බයවෙලා ගොඩාක් කතා කරනවනේ... ඔයාට හොඳනෑ එහෙම වෙන්න..."

"මං මැරෙන්න බයයි මහත්තයෝ... මට ඔයාව දාලා යන්න බෑ..."

හතර අතින්ම ගිනිදැල් නැඟී මාව පිච්චෙන්නාක් මෙන් විය.

"මං බබාට මැරෙන්න දෙනවද... මං කොහොම හරි ඔයාව සනීප කරගන්නවනේ... ඇයි බබාට මතක නැද්ද දවසක් කිව්වා මගේ ආදරේ තියෙනවනම් මොනවත් වෙන්නෑ කියලා..."

The Reader's Place Novel..

"මැරෙන්න යද්දී මං ඔයාව මතක් කරන්නේ ඒක තමා මහත්තයෝ... එතකොට ජීවත් වෙන්න ලොකු ලෝබකමක් එනවා... ආයෙත් පපුව ගැහෙන්න ගන්නවා..."

මම සමාධිට වැඩිපුර කතා කරන්න නොදී ඇගේ හිස පිරිමැද මැද උන්නෙමි.

"මොනවත් හිතන්නැතුව රෙස්ට් එකේ ඉන්න... මං ඉන්නවනේ බබා..."

"මේ ලොකු හොස්පිට්ල් එකක්නේ... මේ වල බිල් කොහොමද ගෙවන්නේ..."

"ඒක කොහොමහරි කරන්නම්... බබා ඒවා හිතන්නෙපා මැණික..."

"මගේ මහත්තයා පව්නේ..."

එක අතකට මා පමණක් නොව අප දෙදෙනාම පව්ය. මේ මොහොතින් පසුව ජීවිතයට මුහුණ දෙන්නේ

කෙසේද...

"ඊ අම්මා කතා කළා... බබාවත් ඇහුවා..."

"හදිස්සියේ..."

"ඔව්... අම්මා බබා ගැන නරක හීනයක් දැකලා... බයවෙලා ඒ වෙලාවෙම කතා කළා..."

"මහත්තයා අම්මට කිව්වද මං සනීප නැතුව හොස්පිට්ල් එකේ කියලා..."

"කිව්වේ නෑ බබා... එ..හෙ..ම කියන්නේ කොහොමද... බබාව ඉල්ලුවා... මං කිව්වා හොඳටම නිදි කියලා... ඒත් මට මොකක්ද ව..ගේ..."

"මට මොනවා හරි වෙන්න යනවද දන්නෑ සුදූ... ඇයි අම්මටත් මං ගැන නරක හීන පේන්නේ..."

සමාධිටත් වඩා අම්මා කතා කළ එක ගැන මට බයය.

"එහෙම හිතන්නෙපා බබා... අම්මා හැම වෙලාවෙම ඉන්නේ අපි ගැන බයෙන්නේ... බබාට පුළුවන් නම් ගෙදරට කෝල් එකක් ගන්න... මං අරන් දෙන්නද..."

සමාධි අසරණව හිස වැනුවාය.

"අ..ම්..මේ..."

සමාධිට ඇඬෙන්නට ගියේය. ඇය ඇඬුම් වාවාගත්තේ අමාරුවෙනි.

"නෑ... අම්මේ... නෑ.. මේ ඊයේ ඇවිදින්න ගිහින් ටිකක් වැස්සේ තෙමුණා... හෙම්බිරිස්සාව ඇවිත්... මං මොකට අඬනවද අම්මේ..."

එසේ කියූ සමාධි තොල් පට තදින් තද කරගෙන



දෑස් වලින් කඳුළු පිට කළාය. මම රෝහලේ බිත්තිය දෙසට හැරුනේ මගේ දෑසටද කඳුළු ඉනූ නිසාය.

"නෑ අම්මේ... කරදරයක් නෑ... අම්මා බය නැතුව ඉන්න... අම්මගේ බෑනා ඉන්න කල් මේ දුවට මොනාත් වෙන්නෑ... මං... තියන්නම් අම්මේ... බුදු සරණයි..."

වැඩි වෙලා කතා නොකර සමාධි දුරකතනය තැබුවාය. එහෙත් ඇය දුරකතනය වැසූ මොහොතේම ඇඬුවාය.

"ඇ..යි මේ..."

The Reader's Place Novel..

සමාධි මගේ දෑතම අල්ලා ඇගේ පපුවට තබාගෙන ඇසුවාය.

"ඉක්මනට සනීප වෙලා යන්... බබා නැතුව කාමරේ ඉන්න බෑ..."

මේ අඬන්නේ නිර්වාන් නම් වූ සැමියා නොවේ. ඔහු නමින් ඉන්නා අහිංසක පෙම්වතාය.

"මං... ම..හ..ත්..යා..යෝ සනීප වෙලා එ..නවා... ඉ..ක්මනට එ..න..වා... මං ම..ගේ මහත්තයව දාලා යන්නෑනේ..."

"මං යන්නම්..."

"උදේට කන්න හොඳේ... බඩගින්නේ ඉන්නෙපා..."

මින් ඉදිරියට එක වේලක් නොව වේල් දහයක් දොළහක් මට මඟ හැරෙනු ඇත.

"බු..දු සරණයි... මං ඊයේ කෝවිලටත් ගියා... අදත් යනවා..."

"අ..නේ..."

යන්නට හැරුණු මගේ අත සමාධි දුබල ලෙස අල්ලා ගත්තාය.

"මෙ..ත..න..ට එකක්..."

සමාධි ඇගේ නළලට ඇඟිල්ල තබා කීවාය. මම තොල් පට තද කරගෙන පැමිණ ඇගේ නළලත මැදට හාදුවක් දුන්නෙමි.

"ම..ගේ එ..ක මං සනීප වෙලා ආවම දෙන්නම්... හො..ද..ද..."

අමාරුවෙන් වුවද මම සිනාසුනෙමි. එක් වූ දා පටන් දෛවය අපට නිදහසේ සිනාසෙන්නට දුන්නේම නැත. ලොව අන් සියල්ලන්ටම වඩා ආදරය උතුම් යැයි කියයි. එවන් වූ උතුම් ආදරය මේ තරම් දෝරේ ගලා තිබියදීත් අපට මේ තරම් කරදර ඇති වන්නේ ඇයි...

මා එනතුරු රවීත් දිස්නාත් ඇඩ් සත්කාර ඒකකයේ දොරකඩ රැඳී උන්නෝය. ඔවුන් දෙදෙනාම මා දෙස බලා උන්නේ දුක්බර ලෙසිනි.

"දැන් ආයෙත් දවල්ට එන්නෙපා... එකපාර හවස එන්න... ටෙස්ට් එක ඉවර වෙද්දී හවස හතරවත් වෙයි..."

මවුන්ට් එලිසබෙත් රෝහලෙන් පිටව අප මහ පාරට ආවේ කතා බහකින් තොරවය.

"පොඩි ප්‍රශ්නයක් තියෙනවා මචං..."

රවී බැරෑරුම් ලෙස කීවේය.

"ප්‍ර..ශ්..න..ය..ක්..."

"ඔව්..."

"නංගිගේ ට්‍රීට්මන්ට් දිගටම කරගෙන යන්න නම්



අද හවස් වෙන්න කලින් සිංගප්පූර් ඩොලර් එක්දාස් එකසීයක් ගෙනත් බඳින්න ඕන... ට්‍රීට්මන්ට් පටන් ගන්නේ එතකොට... එහෙම නොකළොත් ට්‍රීට්මන්ට් නවත්තයි..."

මගේ හිස කරකැවෙන්නට විය.

"ඒක ලොකු ගාණක්නේ..."

මම දුබල ලෙස කීවෙමි. ඩොලර් එක්දහස් දෙසීයක් යනු ශ්‍රී ලංකාවේ මුදලින් රුපියල් අසූ දාහකට ආසන්න ගණනකි.

"ඔව්... ඒත් ට්‍රීට්මන්ට් පටන් ගන්න විතරයි... දිගටම ට්‍රීට් කරගෙන යද්දී තවත් ගෙවන්න වෙයි..."

The Reader's Place Novel.

"මං... මං දැ..න් මො..ක..ද කරන්නේ ර..වී..."

ඒ ප්‍රශ්නය මම රවීගෙන් විමසා පලක් නැත. ජීවිතයේ ප්‍රශ්න වලට මුහුණ දිය යුත්තේ මාය.

"ඒක තමයි මාත් කල්පනා කළේ... කොහොම හරි කොල්ලන්ගෙන් එකතු කරලා මේ ගාණ ගෙව්වා කියමු... ඒත් ඊට පස්සේ... නංගිට හැදිලා තියෙන්නේ හාට් කේස් එකක්නේ මචං... ඒවල ට්‍රීට්මන්ට් වලට බර යනවා... ලංකාවෙත් උඹ දන්නව ඇතිනේ බයි පාස් වලට එහෙම ලක්ෂ දහය පහළොව යන්නේ..."

මම පාර අයිනේ තිබූ ටැක්ස් ස්ටෑන්ඩ් එකක වාඩි වී හිසේ දෑස් ගසාගෙන කල්පනා කළෙමි. කිසිවක් හිතට ගලා එන්නේ නැත. හිසම ගිනි ජාලාවකි. ඒ ගිනි ජාලාව මැදින් මට සිහිවන්නේ සමාධිගේ මුහුණය.

"නිර්වාන්..."

රවී මගේ පිටට අතක් තබා මෘදුව කතා කළේය.

මගේ දෑස් තිබුණේ කඳුළින් පෙඟීය.

"මෙතනදී උඹ අසරණයි කියලා මං දන්නවා..."

"මට හැම දේකටම වඩා මගේ කෙල්ලගේ ජීවිතේ වටිනවා රවී..."

"මං දන්නවා... උඹ අපි වගේ සැහැල්ලු කොල්ලෙක් නෙමේ... කොල්ලෝ ඔක්කොම කියන්නේ පෙරුම් පිරුවත් උඹවගේ කොල්ලෙක් වෙන්න බෑ කියලා... අපිත් ලව් කරනව නම් තමයි... ඒත් උඹ වගේ ලස්සනට බැහැලා ලව් කරන්න අපිට බෑ... මේ සල්ලි ටික හොයලා දෙන්න මාත් උත්සාහ කරන්නම්... උඹත් ට්‍රයි එකක් දීපන්... මං දැන් එයාර් පෝට් යන්න ඕන... උඹ කොහෙද යන්නේ..."

මට යන්නට තැනක් නැත.

"හර්බි අයියට කියනවද මට දවස් දෙක තුනක් නිවාඩු දෙන්න කියලා..."

"මං කියන්නම්... උඹ රස්තියාදු ගහන්නෙපා... පුළුවන් නම් කාමරේට පලයන්... මං හවස උඹව හොස්පිට්ල් එක්කං යන්නම්... උදේ එස් කියු ෆ්ලයිට් එක දැන් එනවා... මං එයාර් පෝට් ඉන්න ඕන... උඹව මං ගෙදරින් දාන්නද..."

"එපා උඹ එයාර් පෝට් පලයන්... මං ටැක්සි එකක් අරන් යන්නම්..."

රවී මොහොතක් මා දෙස බලා හිඳ ගියේය. මම ටැක්සි ස්ටෑන්ඩ් එකට වී බලාගත් අත බලා උන්නෙමි. පැයක් දෙකක් නොව ඊටත් වඩා කාලයක් මා බලා ඉන්නට ඇත.



සියල්ලටම කළින් සමාධිගේ අසනීපයට බෙහෙත් කරන්නට මුදල් සොයා ගත යුතුය. රස්සාවක් දී ඉන්නට නවාතැනක්ද දුන් පළියට සිංගප්පූරුවේ මිතුරන්ට මීට වඩා කරදර කළ නොහැක.

ඔවුන්ද ජීවත්වන්නේ අමාරුවෙනි. සිංගප්පූරුවේ වියදම් වැඩිය. තේ එකක් පවා ඩොලරයකි.

රෝහලට මුදල් නොබැන්දොත් ඔවුන් සමාධිට කරන සත්කාර සියල්ල නවත්වනු ඇත. මට සිදුවන්නේ මේ තරම් අමාරු තත්වයේ ජීවත්වන සමාධිව රෝහලින් එක්කාගෙන එන්නටය.

The Reader's Place
Novel..

හදවතේ ඇතිවන රෝග තත්වයන් සාමාන්‍ය නැත. එය මාරාන්තිකය. සාමාන්‍ය රෝගයකට වඩා හදවතට සත්කාර කළ යුත්තේ අති විශේෂයෙනි. ඒ නිසාම හදවත සම්බන්ධයෙන් සිදු කරන ප්‍රතිකාරවල මිලද අධිකය.

පැය ගණනාවක් මම කල්පනා කළෙමි. අවසානයට මම අනාථයෙකු මෙන් ටැක්සියක නැඟී සෙරන්ගුන් මාවතේ පිහිටි අපේ නවාතැනට ආවෙමි.

අප උන් කාමරයට පිවිසෙද්දීම මට ඇඬුම් එන්නට විය. එහෙත් දැන් දුක් සංකා පපුවට ගෙන හඬා වැටිය යුතු මොහොතක් නොවේ. මේ තීරණාත්මක මොහොතේ වඩාත්ම සිහියෙන් සිටිය යුත්තේ මාය.

සැහෙන වෙලාවක් කල්පනා කිරීමෙන් අනතුරුව මම මධූට ඇමතුමක් ගත්තෙමි. ඇගේ හොඳම මිතුරිය සිංගප්පූරුවේ රෝහලක පපුවේ අමාරුවෙන් දුක් විඳින බව කියූ කල ඇය කොතරම් කම්පාවට පත්වෙනු ඇත්ද. එහෙත් වෙන කරන්නට කිසිදු දෙයක් නැත. ජාත්‍යන්තර

ඇමතුම් ජාලය ඔස්සේ මට මධූගේ අංකය සම්බන්ධ කර ගන්නට මොහොතක් ගත විය.

"ම..ධූ... මම නිර්වාන්... සිංගප්පූරුවේ ඉඳලා..."

"නි..ර්..වා..න්... අම්මේ මේ දැන් ඔය දෙන්නව මං මතක් කළා විතරයි..."

මධූ කීවේ සතුටින් කෑ ගසමිනි. ඇගේ සතුට මගේ දුක බවට හැරෙන්නට වැඩිවෙලා ගියේ නැත.

"ඇයි අපිව මතක් උනේ..."

"සිංගප්පූරුවේ ෂොපින් ප්‍රොග්‍රෑම් එකක් දැන් ටී.වී. එකේ ගියේ... නිකමට වගේ මාත් සෙනඟ අස්සේ ඔය දෙන්නා ඉන්නවද කියලා බැලුවා... නිර්වාන්..."

The Reader's Place
Novel..

මධූ හිටිවනම කතාව නතර කර කතා කළාය.

"ඇ..යි..."

"ඔය දෙන්නා හොඳින් නේද..."

මට කතා කරගන්නට බැරි විය.

"නිර්වාන්... ඇ..යි කතා කරන් නැත්තේ... කතා කරන්නකෝ... කෝ කෙල්ල..."

මගේ උගුර සිර විය.

"එයා මේ වෙලාවේ මං ගාව නෑ ම..ධූ..."

මට ඇඬුනේ මමවත් නොසිතූ ලෙසිනි. දුක වඩාත්ම තදින් පපුවට දැනෙන්නේ ඒ දුක ආදරණීය කෙනෙකුට කියද්දීය.

"නෑ... කෝ කෙල්ල... කියන්නකෝ නිර්වාන්..."

මධූ ඇසුවේ කලබලයෙනි.



"අපිට පො..ඩි ක..ර..දරයක් වෙලා ම..ධූ..."

"ක..ර..ද..රයක්..."

"ඔ..ව්..."

"සමාධිගේ තාත්තා හරි..."

"නෑ මධූ..."

"එහෙනම් කියන්නකෝ මොකක්ද කරදරේ... මගේ පපුවත් පිච්චෙනවනේ..."

"බබා මේ වෙලාවේ ඉන්නේ සිංගප්පූ හොස්පිට්ල් එකක..."

"හො..ස්..පි..ට්..ල් එකක... ඇයි ඒ කෙල්ලට බ..බෙ..ක්..."

"එ..හෙ..ම උනානම් කොච්චර හොඳද මධූ... ඒත්..."

"එහෙනම් මොකක්ද අමාරුව..."

මම සියල්ල මධූට කීවෙමි. සොයුරියකට තම දුක කියන්නාක් මෙන් මම හඬමින්ම මගේ දුක ඇයට කීවෙමි.

"දෙ..යි..ය..නේ... එ..හෙ..ම අමාරුවක් මේ කෙ..ල්ල..ට හැ..දුනේ කොහොමද... අ..නේ..."

මධූ ඇසුවේ හඬමිනි.

"ඒක තමයි මටත් තේරුම් ගන්න බැරි මධූ..."

"අනේ දෙයියනේ දැන් ඔයා තනියම කොහොමද මේ ඔක්කොම කරන්නේ... ඔයාට කව්රුවත් ඔහේ නැනේ..."

"ඒක තමයි මං.. තනිවෙලා මධූ.. ම..ම..."

කතා කරගන්නට බැරුව මට ඉකි බිඳුණි...

"අ..නේ නිර්වාන්... මේ අහන්න අඩන්නෙපා... අපි මොනවා හරි කරමු... මට තේරුම් ගන්න පුළුවන් ඔයා අසරණ වෙලා ඉන්න හැටි..."

"අද හවස රිපෝර්ට් එනවා... එයාල බලල කියයි බබාට තියෙන ලෙඩේ... ඒත් ඊට පස්සෙ..."

"ඇයි..."

"හොස්පිට්ල් එකට ගෙවන්න ඕන... පේමන්ට් බැන්දෙ නැත්නම් එයාල ට්‍රීට්මන්ට් පටන් ගන්නෙ නෑ..."

"දෙ..යි..ය..නේ ඔයාගේ රස්සාව පටන් ගත්ත ගමන්නේ නේද... අනේ සල්ලි නෑ නේද..."

"තිබ්බ ඔක්කොම හොස්පිට්ල් එකට බැන්දා... මෙහේ යාළුවෙකුත් උදව් කළා... ඒත් ට්‍රීට්මන්ට් වලට ඊට වඩා සල්ලි යනවා... බබා හොස්පිට්ල් එකේ ඉදිද්දී මං රස්සාව කරන්නේ කෝමද..."

මම සොයුරියකට දුක කියන්නාක් මෙන් සියල්ල කීවෙමි.

"මං දන්නවා මෙහෙම ඔයාලට කියන එක හරි නෑ... අපිට ටිකට් දෙකත් අරන් දීලා ඔක්කොම කළේ ඔය දෙන්නා... ඒත් මං තනිවෙලා මධූ..."

"මට තේරෙනවා නිර්වාන්... පොඩ්ඩක් හිත ශක්තිමත් කරගෙන ඉන්න... බයවෙන්නෙපා කෙල්ලට මොනවත් වෙන්නෑ..."

"එයාට මොනවා හරි උනොත් මං ජීවත් වෙන්නෙත් නෑ කොහොමත්..."

"මොනාද මේ කියන්නේ... ඕවද කියවන්නේ



ප්‍රශ්නයක් ආපු වෙලාවට... සුභාෂ් ගෙදර නැනේ නිර්වාන්... මං දැන් කතා කරලා කියන්නම්... ඇන්ටි මේක දන්නවද..."

"මං කටක් ඇරලා කොහොමද මධූ ඒ අම්මට කියන්නේ මේක... අම්මා ප්‍රෙෂර් ලෙඩෙක්... කොහොම දරාගන්නද... මට ඉන්නේ ඔයා විතරයි කියන්න..."

"මට තේරෙනවා... ඔයා මට කතා කරපු එක හොඳයි... මං සුභාෂ් එක්ක කතා කරන්නම්... නිර්වාන් පහට විතර ආයෙත් කෝල් එකක් ගන්නවද..."

"හා..."

"මෙහෙම කළොත් ඔයාලට සල්ලි ටිකක් හදිස්සියි කියලා අම්මගෙන් සල්ලි ටිකක් ඉල්ලුවොත්... එතකොට මට පුළුවන් ඒක සිංගප්පූරු වලට ඩ්‍රාෆ් කරන්න..."

සමාධිගේ ජීවිතය වෙනුවෙන් කළ යුතු වෙන දෙයක් නැත.

"අපිටත් සල්ලි ටිකක් දෙන්න පුළුවන්..."

"අනේ ඔයාලත් ජීවත් වෙන්නේ අමාරුවෙන් මං දන්නවා..."

"හරි නිර්වාන්... ඒත් ඔයාගේ අවශ්‍යතාවය ඔක්කොටම වඩා වැඩියි... සමාධි මගේ යාළුවෙක් නෙමේ... නංගී කෙනෙක්..."

"මං හවසට ඔයාට කතා කරන්නම්..."

මධූට කතා කළ පසු හිතට තරමක සහනයක් දැනුණද හදවතේ ගින්දර නම් අඩු වූයේ නැත.

සමාධිවත් රැගෙන මේ රටට ආවේ අපරාදේ යැයි මට දැන් සිතෙයි. අපට තිබුනේ ලංකාවේ කොහේ හෝ

ගොස් පුංචි කාමරයක හෝ ජීවත් වන්නටය. කොහේ උන්නද මේ කරදර ආ පසු මා කුමක් කරන්නද...

දෛවය අපේ ජීවිත වලින් පළිගන්නට හැකි උපරිමයෙන් පළි ගත්තා යැයි මට සිතුණි. මාව අසරණ කළ හැකි දරුණුම මට්ටමින් දෛවය මාව අසරණ කළේය.

සමාධිව ලංකාවට රැගෙන ගියහොත් ඇතිවන තත්වය මම හිතන්නට ගත්තෙමි. සියල්ලට පෙර ඇයව ගුවන් තොටුපළේ සිටම රෝහලට රැගෙන යා යුතුය. වඩාත්ම වටින්නේ ඇගේ ජීවිතයයි. එහෙත් ඊළඟ දවසෙම ජයසූරිය මහතාත් සුදේශුත් සමාධිව සොයාගනු ඇත. ඔවුන් ඊට පසු කුරිරු ලෙස මගෙන් ඇයව වෙන් කරනු ඇත.

දැන් මට ඇත්තේ විසඳුම් දෙකක් පමණි. ඉක්මනින්ම මා ඒ විසඳුම් දෙකෙන් එකක් තෝරා ගත යුතුය. එක්කෝ සමාධිව මෙසේ දිගටම සිංගප්පූරුවේ තබාගෙන ඇගේ ජීවිතය මා අනතුරේ දැමිය යුතුය. සමාධිගේ රෝගයේ හැටියට ජීවිතය අවදානම්ය. නොහිතා ඉන්නට හැදුවද ඇගේ ජීවිතයට අනතුරක් විය හැකි බව මගේ යටි හිත කියයි. ඒ විසඳුමෙන් වෙන්නේ සමාධි ටික කලක් මා සන්තකව උන්නද සදාකාලිකවම ඇය මට අහිමි වී යාමය.

අනෙක් විසඳුම වන්නේ සමාධිව ලංකාවට ගෙන යාමය. එසේ කළහොත් අඩුම තරමේ ඇයව හොඳ රෝහලකට ඇතුළත් කර ප්‍රතිකාර කළ හැක. එහෙත් මට ඇගෙන් වෙන් වීමට සිදුවෙයි. සමහර විට මට සමාධිව බලන්නට පවා නොලැබෙයි. ඒ දුක මට දරාගත නොහැකි

The Reader's Place Novel..



වුවද ඇගේ ජීවිතය ඊට වඩා මට වටී. සමාධි එක හිත ඇති යුවතියකි. දුෂ්කරම අවස්ථා වල පවා ආදරය රැක ගන්නා අන්දම සමාධි ඇගේ අතීතය තුළ මට ඔප්පු කර පෙන්වූවාය.

කළ යුතු හොඳම දේ සමාධිවත් රැගෙන ලංකාවට යාමයි. සමහර විට සමාධි ඊට කැමති නොවෙනු ඇත. එහෙත් ඇගේ ජීවිතය වෙනුවෙන් ඒ පියවර ගත යුතුය.

සමාධිගේ රෝග තත්වය සාමාන්‍ය එකක් වේවායි මම පැතුවෙමි. එහෙත් සියල්ල අද සවස වෛද්‍ය වාර්තා වලින් හෙළි වනු ඇත.

මා වෙනුවෙන්ම ඇප වූ කැප වූ සමාධිගේ ජීවිතය සමඟ සෙල්ලම් කරන්නට මට සදාචාරාත්මක යුතුකමක් නැත. ඇගේ ජීවිතයේ ආරක්ෂාව වෙනුවෙන් අමිහිරි වේදනාබර වෙන් වීමකට පවා මම සූදානම් විය යුතුය.

එසේ වෙන්වූ ලොව එකම ආදරවන්තයා මා නොවේ.

එහෙත් ඉන් පසු මා ජීවත් වෙන්නේ කෙසේද... මගේ ආත්මයේ සියොළඟම දැවටුණු ඒ සුන්දර ප්‍රේමය අහිමි කරගෙන මා ජීවත් වන්නේ කෙසේද... ප්‍රශ්නය එයයි.

හතර වනතෙක් මට ඉවසා ඉන්නට සිදුවිය. එය ජීවිතයේ අමිහිරිම හෝරා කිහිපයක් විය. මම පිස්සෙකු සේ අප ජීවත් වූ කුඩා කාමරය පුරා ඇවිද්දෙමි. මට සියල්ල සිහිවන්නට විය. ගෙවුණේ කෙටි කාලයක් බව සැබෑය. එහෙත් මේ කෙටි කාලය තුළ අපට සංසාරයේ දුක් සුවඳක් දැනුණි. ආදරයක් වෙනුවෙන් ජීවත් වීම

කොතරම් මිහිරි දෙයක්දැයි මට ඉගැන්වූයේ සමාධිය. අද දෛවය මට දමා යන්නට කියා කියන්නේද ඒ මිහිරය.

මිනිස්සු සිය දිවි නිසා ගන්නේ ඇයි දැයි හරියටම මට තේරෙන්නේ දැන්ය. දෛවය ජීවත් වන්නට එක හුස්ම පොදක්වත් නොදෙන කල මේ ජීවිතය ජීවිත් කරනවාට වඩා එය කෙළවර කර දැමීම හොඳ යැයි ඔවුන් හිතනවා විය යුතුය.

එහෙත් මා සමාධිව දමා යන්නේ කෙසේද... ඇය ජීවත් වන්නේ සම්පූර්ණයෙන්ම මගේ ජීවිතයෙන් ජීවත් වන්නට යමක් ඉල්ලාගෙනය.

රවී තුනට පමණ මාව රෝහලට එක්කාගෙන යන්නට පැමිණියේය. මම සමාධිව ලංකාවට රැගෙන යාම හොඳ නැද්දැයි රවීගෙන් යන අතරේ ඇසුවෙමි. ඔහු සෑහෙන වෙලාවක් කල්පනා කළේය.

"උඹ කරලා තියෙන ප්‍රශ්නේ හැටියට ගිය ගමන් උඹවයි නංගිවයි මාට්ටු වෙනවා නේද..."

"ඇත්ත මචං... ඒත්... මේකේ තියාගෙන හිටියොත් කෙල්ලගේ ජීවිතේ..."

"උඹ ගොඩාක් හොඳ එකෙක්... ඒකයි උඹ ඔහොම හිතන්නේ... උඹට කෙල්ලව නැති උනත් කමක් නෑ උඹට ඕන කෙල්ලගේ ජීවිතේ බේරගන්න නේද..."

"අම්මා මට සමාධිව බාර දුන්නේ පරිස්සමින් බලාගන්න පුතේ කියලා රවී... මං කොහොමද එහෙම බාර දුන්න කෙල්ලව මෙහෙම දුක් විඳින්න අරින්නේ... මැරෙන්න දෙන්නේ..."

"ටෙස්ට් ඉවර ඇති... හවස මොනා හරි කියයිනේ..."



"මාත් බලන් ඉන්නේ ඒකම තමා... සමහර වෙලාවට එයා යන්න බෑ කියයි... ඒත් මං මොනා කරන්නද..."

"ලංකාවට ගියාට පස්සේ හංගගෙන ට්‍රීට්මන්ට් කරන්න බැනේ... නේද..."

"ලංකාව හරි පොඩි රටක් නේ මචං..."

"ඔව්... ඒත් උඹලා බැඳලා නිසා උඹට චාන්ස් එකකුත් තියෙයි... එහෙම උඹලව වෙන් කරන්න බෑ... නීතියෙන්ම තමයි වෙන් කරන්න ඕනේ..."

"ඒකට සමාධි කවදාවත් කැමති වෙන්නෑ..."

මට මේ ලෝකයේ විශ්වාස කළ හැකි එකම දේ ඇගේ ආදරයයි. එය ඉරහඳ පවතින තුරාවට වෙනස් නොවෙනා දෙයකි.

"එහෙම උනොත් මං කෙල්ලවත් අරන් ලංකාවට යනවා රවී... මට උදව් කරපන් අන්තිම වතාවට..."

"උඹ හිතන්නෙපා අපි බලමු..."

රවී රෝහල් වාහන අංගනයේ වාහනය නවතා මා දෙස බැලුවේ අනුකම්පාවෙනි.

"යන්... ෆිට් එකේ හිටපන්... මොනවා කරන්නත් උඹ කෙළින් ඉන්න ඕන..."

එහෙත් මගේ පපුව වේගයෙන් ගැහෙන්නට විය. මේ ලෝකයේ මට වඩාත්ම ආදරය කරන ජීවිතය සම්බන්ධයෙන් තීරණාත්මක යමක් අද මට අසන්නට ලැබෙයි.

අප කොතරම් ශක්තිමත් කීවද අපේ හදවත් දුර්වලය.

රවී ලංකාවේ යුවතියව සම්බන්ධ කර ගත්තේය. අප

ඇය එනතුරු බලා උන්නෙමු. සමාධි උන්නේ අයි.සී.යූ යුනිට් එකේ නිසා ඇයව බලන්නට හැක්කේ ටික වෙලාවකට පමණි.

"ටෙස්ට් වලින් මොකද කියන්නේ..."

ඇය ආ පසු මම කලබලයෙන් ඇසුවෙමි.

"කලබල වෙන්නෙපා... එයාගේ පපුවේ නහරයක් පුංචි වෙලා... වැල් ප්‍රොබ්ලම් එකකුත් තියෙනවා... ඇත්තම කිව්වොත් අයියේ ටිකක් බරපතලයි..."

මාව කරකැවෙන්නට විය. මා දන්නා පරිදි මේ ලෝකයේ ඇති සුන්දරම හදවත ඇත්තේ මගේ බිරිඳටය. අද ලෙඩවී අප්‍රාණිකව යන්නට හදන්නේද ඇගේ හදවතයි.

"අයියා කලබල වෙලානේ... මාස හයක් විතර ට්‍රීට්මන්ට් කරන්න වෙනවා... ඔ..ප..රේ..ෂන් දෙකකුත් තියෙනවා මං හිතන්නේ..."

දෙවියනි ඇගේ පපුව කපා කොටන්නට ඔබ හිතුවේ කවර නම් පාපයකටද... ඇයට ඇත්තේ මොන තරම් අහිංසක හදවතක්ද...

"දැන් තවත් ටෙස්ට් එකක ඉන්නේ... ඒක ඉවර වෙනකල් අයියට එයාව බලන්න බෑ... මොකද කරන්නේ කියලා හිතන්න... කරන දෙයක් ඉක්මනට... මං යන්නම් අයියේ..."

යන්නට හදද්දී මම ඇගේ අතින්ම අල්ලා ඇයව නවත්වා ගත්තෙමි.

"එයා ඉන්නේ අමාරුවෙන්ද..."

"ටි..ක..ක්... ඒත් දැන්මම ට්‍රීට්මන්ට් පටන් ගත්තොත්



නංගිගේ ජීවිතේ බේරගන්න පුළුවන්... ඒත් හාට් ඔපරේෂන් එකකට ඩොලර් පන්දාහකට වඩා මෙහේ යනවා..."

ඩොලර් පන්දාහක් යනු රුපියල් ලක්ෂ අටකටත් වඩා වැඩි මුදලකි. දෙවියනි ඒ තරම් මුදලක් මා කොහෙන් හොයන්නද... කාගෙන් ඉල්ලා ගන්නද...

"මට එයාව බලන්න පුළුවන් කීයටද..."

"හෙට උදේ... මේ ටෙස්ට් ඉවර වෙද්දී රෑ වෙයි..."

එක අතකට මේ මොහොතේ සමාධිව බලන්නට නොලැබෙන එක හොඳය. ඇයව දකිද්දී මට ඇඬෙනා බව මම දනිමි. මා පවා ජීවත් වන ඇගේ හදවත මේ තරම් දරුණු ලෙස ගිලන් වී ඇති බව දැනගත් පසු කෙල්ල වේදනාවෙන් හඬනු ඇත.

රවී මගේ කරට අතක් දමාගෙන මාව රෝහල් පරිශ්‍රයෙන් පිටතට රැගෙන ගියේය. මා උන්නේ මළ කඳක් සේය.

"උඹ කෙල්ලව ලංකාවට අරන් යන එක තමා හොඳම දේ..."

රවී ස්ථිර හඬින් කීවේය.

මට මගේ කඳුළු වලට පවුරු බඳින්නට පුළුවන් කමක් තිබුනේ නැත. ඒවා රවී ඉදිරිපිට අමු අමුවේම ගලා යන්නට විය. දෛවය මිනිසුන්ට අනන්ත වද දෙන බව මම අසා ඇත්තෙමි. එහෙත් ඒ දෛවය මාව මේ තරම් අසරණ කරාවි යැයි මම නොදැන උන්නෙමි.

ජීවිතයේ අන්ත දුෂ්කර අවස්ථා වලදීත් මම මගේ ආදරය විශ්වාස කළෙමි. අඩුම ගණනේ දුප්පත් අප

The Reader's Place
Novel..

දෙදෙනාව අපේ ආදරයෙන් වත් ආරක්ෂා වේ යැයි මම සිතුවෙමි. අද අප දෙදෙනා මෙන්ම අපේ ආදරයද අනාථය. අසරණය.

"උඹට ඉක්මනට තීරණයක් ගන්න වෙනවා නිර්වාන්... එහෙම නොවුනොත් උඹ මෙච්චර ආදරේ කරපු කෙල්ලගේ ජීවිතේ අනතුරේ වැටෙන්න පුළුවන්..."

"එහෙම වෙන්න දෙන්න බෑ රවී... මං මගේ පණ දීලා හරි මගේ කෙල්ලගේ ජීවිතේ බේරගන්නවා..."

"අපි එහෙම හිතුවට මචං අපේ පණ කාටවත් දෙන්න බෑනේ... පුතෙක් මැරෙන්න යද්දී අම්මා කෙනෙක්ටත් අම්මගේ පණ දෙන්න බෑ..."

රවී කියන්නේ ඇත්තය. එහෙත් මා කුමක් කරන්නද...

"උඹට බෑ කෙල්ලව සිංගප්පූරුවේ තියාගෙන බේරගන්න... ලංකාවට වඩා සිංගප්පූරුවේ හොස්පිට්ල් වල පහසුකම් වැඩියි... ඇත්ත... ඒත් වියදම... ඒක කොහොමද උඹ දරාගන්නේ..."

"අ..නේ මේ කෙල්ලට කොහොම මේ පපුවේ අමාරුව ආවද..."

"මෙච්චර තරුණ කෙල්ලෙක්ට එහෙම පපුවේ ලෙඩක් ආව කියන එකත් පුදුමයි... ඒත් මොනා කරන්නද... දැන් ඕවා හිතලා වැඩක් නෑ... පිරිමියෙක් වගේ හිතල උඹ තීරණයක් ගනිං..."

සිංගප්පූරුවේ ඕර්චාඩ් මාවත පුරා විවිධ වර්ණයන්ගෙන් යුතු විදුලි බුබුළු දැල්විණ. ඒත් සමගම රාත්‍රිය උදාවිය.

The Reader's Place
Novel..



මේ රැය පහන් වන්නට ප්‍රථම මම තීරණයක් ගත යුතුය. තත්පරයෙන් තත්පරය සමාධි ජීවිතයෙන් ඈත්වී මරණයට ළං වෙයි. මාත් සමඟ සිංගප්පූරුවට එද්දී ඇය උන්නේ ජීවිතයට ඇඩිව ආදරය කරමිනි. එවැනි තෘෂ්ණාවකින් ජීවත්වන්නට පටන් ගත් යුවතියට මෙසේ මැරෙන්නට දෙන්නේ කෙසේද...

සමහර විට මට මගේ බිරිඳව මින් පසු සදහටම නැතිවිය හැක. මට මේ ලෝකයේ ඇති එකම සන්තකය මට අහිමි වී යා හැක. එහෙත් ඒ අවාසනාවන්ත අමිහිරි නොලැබීමට බියෙන් මට මගේ බිරිඳට නන්නාඳුනනා රටක නන්නාඳුනනා රෝහලක අනාථ දරුවෙකු සේ මැරෙන්නට දිය නොහැක.

"මම කෙල්ලව ලංකාවට අරන් යනවා රවී..."

මම දත්මිටි කාගෙන කීවෙමි. මට ඇයව අහිමි වන බව දැන දැනත් මම ඒ තීරණය ගත්තෙමි.

"ඔව් මචං... හොඳම දේ ඒක... උඹට මොනවද කරලා ඕනේ... උඹත් එක්ක ලංකාවට යන්න මං එන්නද... කොහොමත් මං මල්ලිගේ වෙඩින් එකට මේ සුමානේ ලංකාවට යන්න හිටියේ..."

"උඹ මාත් එක්ක එනව නම් ලොකු හයියක්..."

"එනවා... උඹලා දෙන්නගේ ටිකට් දෙක..."

"ලංකාවේ යාළුවෙක් ඉන්නවා බබාගේ... මට සල්ලි ටිකක් ගෙන්න ගන්න පුළුවන් වෙයි..."

"මාත් පුළුවන් උදව්වත් කරන්නම්... හර්බි අයියත් උදව් කරයි... අපි මෙහෙ ඩොක්ටර් එක්ක හෙට කතා කරලා කෙල්ලව ඩිස්චාර්ජ් කරගෙන ඉක්මනට අරගෙන

යමු... උඹ දැන් මොකද කරන්නේ..."

රවී මගේ කරට අතක් දමා ඇසුවේය.

"මට කෙල්ලගේ මූණ නොබලා යන්න බෑ... මූණ බලන්නත් බෑ..."

"උඹ වැටිලා කියලා පෙන්නන්නත් එපා... කෙල්ලට වැටෙන්න දෙන්නත් එපා... හාට් පේෂන්ට් කෙනෙක්නේ බං... පොඩ්ඩ ගැස්සුන ගමන් ඉවරයි..."

"මං දුක දරාගෙන ඉන්නේ රවී... මේ පාරවල් දිගේ අඬ අඬා දුවන්න තරම් මට දුකයි..."

"එහෙනම් උඹ ඉඳලා කෙල්ලව බලපන්... මං වාහනේ තියෙන බඩු ටික දාලා එන්නම්... උඹ මොනවා හරි කාපන්..."

මම හිස වැනුවෙමි.

"රවී..."

යන්නට ගිය රවීව මං මොහොතකට නවත්වා ගත්තෙමි.

"කියපන් මචං..."

"ලංකාවට යන ටිකට් දෙක කීයක් වෙයිද..."

"ඩොලර් දාහක් එක්දාස් දෙසීයක් විතර වෙනවා... මාත් කීයක් හරි දෙන්නම්..."

රවී ගිය පසු මම රෝහලේ ඉදිරිපිට වූ ටැක්සි ස්ටෑන්ඩ් එක අසළට වී සැහෙන වෙලා කල්පනා කළෙමි. මගේ ජීවිතයේ හමුවන සමහර විට මගේ සංසාරයේම හමුවන නපුරුම වියෝගයට මා පැමිණ ඇතැයි මට සිතුණි.

The Reader's Place
Novel..



ඒ වියෝගයට මුහුණ දෙන්නට මා පපුව හදා ගත්තේ සමාධිගේ ජීවිතය ගැන සිතාය. ඇය මේ ලෝකයේ කෙසේ හෝ ජීවත් වේ නම් මට සැනසීමෙන් මැරෙන්නට වත් හැක.

රාත්‍රී හතට පමණ මම මධූට කතා කළෙමි. ඔවුන්ට කියන්නට ඇති පුවත ඉතාමත් දුක්බරය.

"ම..ධූ මම..."

"ඇයි කතා කරන්න පරක්කු උනේ... අපි බලන් හිටියා... අ..නේ කෙල්ලට කොහොමද නිර්වාන්..."

මධූ අසද්දී මට කතා කරගන්නට පවා බැරිවිය.

"නිර්වාන්..."

"බ..බා..ට..."

මට ඇඬෙන්නට ගියේය. පපුවේ දුක වැඩි වන්නේ ඒ දුක හිතවතෙකුට කියද්දීය.

"ඇයි... කෙල්ලට මොකද... අනේ කියන්නකෝ..."

"මගේ කෙල්ල මැරෙන්න යන්නේ මධූ... එයාට..."

මම හැඬුම් මැදම මධූට සියල්ල කීවෙමි. සමාධිගේ තත්වය අසා මධූද හැඬුවාය.

"අ..නේ සුරංගනාවියක් වගේ හිටපු කෙල්ලට එහෙම උනේ කොහොමද..."

"ඒ..කනේ මටත් හිතාගන්න බෑ... මට ඒ මූණ දිහාවත් බලන්න බෑ... හරි දුකයි..."

මම දෑතින්ම මගේ කඳුළු පිසදා ගත්තෙමි.

"ම..ම දැ..න් මො..ක..ද කරන්නේ මධූ..."

අනාථ වූ දරුවෙකු මෙන් මම මධූගෙන් ඇසුවෙමි.

"ඔයා කඩා වැටෙන්නෙපා නිර්වාන් අයියේ... කෙල්ලගේ ජීවිතේ තියෙන්නේ ඔයාගේ අතේ... ඒකිගේ පණ ඔයා ඉන්නකල් යන්නෑ... ඒත් අපි කෙල්ලව බේරගන්න ඕන... හැම දේටම වඩා ඒ ජීවිතේ වටිනවනේ..."

"ඔ..ව් මට බබාව නැති උනත් මට දරාගන්න පුළුවන්... ඒත් බබාට මැරෙන්න දෙන්න බෑ..."

මම හඬමින් කීවෙමි.

"පිස්සු කොල්ලෙක්නේ... ඒකිව ඔයාට නැති වෙනවද... ඒ ඔයාගේ වයිෆ්නේ..."

"සමාධිව මෙහේ තියාගෙන ට්‍රීට් කරන්න බෑ මධූ... එයාව ලංකාවට ගේන්න වෙනවා..."

"ඉන්නකෝ මං සුභාෂ්ට දෙන්නම්..."

මධූ සුභාෂ්ට දුරකතනය දුන්නාය.

"මචං... මට තේරෙනවා උඹ ඉන්න තත්වේ... බයවෙන්නෙපා... හැම දෙයක්ම හරියයි... ලයිෆ් එකේ ඔහොම ප්‍රශ්න එනවා... භාරත පොරව වගේ හිටපන්... දැන් මොකක්ද උඹ කරන්න යන්නේ..."

සුභාෂ් කතා කරද්දී හිතට නව පණක් ආවේය. හිතකට ශක්තියක් එන්නේ පිරිමි කට හඬක් ඇසුණු පසුය.

"ඔහොම අහද්දිත් හිතට ශක්තියක් එනවා මචං... කෙල්ලව අරන් ලංකාවට එන්න ඕන..."

"ඔව්... අපි මචං වැල්වටාරම් කතා කරලා වැඩක් නෑ... උඹ කවදද කියපන් කෙල්ලව ඩිස් චාර්ජ් කරන්නේ..."



"හෙට හරි අනිද්දා හරි..."

"හරි... මට කියපන් උඹට ටිකට් ගන්න සල්ලි තියෙනවද..."

මම නිහඬ උනෙමි. දෙවියන් ප්‍රශ්න මවද්දී මවන්නේ පොකුරු පිටිනි.

"හරි මට තේරෙනවා... උඹ ගිහින් කී කාලෙද... මං උඹට හෙට ඩ්‍රාෆ් එකකින් සල්ලි ටිකක් එවන්නම්... මට එකවුන්ට් නම්බර් එකත් හෙට උදේන්ම කතා කරලා කියපන්... උඹ කෙල්ලවත් අරන් තියෙන ළඟම ෆ්ලයිට් එකෙන් ලංකාවට ලෑන්ඩ් කරපන්... උඹල දෙන්නව කටුනායකට බැස්සුවෙත් අපි... එදාට ගන්නෙත් අපි... අපි එහෙමම කෙල්ලව ඩොක්ටර් කෙනෙක් ගාවට එක්කං ගිහින් පෙන්නලා ඇඩ්මිට් කරමු... ඒවා ඇවිත් කතා කරමු... හැම දෙයක්ම කරන්න උඹ ෆිට් එකේ ඉන්න ඕන... මේක හිතපන් කොල්ලෝ... ප්‍රශ්න කියන ඒවා විසඳෙනවා... ඒක ෂුවර්... විසඳෙන්නේ නැති ප්‍රශ්න නෑ... හරි..."

"තෑන්කියු මචං... උඹට පින්..."

"කෙල්ලට වැඩිය හිතන්න දෙන්නෙපා... කෙල්ලෝ අපි වගේ නෙමෙනේ බන්... අපි වාටර් කාපු කොල්ලෝ... මුන් මේ මල් වගේ හැදිච්ච ළපටි කෙල්ලෝ... අපි ෆිට් එකේ ඉන්න ඕන... උදේන්ම මට කතා කරපන්... අපි උඹලව බලාගන්නවා..."

සුභාෂ් සහෝදරයෙකු සේ මගේ හිත හැදුවේය. ඔහු කියූවාක් සේම සෑම ප්‍රශ්නයක්ම විසඳේ යැයි මමද සිතුවෙමි.

"නිර්වාන් අයියේ..."

The Reader's Place
Novel..

සුභාෂ් මධූට යළිත් දුරකතනය දුන්නේය.

"කෙල්ලගේ අම්මට මේක කියනවද..."

"මටත් හිතාගන්න බෑ... කිව්ව ගමන් අම්මා කලබල වෙයි..."

"ඒක තමයි..."

"මං කියන්නද... අපි ඔයාලා ලංකාවට එනකල් නොකියා ඉමු..."

"ලංකාවට එනවා කියලා කියන්න ඕන නැද්ද..."

"මං ඒක බලාගන්නම්කෝ... ඔයාට කතා කළොත් ඔයා සාමාන්‍ය විදිහට කතා කරන්න... අම්මා කෙනෙක්නේ අයියේ... නේද..."

"ඔව්... එයාට දරාගන්න බැරිවෙයි..."

"හරි... සුභාෂ් කිව්ව විදිහට කරමු... ඔයා හෙට උදේ කතා කරන්න... මං උදෙන්ම යනවා පන්සලට කෙල්ලට බාරයක් වෙන්න... බයවෙන්නෙපා... හැම දෙයක්ම හරියයි..."

මධූ වැනි මිතුරියක් ලබන්නට සමාධි පින් කරන්නට ඇත. සෑම මිතුරියක්ම ඇය වගේ නොවේ.

මට සමාධිව බලන්නට ලැබුනේ රාත්‍රී අටට පමණය. ඇයව බලන්නට යන්නට කළින් මම රෝහලේ බාත් රූම් එකකට ගොස් මුහුණ සෝදා ගත්තෙමි. පැය දෙකක් පමණ එක දිගට ඇඬූ සළකුණු මගේ මුහුණේ විය.

සමාධි රෝහල් ඇඳ මත වැටී උන්නේ මළකඳක් සේය. සුදු බිත්තිය දෙසට හැරුණු ඇගේ දෑස් දැන් දැන් පියවෙන්නට ආසන්න දෙනෙතක් බඳුය. මාත් සමඟ

The Reader's Place
Novel..



සිංගප්පූරුවට ආ යුවතියව මට සිහිවිය.

"බ..බා..."

මම හැකි තරම් ප්‍රසන්න මුහුණක් ගෙන ඇයට කතා කළෙමි. පපුවේ මහා ගිනි කන්දක් ඇවිලෙන බව සැබෑය. එහෙත් ඒ ගිනි කන්ද බරපතල හෘද රෝගියෙකු වූ ඇය ඉදිරිපිට විවර කළ නොහැක.

සමාධි බිත්තිය දෙසින් දෙනෙත් ගත්තේ ගැස්සී මෙනි. සුදුමැලි වී ගිය ඇගේ මුහුණත් තද රත් පැහැයට හැරුණු ඇගේ දෙනෙතත් මගේ ළය තුළ විශාල බියක් ඇති කළේය.

"ම..හ..ත්..ත..යෝ..."

බලාපොරොත්තු වූවාක් මෙන්ම මදටිය ඇට තරම් කඳුළු කැට දෙකක් ඇගේ දෙනෙත් දෙකෙළවරින් කඩා වැටුණි. මම ඇඳට බරවී ඒ මුහුණ පිරිමැද්දෙමි. පිරුණු ඇගේ කම්මුල් දවසට දෙකට වල ගැසී ඇත.

"ටෙස්ට් එක ඉවරයිනේ බබා..."

"අ..නේ... ම..ට මො..නා..ද මේ උනේ... මහත්තයට වත් කිව්වේ නැද්ද..."

"බබා ටිකක් දුර්වලයි... බෙහෙත් වැටෙනකොට හරියයි..."

දෙනෙත් වලට එහායින් වේගයෙන් කඳුළක් කඩාගෙන එන බව දැනුණ මම වහා නැගිට සමාධිගේ ඇඳ අද්දර වූ ෆයිල් කවරය ගෙන එය බලමින් දෙනෙත් පිසදා ගත්තෙමි.

"සුදූ... ඔ..යා අඬනව නේද..."

මේ මගේ බිරිඳය... සංසාර පාද පරිචාරිකාවය. ඇගෙන් යමක් වසන් කිරීම අමාරුය.

"ම..ට දුකයි බබා ඔයා මෙහෙම ඉන්නකොට..."

මම අසරණව කීවෙමි. එහෙත් මට ඇඬෙන්නේ ඇගේ රෝගයේ බරපතල කම සිහිවීය.

"බය..වෙ..න්..නෙ..පා මං සුදූව දාලා ය..න්..නෑ..නේ..."

ජීවිතයේ අතිශය දුෂ්කරම මොහොතේදීත් ඇය කියන්නේ මේ කතාවය.

"දාලා යන්න මං දෙන්නෙත් නැනේ බබා..."

"රිපෝට්ස් බලලා මොනවද මහත්තයට කිව්වේ..."

"තාම කිව්වේ නෑ..."

"ම..ට තේරෙනවා මට ලොකු ලෙඩක් හැදිලා ඇති..."

"එහෙම නෑ සුදූ..."

සමාධි මගේ අත ගෙන ඇගේ සීතල ළමැද මත තබාගෙන පිරිමැද්දාය. වෙනදා උණුසුමින් පිරී පිපී ඇති ඒ ළැම පොහොට්ටු අද මැරී ගිය හංස පැටවුන් දෙදෙනෙක් මෙනි. මාව හිරිවැටී ගියේ ඒ යටින් වූ හෘද වස්තුවට අද ඇති වී ඇති දුර්භාග්‍ය ඉරණම සිහිවීය.

"ම..ට හරි තිබහයි සුදූ..."

එක දිගට කළ පරීක්ෂණ නිසා සමාධි උන්නේ පැය විසි හතරක් නිරාහාරවය.

"මං බබාට නෙස්කැෆේ එකක් අරන් ආවා... රෑට බලලා කන්න අරන් එන්නම්..."



කුඩා ප්ලාස්ටික් කෝප්පයට නෙස්කැෆේ දමා මම සමාධිට පෙව්වෙමි. ඇය නෙස්කැෆේ එක බීවේ ආශාවෙනි.

"තා..ව එකක් බොමුද..."

"හා..."

මගේ පපුව පත්තු විය.

"මම ලෙඩ උනේ නැත්නම් නේද... එහෙනම් අපි අද රෑට උයාගෙන හොඳට කාලා බීලා ඉන්නවනේ නේද... ම..ට හරි දුකයි..."

"ඉතින් බබා අපි සනීප උනාට පස්සේ එහෙම ඉමු..."

මේ මොහොතේ මගේ පපුව අසාමාන්‍ය ලෙස දැවෙයි. හෙට හෝ අනිද්දා හෝ මේ සතියේ කවර හෝ දිනයක මට සමාධිවත් රැගෙන ලංකාවට යන්නට සිදුවෙයි. එදායින් පසු... මම හිතන්නට පවා බිය වෙමි.

"ඇයි මහත්තයෝ... ඔයා බයවෙලා වගේ..."

"නෑ බබා... මට පාළුයි... ඒකයි..."

"මහත්තයට ප්‍රශ්න ගොඩයි... මං දන්නෑ කියලද හිතන්නේ... හොස්පිට්ල් බිල් ගෙවන්න ඕන නේද..."

"ඒවා ගැන හිතන්නෙපා..."

සමාධි මගේ දෑතම අල්ලාගෙන අසරණව ඇඬුවාය. ඒ මොහොතේදී චීනි ජාතික හෙදියක් සමාධිගේ ඇඳ අද්දරට පැමිණ ෆයිල් කවරයක්ද අත තබාගෙන මොන මොනාවාද කියවාගෙන ගියාය. මට නම් කිසිවක් තේරුම් ගන්නට හැකියාවක් තිබුණේ නැත. ඒ ඉංග්‍රීසි අමුතුය.

"ඕ..කේ මයි හස්බන්ඩ් විල් මීට් ඩොක්ටර් වුමෝරෝ

The Reader's Place Novel.

මෝනින්..."

සමාධි ඇයට කීවාය.

"මොනවද මැණික එයා කියන්නේ..."

හෙදිය ගිය පසු මම සමාධිගෙන් ඇසුවෙමි.

"ඉස්සරහට කරන ට්‍රීට්මන්ට් ගැනයි හොස්පිටල් පේමන්ට් ගැනයි හෙට කතා කරගන්න ඕනෙලු... අ..නේ මන්දා... මහත්තයා පව්..."

"මං... කො..හො..ම හරි කරන්නම්... බබා හිතන්නෙපා..."

"මං ඔයා ගැන නොහිතා වෙන කා ගැන හිතන්නද..."

"හෙට අපි කතා කරලා බලමුකෝ..."

"මහත්තයා හිතන් ඉන්නේ මොනවා කරන්නද..."

ලංකාවට යන්නට හිතාගෙන සිටින බව මේ මොහොතේ මම සමාධිට කියන්නට නොගියෙමි.

"මං බලලා බබාට කියන්නම්..."

"අම්මට කතා කරලා සල්ලි ටිකක් ගෙන්න ගමුද... අම්මා කොහොම හරි එවයි... නැත්නම් අම්මා එයි..."

"ගින්ද්‍රක් නේද රත්තරන්..."

"වෙන දේකට කියලා ඉල්ලමු... ඇනෙක්ස් එකක් ගන්න කියලා..."

මම අසරණව රෝහල පුරා නෙත් ඇරියෙමි. එක් වරක් එසේ කළ හැක. එහෙත් සමාධිට ඇති රෝග තත්වය අනුව දිගටම බෙහෙත් කළ යුතුය. එයට ලක්ෂ ගාණක්



වැය වේ.

"එහෙම කරන්න බෑ බබා..."

"මහත්තයා මොනවා හරි දන්නවා... මට දරාගන්න පුළුවන් පැටියෝ කියන්න..."

"මං හෙට බබාට ඩොක්ටර් එක්ක කතා කරලා කියන්නම්..."

"ඩොක්ටර් හම්බවෙන්න තනියම යන්නෙපා... කාත් එක්ක හරි යන්න... මුන් කියන වචන තේරුම් ගන්න බෑ... ෂක බක ගානවා මාත් අමාරුවෙන් තේරුම් ගන්නේ..."

මා තව තවත් සමාධි ළඟ සිටීමෙන් ඇය ප්‍රශ්න වල පැටලෙනවා වැඩිය.

"බබා කන්නේ කොහොමද..."

"බඩගිනියි මහත්තයෝ... මට හරියට මතක් වෙනවා අපි දෙන්නා හදන පරිප්පු හොද්ද..."

සමාධි කීවේ කෙළ ගිලිමිනි.

"මේ බටන් එක ඔබන්න... එතකොට නර්ස් එයි... මං අහන්නම්..."

මම විදුලි බොත්තම එබුවෙමි. හෙදිය අප වෙත ආවාය. සමාධි ඉංග්‍රීසියෙන් ඇයගේ කෑම ගැන ඇසුවාය.

"යූ කාන්ට් ඊට් අවුට් සයිඩ් මීල්... ඕ..කේ.. ලීව් හිම් නම්..."

"ඕ..කේ..."

ඇය කීවේ පිටතින් ගෙනෙන ආහාර කන්නට නොහැකි බවය.

The Reader's Place Novel.

"මෙහෙන් මොනා හරි දෙයි... මහත්තයා රෑට කන්න ඕන... මට කියන්න දවල්ට කෑවද..."

මම සිනාසුනෙමි.

"බබා බඩගින්නේ ඉද්දදී මම කන්නේ කොහොමද..."

"හරි... මං රෑට කනවා... මහත්තයත් කනව නේද..."

"හා... බඩ පිරෙන්න කන්න... මට දැන් යන්න කිව්වනේ..."

"ම්... අනේ ඔයා පව්... තනියම කොහොමද ඉන්නේ..."

ලෙඩ ඇඳක සිටියදීත් ඇය සිතන්නේ මා ගැනය.

"මං රෑට ශ්‍රී ලංකාරාමයට යනවා..."

"අපි හිටියා වගේ අපිට ඉන්න දෙන්න කියන්න සුදූ..."

"ඔව්..."

මම යන්නට ප්‍රථම පහත් වී ඒ සුදුමැලි වූ නළලත සිපගත්තෙමි.

"මට ඔයා විතරයි සුදූ ඉන්නේ..."

සමාධි මගේ මුහුණ පිරිමැද මිමිණුවාය.

"මටත් කව්රුත් නෑනේ..."

"මං දන්නවා..."

ඇගේ ඇස්වල කඳුළු විය. මම රෝහල් පරිශ්‍රයෙන් පිටතට ආවේ රාත්‍රී එකොළහට පමණය.

දවස් දෙකකින් කුසට යමක් වැටී නොතිබුණෙන් මට කලන්තයක් මෙන් ආවේය. මම රෝහල අසළ වූ



සුපිරි වෙළඳ සැළ ඉදිරිපිට වූ මැක්ඩොනල්ඩ් අවන්හලෙන් අයිස් කෝපි එකක් රැගෙන වහා ඉන් පිටතට ආවෙමි. සමාධිත් මමත් මැක්ඩොනල්ඩ් අවන්හලකට ගොස් කන්නට සිතාගෙන උන්නෙමු.

"මං ආසම ස්ට්‍රෝබෙරි කෑලි හැපෙන අයිස් ක්‍රීම් එකට..."

ඇය කීවේ කෙළ ගිලිමිනි. එහෙත් මට මගේ බිරිඳට එවන් සැප දෙන්නට බැරි විය. සමහර විට මේ ජීවිත කාලයේදීම මට ඇයට එවැනි සැපක් දෙන්නට නොහැකි වනු ඇත. ජීවිතය මට සළකන්නේ එහෙමය.

හිස් බඩට අයිස් කෝපි එකෙන් බාගයක් පමණක් බිගෙන මම ඉතිරිය විසි කළෙමි. කොහොම කීවත් ඇය අද රෑටත් ඉන්නේ නිරාහාරවම බව මම දනිමි. සිංගප්පූරුවේ සම්ප්‍රදායික චීන හා තායිවාන් කෑම කෑම අමාරුය.

ඇයව රෝහලේ තබන්නේ හෙට පමණක් කියා සිතා මම හිත හදාගත්තෙමි.

දුක් වන්නට වත් මට වෙලාවක් තිබුණේ නැත. මගේ ජීවිතය අද බැඳී ඇත්තේ ජීවිතයත් මරණයත් අතර සටන් කරන සමාධිගේ ජීවිතය සමඟිනි. ලංකාවට යන්නට ගුවන් ටිකට් පත් දෙකක් සූදානම් කර ගත යුතුය. සමාධිව රෝහලෙන් ටිකට් කපා ගත යුතුය. ඊට කළින් රෝහල් ගාස්තු අඩු නොකර ගෙවිය යුතුය. ඇගේ රෝග වාර්තා සියල්ල ලබා ගත යුතුය. මේ සියල්ල කරන්නට කීයක් හෝ ලංකාවෙන් ගෙන්වා ගත යුතුය.

මගේ ඔළුව කැරකෙන්නට විය. සියල්ලට කළින්

The Reader's Place
Novel..

පන්සලට ගොස් බාරයක් ගැට ගැසිය යුතු යැයි මම සිතාගත්තෙමි.

ඒත් සමගම පාරේ ආ ටැක්සියකට මම අත දිගු කර නවත්වා ගත්තෙමි.

"සෙන් මයිකල් රෝඩ්..."

මගේ ඇඟ වෙව්ලන්නට විය. මම ගෙළටත් නළලටත් අත තබා බැලුවෙමි. වෙව්ලන්නේ උණ ගන්නටය.

ශ්‍රී ලංකාරාමය අසළින් බැස මා පන්සල තුළට ගියේ අමාරුවෙනි. ඇවිදගන්නටවත් බැරි ලෙස මාව වෙව්ලමින් තිබුණි. මම මලක් පහනක් හඳුන්කූරක් නොමැතිව පන්සල තුළට ගොස් වැඳගෙන උන්නෙමි. මා බලාපොරොත්තු නොවූ ලෙසටම ඇඬෙන්නට විය.

The Reader's Place Novel..

විහාර ගෙයි කිසිවෙකු නොවූයෙන් මම මගේ දුක තුනී වන තුරු හැඬුවෙමි. අවසානයේ කඳුළු පිරි දෑතින්ම කව්රු හෝ තබා ගිය රෝස මල් තුනක් උඩ දෑත තබා වැඳ පිටතට ආවෙමි.

* * * * * * * * *

සමාධිගේ අම්මා කතා කළේ මහ රෑය. මම ඇගේ හඬ ඇසෙත්ම දැඩිලෙස අසරණ උනෙමි.

"පු..තේ..."

"අ..ම්..මේ..."

මම අමාරුවෙන් හැඟීම් මැඩගෙන කතා කළෙමි.

"නිදිද පුතේ..."



"නෑ... ඔ..ව් අම්මේ..."

මගේ වචන පැටලෙන්නට විය. අම්මා කෙනෙකුට බොරුවක් කරද්දී එසේ වෙයි...

"පුතේ... මට ඇත්ත කියන්න පුතේ... ඔයාලට කරදරයක් නේද රත්තරන්..."

මාව තවත් වෙව්ලන්නට විය. මම කර කියා ගත හැකි දෙයක් නොමැතිව අසරණ උනෙමි.

"ඇ..යි අම්මේ එහෙම අහන්නේ..."

"අහන්නේ දෙයක් දන්න නිසා රත්තරන්... මං සාස්තරයක් ඇහුවා... ඒක සැක නිසා තවත් එකක් ඇහුවා... දෙයියෝ ඒ දෙකින්ම කියන්නේ මේ වෙලාවේ ඔය දෙන්නට ලොකු කරදරයක් කියලනේ මහත්තයෝ... අනේ මට නින්දක් නෑ... සැනසීමක් නෑ... මට ඇත්ත කියන්න පුතේ... මං අම්මනේ මහත්තයෝ... කරදරයක් නම් ඒකට මොනා හරි කරන්න ඕනනේ පැටියෝ... නේද..."

මම කතා කර ගත නොහැකිව මොහොතක් උන්නෙමි. අම්මාට දැන් බොරු කර පලක් නැත.

"කෝ පුතේ දුව... කෙල්ල නිදිද..."

මීට වඩා ඇයට බොරු කළ නොහැක...

"අ..ම්..මේ..."

මට හැඬුණි.

"ඇ..යි පුතේ... ඇයි මේ අඬන්නේ... කියන්නකෝ මහත්තයෝ..."

"සාස්..ත..රේ හ..රි අම්මේ... ඇ..ත්..ත..ටම අපට

ලොකු කර..දර..යක්..."

ඒ වචන මගෙන් පිටවිය.

"කරදරයක්... ඒකනේ රත්තරන් මට පෙන්නුම් කළේ... නින්ද යන්නෑ හීනෙන් ඔයාලව පේනවා..."

"බබා දැන් මං ගාව නෑ අම්මේ..."

"අ..නේ.. මගේ රත්තරන් කෙල්ලට මක් වුනාද..."

අම්මා ඇවිලී ගිය හඬින් ඇසුවාය.

"බබා හොස්පිට්ල් එකේ අ..ම්..මේ.. එ..යාට අමාරුයි..."

The Reader's Place
Novel..

මම සියල්ල අම්මාට විස්තර කළෙමි.

"අ..නේ දෙ..යි..ය..නේ... දුවගේ කේන්දරේ එහෙම තියෙනවා පු..තේ..."

"මොකක්ද අම්මේ..."

"දරුණු පපුවේ අමාරුවක් හැදෙනවා කියලා... අනේ... ම..ගේ කෙල්ල..."

"මං.. මං.. බබාව බලාගන්නවා අම්මේ... එයා..ට මොනවත් වෙන්න මං දෙන්නෑ..."

"අනේ ඔයා පව් පුතේ... තනියම... මොන තරම් දුකක්ද... දෙයියනේ ඇයි එහෙම මේ කෙල්ලටයි කොල්ලටයි කළේ..."

අම්මා හඬමින් ඇසුවාය.

"අඬන්නෙපා අම්මේ... මටත් ධෛර්ය දෙන්න... මං.. මං.. මේ රටේ තනිවෙලා ඉන්නේ..."

"අ..නේ හැමෝම එකතුවෙලා මේ කෙල්ලට දුක්



දුන්නනේ... පව්.. ඔයත් එක්ක සතුටින් හිටියා..."

"මතක් වෙනකොට ඉන්න බෑ අම්මේ..."

"කොයි හොස්පිට්ල් එකේද ඉන්නේ..."

"මෙසේ එලිසබෙත් හොස්පිට්ල් එකේ... ඒත් දිගටම බබාව මෙහේ තියන් ඉන්න බෑ..."

"ඇ..යි..."

"ට්‍රීට්මන්ට් වලට ලක්ෂ ගාණක් ඕන අම්මේ... මං ළඟ සල්ලි නෑ... මං බබාව අරන්..."

මට සළිත් ඇඬුණි.

"පුතා ලංකාවට එන්නද හිතන් ඉ..න්..නේ..."

"ම..ට බබාව නැති උනාට කමක් නෑ අම්මේ... එයා ජීවත් වෙන්න ඕන... අම්මා බබාව බලාගන්න... මොනවා කරන්නද..."

මම හඬමින්ම කීවෙමි.

"ඔයාට මගේ කෙල්ල නැති වෙන්නෑ පුතේ... අනේ ඒත් මේ කෙල්ලව බේරගන්න ඕනනේ... මා..ත් ජීවත් උනේ ඒකි නිසා පු..තේ... කෙල්ලට මොනා හරි උනොත් මගේ ජීවිතේටත් නිස්කලංක මරණයක් නෑ..."

"බබාට මොනවත් වෙන්නෑ අම්මේ..."

"පුතාට තනියම පුළුවන්ද කෙල්ලව අරන් ලංකාවට එන්න..."

"මට පුළුවන් අම්මේ... ඒ..ත්..."

"මං දන්නවා පුතේ... ඔයා ගාව සල්ලි නෑනේ..."

"මං ඊයේ මඩුලටත් කතා කළා... එයාලා සල්ලි ටිකක්

එවනවා කිව්වා... අම්මට කියන්න දුක හිතුණ අම්මේ... මං කොහොමද..."

"මට තේරෙනවා පුතේ... මට දුක ඔයා එහෙම කරපු එක ගැන... පව්... මං මධූ දුවට කතා කරලා එයා අතට සල්ලි ටිකක් දෙන්නම්... නැත්නම් මං ඒ දෙන්නගෙන් එක්කෙනෙකුව ඔහේට එවන්නද..."

"තේරුමක් නෑ අම්මේ... ආව ගමන් බබාව මෙහේ ඩොක්ටර්ස්ලට පෙන්නන්න ඕන... සර් එතකොට සේරම දැනගනී... කමක් නෑ..."

"මං හැම දෙයක්ම දැන් කියනවා පුතේ... තවත් ඉවසන්න බෑ... මගේ කෙල්ලටයි ඔයාටයි සැනසිල්ලේ ඉන්න දෙන්නැත්නම් මං දිවි නහ ගන්නවා කියලා මං කියනවා..."

අම්මාට මේ සියල්ල කියූ පසුව මට තරමක සැනසීමක් දැනුණි.

"මං දැන්මම කෙල්ලට බාරයක් වෙනවා... අපි ලංකාවට ඇවිත් කෙල්ලව සනීප කරගෙන ගිහින් බාරේ ඔප්පු කරමු..."

"මං අම්මට උදේ කතා කරන්නද..."

"එපා... මං පුතාට ගන්නම්... පුතා කෙල්ල ගාවට යන්නකෝ උදෙන්ම... අනේ කෙල්ල කෑවද දන්නෑ..."

"බඩගිනියි කිව්වා... පිටින් කෑම ගේන්න දෙන්නෑ අම්මේ..."

"අනේ නන්නාඳුනන මිනිස්සු මැද.. පව්..."

හෙට අනිද්දා හෝ සෙනසුරාදා සමාධිව ලංකාවට

The Reader's Place Novel..



ගෙන යන්නට සියල්ල සූදානම් කළ යුතුය.

මම පාන්දරින්ම ඇඳගත්තෙමි. රවී ආවේ පාන්දරය.

"මං කොල්ලෝ එයාර් පෝට් හිටියේ..."

"උඹට නිදිමතයි නේද..."

"එහෙම කියලා බෑ... උඹ දැන් මොකද කරන්නේ..."

"ලංකාවෙන් සල්ලි ටිකක් එවනවා කිව්වා... ඒක එකවුන්ට් එකකට ගෙන්න ගන්න ඕන... ඩ්‍රාෆ්ට් කරලා ඊට පස්සේ ලංකාවට ටිකට් දෙකක් ගන්න ඕන..."

"රයිට් නැගපන්... ඔක්කොම කරගෙන අන්තිමට කෙල්ලව ඩිස්චාර්ජ් කරගමු..."

තව දින දෙකකින් ලංකාවට යන බව සමාධි නොදනී. ඇයට පවසා මෙය සූදානම් කරන්නට තිබුණද ඇය සමහර විට ඊට අකමැති වෙනු ඇත. ඉන් වන්නේ ප්‍රශ්න වැවීමකි. සමාධි කැමති වුවද අකමැති වුවද අප ලංකාවට යා යුතුය.

"උඹලා ගිහින් ආයේ කවදාහරි සිංගප්පූරුවට එනවද..."

යන අතරවාරයේ රවී මගෙන් ඇසුවේය.

"ජීවිතේට මොනවා වෙයිද කියලා කියන්න බෑ මචං... හැම දෙයක්ම හීනයක් වගේ..."

මම කලබල සෙරන්ගුන් මාවත දෙස බලාගෙන හිස් හැඟීමෙන් කීවෙමි.

සියල්ල කරන්නට පෙර සමාධිව බැලිය යුතුය. ඇය මුළු රැයක්ම උන්නේ තනිවය. තමාට වෙන්නේ මොනවාද කියාවත් ඇය නොදනී. හවස සියල්ල පිළියෙල කළ පසු

ගුවන් ටිකට් පත් දෙකද ගත් පසු ලංකාවට යන බව ඇයට කිව යුතුය.

"මචං කෙල්ලව විනාඩියකට බලලා යන්ද..."

මම රවීට ආයාචනා කළෙමි. ඔහු ඕර්චාඩ් මාවත දෙසට වාහනය හැරවූවේය. මේ සිංගප්පූරු මාවත් නුහුරු බව සැබෑය. නුපුරුදු බව සැබෑය. එහෙත් මම මේ මාවත් වලට පවා ආදරය කරමි. මේ රට ජීවිතයේ ඉතාම දුෂ්කර මොහොතකදී අපව බාර ගත්තේය. අපට ඒ රටේ නිදහසේ සුන්දරව ජීවත් වෙන්නට බැරිවූයේ රටේ වරදකින් නොවේ. අපේ දෛවයේ වරදකිනි.

නරක කාලය ආ විට සියල්ල නපුරු වේ.

"අ..නේ සු..දූ..."

සමාධි මා දුටුවනම හඬාගෙන මගේ දෑත් බදාගත්තාය.

The Reader's Place Novel..

"මා..ව ආයේ මොකක්ද එකකට ඉන්ටෙන්සිව් දාන්න යනවා... ඇ..යි සු..දූ ම..ට මෙ..හෙම ව..ද දෙන්..නේ..."

ඇය හුස්ම ගත්තේ පවා අමාරුවෙනි. ඉක්මනින් ක්‍රියාත්මක විය යුතුය.

"බයවෙන්නෙපා මැණික... ට්‍රීට්මන්ට් ටික කරගමු... මං හවස රවී එක්ක ඩොක්ටර්ව හම්බවෙනවා..."

"ඇ..යි කරන දෙයක් හිතන දෙයක් මට කියන්නැත්තේ... මං... මං..."

ඇයට ඇඬුණි. මම ඒ සීතල දෑත් තරයේ අල්ලා ගත්තෙමි.

"මං කිව්වනේ හවසට මං හැම දෙයක්ම කියන්නම්...



බබා බය නැතුව ට්‍රීට්මන්ට් වලට යන්න..."

සමාධි මගේ දෑත් තදකර අල්ලාගෙන බලාගත්වනම බලා උන්නාය.

"මං... මං ඊයේ නරක හීනයක් දැක්කා..."

"ඔවා ගැන හිතලා තමයි අසනීප වැඩි වෙන්නේ..."

"හීනෙකින්වත් අපි වෙන්වෙනවා මට ඉවසගන්න බෑ මහත්තයෝ..."

"එහෙම වෙන්වෙනවද මැණික... උදේ කෑවද..."

ඇය නැතැයි කියන්නට මෙන් හිස වැනුවාය.

"ආ... මේ බත් එක කන්න... මං හොරෙන් අරන් ආවේ... මැක්ඩොනල්ඩ් එකෙන් ගත්තේ..."

"ඔයා පව්... කෑවද..."

"මං දැන් යන ගමන් කන්නම්... ඕක කාලා මගේ සුදු මැණික පරිස්සමින් බය නැතුව ඉන්ටෙන්සිව් එකට යන්න... අපට මොනවත් වෙන්නෑනේ... අපි දෙන්නම හොඳයිනේ සුදූ... ඒ නිසා අපට කරදරයක් වෙන්නෑ... මං රෑ පන්සලුත් ගියා... තේරුණාද..."

"දවල්ට මාව බලන්න එනව නේද..."

"ඉන්න දෙනව නම් ළඟටම වෙලා ඉන්නවා නේ මැණික... දැන් ඕක කන්න... නර්ස් දැක්කොත් කන්නෙපා කියයි..."

රෝහලින් පිටවෙද්දීත් මට මැවි මැවී පෙනෙන්නට වූයේ සමාධිගේ තෙත්වූ නුවන්ය.

මධූ කතා කළේ ගුවන් ටිකට් පත් වෙන් කර ගැනීමට යද්දීය.

"නිර්වාන් අයියේ... කෙල්ලට කොහොමද..."

මගේ උගුර සිරවිය.

"ආයෙත් උදේ ඉන්ටෙන්සිව් ගත්තා..."

"අ..නේ උදේ ඇන්ටියි මායි කෝවිලටත් ගියා... ඔයා ඇන්ටිට ඔක්කොම කියපු එක හොඳයි..."

"අම්මා කෙනෙක්ට බොරු කරන්න බෑ මධූ..."

"හරි... දැන් ඔයා ලංකාවට එනවා නේද..."

"ඔව්... මේ ටිකට් බුක් කරන්න යන ගමන්..."

"උදේ ඇන්ටි මට සල්ලි වගයක් දුන්නා... මං අතේත් සල්ලි ටිකක් තිබ්බා... කොහොමද එවන්නේ..."

"මං එකවුන්ට් නම්බර් එකක් දෙන්නම් මධූ... ඒකට ඩ්‍රොප් කරන්න... පැය බාගෙන් ගන්න පුළුවන්..."

"ඔයා බයවෙන්නෙපා... ඉක්මනට කෙල්ලව අරගෙන එන්නකෝ... එතකොට නිර්වාන් අයියේ අපි ඔක්කොම ඉන්නවනේ..."

මට සියල්ලම උන්නද වැඩක් නැත. ලංකාවට ගිය සැනින් මට මගේ ආදරය අහිමි වෙනු ඇත.

"මොනා උනත් මං ඉක්මනට එනවා... පුළුවන් ඉක්මනට කතා කරලා ෆ්ලයිට් එක එන වෙලාව කියන්නම්..."

කොළඹ යාම සඳහා තිබූ ළඟම ෆ්ලයිට් එක වූයේ හෙට උදෑසන දහයයි හතලිහට තිබූ ශ්‍රී ලන්කන් ගුවන් සේවයට අයත් ගුවන් යානයයි. රවීත් මමත් එහි ගුවන් ආසන තුනක් වෙන් කළෙමු. අපත් සමඟ ලංකාවට යන්නට රවීත් එන බව මට කීවේය. ඔහු අපේ තනියට

The Reader's Place Novel..



ඒම මට ශක්තියක් විය.

"දැන් හරි... බෑන්ක් එකට ගිහිල්ලා සල්ලි ටික අරගෙන ඉක්මනට කෙල්ලව අද රෑම ඩිස්චාර්ජ් කරන්න සෙට් කරමු... නැත්නම් වෙලා ගනී..."

අද... සිංගප්පූරුවේ අප ඉන්නා අවසාන දවසය. ගුවන් ටිකට් පත් කාර්යාලයේ සිට එද්දී මගේ දෑසේ කඳුළු පිපෙන්නට විය. ජීවිතයේ සුන්දරම කාලයක් ගෙවී ගිය පාරාදීසයෙන් හෙට අපට ඈත්වන්නට සිදුවේ.

අම්මා කතා කළේ එද්දීය.

"අම්මේ..."

"අනේ රත්තරන් කෙල්ලට කොහොමද..."

"තවම එහෙමමයි අම්මේ... මං හෙට උදේ ෆ්ලයිට් එකෙන් ලංකාවට බබාව අරන් එනවා... හවස හතරයි තිහට කටුනායකට එනවා..."

අම්මා හදිස්සියේ අඬන්නට වූවාය.

"ඇ..යි අම්මේ..."

"ම..ට සමාවෙන්න පු..තේ..."

"ඇ..යි අම්මේ... මායි අම්මගෙන් සමාව ඉල්ලන්න ඕන... ඔයාගේ දුවට මෙහෙම දුක් දෙනවට..."

මමද ඇඬුම්බරව කීවෙමි.

"දුවලගේ තාත්තට ම..ට සේරම කියන්න වුනා..."

මම දිග සුසුමක් හෙළුවෙමි. පියාගත් දෑස් වලින් කඳුළු පැන්නේය.

"ස..සර් මොනවද අම්මේ කියන්නේ..."

"එහෙනම් බබා ඔය කතා කියන්නෙපා... බබා ඔහොම කියනකොට මට දුකයි... මාත් අමාරුවෙන් හිත හදාගෙන ඉන්නේ... තේරුණාද..."

"ම..ට තේ..රෙ..න..වා මට සමාවෙන්න... ගෑණු එහෙමයි... ගෑණු එයා ගැන විතරක් හිතලා ඔහේ දුක කියෝනවා..."

"මං ඉන්නේ බබාගේ දුක අහන්න තමයි... ඒත් මේ වෙලාවේ මට ඊට වඩා ආත්ම ශක්තියක් ඕන..."

"ඔව් මට තේරෙනවා... මේවා ඔයා කොහොමද කළේ කියලත් මට පුදුමයි... වෙන මිනිහෙක් හිටියනම් මගේ බොඩි එක තමයි පෙට්ටියක දාගෙන ලංකාවට අරන් යන්නේ..."

"දැන් ඇති... අපි බෙහෙත් ටික බොමු..."

මම සමාධිව ඇඳ මත ඉන්දවා ඇයට නියමිතව තිබූ බෙහෙත් පෙති ටික තේරුවෙමි. වරකට පෙති දොළහක් පමණ ඇයට බොන්නට තිබෙයි.

"මං ජීවිතේ ආසම නැති දේ බෙහෙත් බොන එක..."

"ජීවිතේ ආස නැති ගොඩාක් දේවල් කරන්න වෙනවා... අපි ඒවා අඩු කර ගමු ඉස්සරහට..."

"මේ පෙත්ත එපා..."

සමාධි නොබී ඉන්නට හදන්නේ වෛද්‍යවරයා ඇයට නින්ද යාමට දුන් පෙත්තය. ඒ පෙත්ත කෙසේ හෝ ඇයට පෙවිය යුතුය. හදිස්සියේවත් ඇයට මහ රෑ යළි අසනීප වුවහොත් හෙට ගමනද යාමට නොහැකි වෙයි.

"එහෙම කියන්නෙපා... මේක බීලා බබා ටිකක්



සනීපෙට නිදා ගන්න... හෙට ගමනත් තියෙනවනේ... මං ළඟට වෙලා ඉන්නම්..."

"මං හිතුවේ රෑ වෙනකල් කතා කර කර ඉන්න..."

"අපිට කතා කරන්න තව කොච්චර දේවල් තියෙනවද බබා..."

එසේ කීවද මේ අපේ ජීවිතයේ එකට ගෙවෙන අවසාන රැය යැයි මට නිකමට සිතුණි.

"මං ළඟම ඉන්න... පල්ලෙහාට වත් යන්නෙපා..."

"නෑ බබා... මං ඇඳුම් ටිකත් පැක් කරන්න ඕනනේ..."

"අපේ බුදු සාදුගේ පිළිමේ මතක ඇතුව දාගන්න..."

සමාධි කීවේ කාමරයේ කොනක වූ සුදු බුද්ධ ප්‍රතිමාව පෙන්නාය. සිංගප්පූරුවට ආ දා සිට ඇය මේ බුදු පිළිමයට පහන් දැල්වූවාය.

බෙහෙත් බීමෙන් පසු සමාධි සුවදායි නින්දකට පිවිසියාය. ඇගේ පපුව උස් පහත් වන්නේ තරමක් වේගයෙනි. එහෙත් වැඩි හැල හොල්මනක් නැත.

සමාධිට නින්ද ගියද සෑහෙන වෙලාවක් යන තෙක් මම ඇය සමීපයටම වී ඇගේ හිස පිරිමදිමින් උන්නෙමි. ටික වෙලාවක් ඇය දෙස බලාගෙන සිටිද්දී මට ඇඬෙන්නට ආවේය. ඇයට ඇහැරේ යැයි බියෙන් මම සමාධිට නොදැනෙන්නට කුස්සියට ගොස් ඇඬුවෙමි.

මට ඇත්තටම වාවා ගත නොහැක. කොහොම හිතුවද මෙය අහිමිවීමකි. වියෝගයකි.

ලංකාවට ගිය පසු... සමාධි මගෙන් වෙන් කෙරුණු පසු මම ජීවත් වන්නේ කෙසේද... යළිත් අඳුරු අන්ධකාර

The Reader's Place Novel..

අගාධයක මා තනි වෙනවා නොවේද...

වාවාගැනීම හැර මට අන් මගක් නැත. මේ දුක දරාගැනීම හැර මට අන් මගක් නැත. දෙවියන් මැවූ මේ ජීවිතය ඇත්තටම පුදුමාකාරය. එය අහිමි වී යන්නේ එයට පිස්සුවෙන් ආදරය කරන්නාමය. ඒ ජීවිතයට කැප වෙන්නාටමය.

මම පැයක් පමණ ඇඬුවෙමි. අවසානයේ දෑස් දන්නට ගන්නා තුරු මම හැඬුවෙමි. කොතරම් ඇඬුවද දුක අඩු නොවන බව මම තේරුම් ගත්තෙමි.

යළි මා කාමරයට එද්දී සමාධිගේ මුහුණේ වූයේ තුනී අහිංසක හසරැල්ලකි. මේ මම මගේ ජීවිතයේ දුටු සුන්දරම සුබ දසුනය. මා ජීවිතය හදා ගත්තේ මේ සිනහව දෙස බලාගෙනය. හෙටින් පසු මට ඒ දසුනද අහිමි වේ.

The Reader's Place

මම සෙමෙන් සෙමෙන් ඇඳුම් පැක් කරන්නට ගත්තෙමි. වේලාසනින්ම ඇඳුම් පැක් කළ නිසා අලුතෙන් පැක් කරන්නට තිබුනේ එකකි. කොහොමත් මේ රැයේ මට නින්ද නොයන බව මම දැන උන්නෙමි. මේ ජීවිතයේ මා අත්දකින කටුකම රාත්‍රිය මෙය විය හැක.

Novel..

හඟුරන්කෙතදී ගෙවී ගිය ජීවිතයේ සුන්දරම රැයවල් මට සිහිවිය. එයාකාර චමත්කාරජනක රැයවල් යළිත් ජීවිතයේ උදානොවෙතැයි මට සිතුණි. ඒ මතකය පවා දැන් පරිස්සමින් පපුවේ තබාගත යුතුය. දුක් දැනෙනවිට... ඒ දුක ළය පලාගෙන එන විට සඳුන් අඳුන් කල්කයක් සේ ළය ගල්වාගන්නට ඇත්තේද ඒ මතකයම පමණි.

හෙට කටුනායකට ජයසූරිය මහතාත් එනු ඇත. සමහර විට සුදේශ්ද එනු ඇත. මධුට හෝ අම්මාට මට



මේ රැයේ කතා කරන්නට සිතුනද මම දිගටම දුරකතනය වසා දැමුවෙමි. තීරණයක් ගත් පසු තවත් කරදර අවශ්‍ය නැත. හෙට හවස හතරට කටුනායකින් බැස්ස පසු සියල්ල තීරණය වේ.

කටුනායක ගුවන් තොටුපළේදී මට අත්විඳින්නට වන පීඩාවන් වේදනාවන් ගැන මම අමතක කර දැමුවෙමි. සමහර විට ජයසූරිය මහතා මට බල්ලෙකුට සේ බණිනු ඇත. සුදේශ් මට ගසන්නට එනු ඇත.

සමාධි වෙනුවෙන් මේ සියල්ලට මුහුණ දෙන්න මම සිතාගත්තෙමි. සියල්ලගේම මැදට... අවසානයේ අපේ ආදරයේත් මැදට ඇගේ ජීවිතය හරස් විය. සියල්ල කැප කර ඇගේ ජීවිතය බේරා ගත යුතු යැයි මා තීරණය කළේ ඒ නිසාය.

දැන් පාන්දර දෙකට කිට්ටුය. ඇඳගෙන සිටිනා ඇඳුමුත් ඇඳගෙන යන ඇඳුමුත් ඇරෙන්නට අනිත් සියල්ලම මම පැක් කළෙමි. ඒ නිසා මට කරන්නට වැඩක් තිබුණේද නැත. මම සමාධිගේ ඉන අද්දරින් වාඩි වී ඇගේ මුහුණ දෙසම බලා උන්නෙමි.

අද මේ මුහුණ දෙස හැකිතාක් බලා සිටිය යුතුය. හෙට මා කොහේ නිදාගත්තද ඒ නිදාගනිද්දී මෙසේ මගේ යහනේ කෙළවරක ඇය නැත.

සමහර විට ජයසූරිය මහතා සමාධිව කොළඹ ජාතික රෝහලේ නොනවත්වා නවලෝක වැනි පෞද්ගලික රෝහලක නවත්වනු ඇත. එවිට ඇයව මට බලන්නට නොහැකි වනු ඇත.

පාන්දර තුනට පමණ මම සමාධිගේ ළඟින්ම ඇලවී

ඇයව තුරුල් කරගෙනම ටිකකට ඇහැ පියාගත්තෙමි. ඇගේ වතේ රස්නය දැනෙද්දී මට නින්ද ගියේ නැත.

මේ මට අද දැනෙන ආදරයේ අපරිමිත රස්නයම හෙට මට ගින්දරක් සේ දැනෙනු ඇත්ද... තනිකමේ පාළුවේ කටුක සීතල තුළ හෙට දින සිට මා ජීවත් වන්නේ කෙසේද...

* * * * * * * * *

මම සමාධිගේ අතකින් අල්ලාගෙනම අපේ කාමරය දෙස අවසාන වතාවටත් බැලුවෙමි. මේ කාමරයට ආ දෛවෝපගත පෙම් යුවළ අදින් පසු නැත. අප මේ රටට ආ දා සිට අපව රැක බලා ගත් මේ නිසංසල බිත්ති වලට පවා මම කෘතඥ වූයෙමි.

සිංගප්පූරුවේ කොල්ලන් ටික අපට සමුදුන්නේද එවැනිම දුකකිනි.

"නංගිට සනීප උනාම ආයෙත් වරෙන්..."

ඔවුන් කීවෝය. මම සිනාසුනෙමි. බලාපොරොත්තු පැතුම් ප්‍රාර්ථනා දැන් අවශ්‍ය නැත.

"මොනා කියන්නද කොහොම උඹලට පින් දෙන්නද කියලා තේරෙන්නෑ... උඹලට පින් අපිව බලාගත්තට... සහෝදරයෝ දෙන්නෙක්ට වගේ සැළකුවට..."

මගේ මෙන්ම සමාධිගේ දෑස් වලද කඳුළු විය.

"ඉඳලා හිටලා හරි කෝල් කරපන්... උඹවයි නංගිවයි අපට කවදාවත් අමතක වෙන්නෑ..."

The Reader's Place Novel..



"අපටත් එහෙමයි අයියේ..."

අපව එයාර් පෝට් එක්කාගෙන ගියේ රවීය.

"අ..යි..යේ යන්න කළින් විනාඩියකට පන්සල ළඟ නවත්තනවද..."

එසේ කීවේ සමාධිය.

"හරි නංගී..."

සමාධි මගේ අත තද කර අල්ලා ගත්තාය. උදේ ඇගේ පපුවේ හතිය වැඩි විය. මම බියවී හදිසි මොහොතකදී ගන්නට දුන් පෙත්ත ඇයට දුන්නෙමි. හතිය සාමාන්‍ය මට්ටමට පත් වූයේ එවිටය.

"එන්න සුදූ... අපි එකපාරක් වැඳලා යන්..."

සමාධි මගේ අතින් අල්ලාගෙනම ශ්‍රී ලංකාරාමයට ගියාය. විශාල බුද්ධ රූපය අසළදී ඇය මගේ අත අතහැර බිම දණ ඔබා වැන්දාය.

මට විශේෂයෙන් වැඳ පතන්නට දෙයක් නොවීය. පතනා සියල්ලමත් හිතනා සියල්ලමත් කියා මම දැන් සිය වාරයක් වැඳ ඇත්තෙමි. බාර වී ඇත්තෙමි. මට පිහිටක් වීම දෙවියන්ගේ බුදුන්ගේ වැඩකි.

"මං දන්නවා සුදූ හිතෙන දේ... ඔයා හරියට දුක් වින්ඳා... හ..රි..ය..ට දුක් වින්ඳා... එච්චර දුක් විඳලත් ඔයාට දෛවය හරිම නරක විදිහට සළකන්නේ... දැන් මහත්තයට තරහයි... නේද..."

"නෑ බබා..."

"නෑ සුදූ මම දන්නවා ඔයා ගැන... ඒත් ලංකාවට අපි යන්... මගේ හිත මට කියනවා... මොනාත් වෙන්නෑ...

"මො..නා..ත් වෙන්නෑ... මං මේ වැඳලා කිව්වෙත් අපි දෙන්නව ලංකාවේදී වෙන් කරන්නෙපා කියලා..."

සමාධි පතනා දේවල් මා පතනා දේවල් වලට වඩා හරියන්නේය. මම ඇගේ වචන විශ්වාස කළෙමි. නොවේනම් ඒ වචන ටික පපුවට දමාගෙන මම හිත හදාගත්තෙතමි.

අපත් සමඟ ලංකාවට යන්නට රවීද එක්විය. ඔහු අපත් සමඟ වීම මට විශාල ශක්තියක් විය.

"ෆ්ලයිට් එකට තව වෙලා තියෙනවා නිර්වාන්... මං මෙතන ඉන්නවා... උඹයි නංගියි ඩියුටි ෆ්‍රී ෂොප්ස් පැත්තේ ටිකක් ඇවිදලා වරෙන්..."

රවී අපට කීවේය. මටද තීරු බදු රහිත සාප්පු සංකීර්ණයට යන්නට අවශ්‍යතාවයක් විය.

"අපි එහෙනම් මේ පැත්තට ගිහින් එමු බබා..."

සිංගප්පූරුවේ ෂැංගි ගුවන් තොටුපලේ තීරු බදු රහිත සාප්පු සංකීර්ණය වෙත මම අතින් අල්ලාගෙනම සමාධිව එක්කාගෙන ගියෙමි. මීට මාස තුනකට පමණ පෙර මේ ෂැංගි ගුවන් තොටුපළට මුල්ම වරට පය තැබූ දවස මට සිහි විය. එදා හදවතේ තිබුණේ මේ අලුත් රටේදී කෙසේ හෝ ජීවිතය අලුතින් පටන් ගැනීමේ ආශාවය. අද ෂැංගි වලින් පිට වෙද්දී තිබෙන්නේ ඊට වඩා හාත්පසින්ම වෙනස් විරහ වේදනාවකි.

ජීවිතය මෙසේ වන්නට ඇත.

"ඇයි සුදූ හීල්ලුවේ..."

සමාධි මගේ අතින් එල්ලී ඇසුවාය. මම නැතැයි



කියන්නට මෙන් හිස වැනුවෙමි.

"මහත්තයා ඔය මොනා ගන්නද බලන්නේ... ආ..."

මම සාප්පු දෙස ඕනාකමින් බලමින් යද්දී සමාධි ඇසුවාය.

"ඉන්නකෝ බබා ටිකක්..."

එක් සාප්පුවක් දැක මම සමාධිගේ අතකින්ම අල්ලාගෙන ඇතුළට ගියෙමි. එය සුන්දර මුතු පළඳනා රැසක් තිබූ අලංකාර සාප්පුවකි. සියළු වියදම් ඇරි පසු ජීවිතේ ඩොලර් තුන්සීයක් පමණ ඉතිරි විය.

The Reader's Place

මම මුතු පළඳනා තේරුවෙමි. ඒවා ඉතා විශාල මිල ගණන් අධික ඒවාය.

"මේවා ගාණ වැඩියි මහත්තයෝ..."

"ඉන්නකෝ..."

Novel..

සුදු සහ ක්‍රීම් පැහැයේ ගල් ඇල්ලූ මුතු බ්‍රේස්ලට් එකක් දැක මම නතර උනෙමි. එහි මිල ලෙස සඳහන්ව තිබුණේ ඩොලර් එකයි පනහකි.

"කැන් යූ ෂෝ මී දිස් බ්‍රේස්ලට්..."

මම එය පෙන්වා එහි උන් චීන ජාතික යුවතියට කීවෙමි.

"යර්ස්... ඉට් ඊස් වෙරි නයිස් ටු හර්..."

ඇය එය ගෙන සමාධිට පෙන්වූවාය.

"ඇයි සුදූ මේ..."

සමාධි පුදුමයෙන් ඇසුවාය.

"අපි සිංගප්පූරුවට ආවා... වෙන අය මේ රටට ආවට

පස්සෙ මතක් වෙන්න බඩු ගොඩාක් අරන් යන්නේ... මාස තුනක් ඉඳලත් මට බබාට මොනාත් අරන් දෙන්න බැරිවුනා..."

සමාධිගේ ඇස් පිහාටු තෙමී ගියේය.

"ඔන්න ඉතින් අඬනවා..."

"ම..ට ඔයත් එක්ක හිටපු දවස් මතක් වෙන්න මේවා ඕ..න නෑ සු..ද්දූ... මට ජීවිතේ මතක එච්චරයි..."

"හරි මැණික... ඒත් මට ආසයි..."

මගේ හිතේ තිබුනේ ඊට වඩා දුකකි. සමහර විට මේ මම සමාධිට මගේ ජීවිතයේ අරන් දෙන අවසාන තිළිණය විය හැක.

"අපි දාලා බලමු..."

මම ඇගේ දකුණතේ ඒ මුතු පළඳනාව පැළැන්දුවෙමි. ඇත්තටම එය සමාධිගේ සුදු අතට සුන්දරය.

"ය..ර්..ස් වෙරි නයිස්..."

චීන ජාතික යුවතිය හිස වනා කීවාය.

"ගිව් මී දිස් වන්..."

සමාධි මගේ බාහුව පිරිමදිමින් තොල් පට තද කරගෙන උන්නාය.

"සු..ද්දූ..ට..ත් මොනා හරි ගමු... සල්ලි තියෙනවද..."

"මට ඕන් නෑ බබා..."

මම සමාධිගේ දෑසින් මගේ දෑස් හරවාගත්තේ ඒවා වලට වේගයෙන් කඳුළු පිරුණ නිසාය.

"ඔයා හිතනවද ඔයා නැතුව මට ජීවත් වෙන්න



පුළුවන් වෙයි කියලා... පිස්සු සුද්දූ... විකාර හිතන්නෙපා... මට මේ අරව මේවා අරන් දෙන්නේ ආයේ මට මොනාත් අරන් දෙන්නවත් මං සුද්දූ ළඟ ඉන්න එකක් නෑ කියලා හිතලද..."

මම කතා නොකළෙමි. අප එසේ නොහිතන බව සැබෑය. එහෙත් දෛවය අප හිතනා තරම් මෘදු නැත.

"මෙතන ටිකක් ඉඳගෙන ඉඳලා යන් සුද්දූ..."

සමාධි හදිස්සියේ කීවාය. මම ඇත්තටම බිය උනෙමි.

"ඇයි මැණික පපුව රිදෙනවද..."

"ටි..ක..ක් වගේ ආවා..."

මගේ සුරත වෙව්ලන්නට විය.

"අපි ටැබ්ලට් එකක් ගමු..."

මම වේලාසනින්ම කුඩා බෑගයක සමාධිගේ බෙහෙත් ටිකත් වතුර බෝතලයත් දමා ගත්තෙමි.

"ආ මේක බොන්න... බීලා එහෙමම ටිකක් මගේ කකුල් දෙකට ඔළුව තියන් ඉන්න... ෆ්ලයිට් එකට තව වෙලා තියෙනවා..."

සමාධි බෙහෙත් ටික බී ගුවන් තොටුපළේ තබා තිබූ දිග අසුනක දෙපා දමා මගේ දෙකකුල් මත හිස තබා ගත්තාය.

"දැන් මොනාත් හිතන්නෙපා..."

මම ඇගේ හිස පිරිමැද්දෙමි... සමාධි දෑස් පියාගෙන ටික වෙලාවක් උන්නාය. දෛවය මෙසේ අපව තැනින් තැනට ගෙන ගොස් මෙසේ අනාථ කර දමන්නේ ඇයි... එක හෙවණක නිවනක ජීවත් වන්නට අපට ඉඩ

The Reader's Place Novel..

නොදෙන්නේ ඇයි...

ශ්‍රී ලංකාව බලා යන සිංගප්පූරු ගුවන් සේවයේ එස් කියු යානය සඳහා බෝඩින් කරන බව ගුවන් තොටුපළ පුරා නිවේදනය කෙරිණි.

"සු..දූ බෝඩින් කරනවා... අපි හිමිහිට යන්..."

මම පරිස්සමින් සමාධිව එක්කාගෙන ගියෙමි. රවී ඉමිග්‍රේෂන් එක අසළ බලා උන්නේය.

"නංගිට අමාරුද නිර්වාන්..."

රවී ඇසුවේ බියෙනි.

"ටිකක්... මං බෙහෙත් දුන්නා මචං..."

"පරිස්සමින් එක්කං යන්..."

රවී විගමන නිලධාරීන්ට සමාධිගේ තත්වය පහදා ඇයව වේලාසනම බෝඩින් කිරීමට කටයුතු සැළැස්සුවේය.

සිංගප්පූරු ගුවන් සේවයට අයත් එස් කියු හාරසිය එක යානයට අප ගොඩවූයේ අප සිංගප්පූරුවට එද්දී ගුවන් යානයට ගොඩු වූ තරම් සතුටකින් නොවේ. ගුවන් යානයට ගොඩ වූ විටම සමාධි මා දෙස දවාලූ බැල්මක් හෙළුවාය.

"අපි වාඩිවෙමු මැණික..."

මම තොල් පට තද කරගෙන සමාධිවත් රැගෙන ගුවන් යානයේ අපට හිමි අසුන කරා ගියෙමි. රවී උන්නේ අපට ටිකක් පසුපසින් අසුනකය.

"හදිස්සියක් උනොත් මට පට ගාලා කතා කරපන්..."

"හරි මචං..."

The Reader's Place Novel..



එහෙත් එවැනි හදිස්සියක් මේ ගුවන් ගමන පුරා නොවේවායි මම පැතුවෙමි.

"මං හිතුවේ නෑ මෙච්චර ඉක්මනට ලංකාවට යන්න..."

සමාධි මගේ උරපත්තට බරවී කීවාය. ප්‍රථම ගුවන් ගමනේදී ඇය ආශාවෙන් උන්නාය. එහෙත් අද ඇය ඉන්නේ ඒ සියල්ල එපාවූ ගාණටය.

"අපි සනීප වෙලා පස්සේ දවසක එමු..."

"ම්..."

මා එවැනි බොරු බලාපොරොත්තු පවා ඇයට දෙන්නේ ඒ හිත කලබල වීම වළක්වන්නටය.

ගුවන් යානය කොළඹ කටුනායක බලා පිටත් වන්නට යන බව ප්‍රධාන කපිතාන් නිවේදනය කළේය. මම සමාධිගේ සීට් බෙල්ට් එක සකසා තද කළෙමි. ගුවන් යානය සෙමෙන් සෙමෙන් ගුවන් තොටුපළේ ධාවන පථය මත ඇදී ගියේය. මම සමාධි අසළ තිබූ කවුළුව විවර කර අවසන් වතාවට සිංගප්පූරු චැංගි ගුවන් තොටුපළත් සිංගප්පූරු නගරයත් දැක බලා ගත්තෙමි.

"ඔයාටත් යන්න හරි දුකයි... සුදූ මට ඒක පෙන්නනත්නෑ..."

සමාධි කියන්නේ ඇත්තය.

"රටක් දාලා යනවා මිසක මං බබාව දාලා යනවා නෙමේනේ..."

"එහෙම දාලා යන්නෙත් නැතේ නේද..."

ඒ ගැන තව කවර කතාද...

එකවරම ගුවන් යානය අහස්ගත කෙරිණ. සමාධි මගේ අත දැඩිව අල්ලා ගත්තාය. මොහොතකින් අපට මුළු සිංගප්පූරු නගරයම දර්ශනය විය.

සිංගප්පූරුව තනිකරම කොන්ක්‍රීට් පුරවරයක් බව සැබෑය. එහෙත් ඒ කොන්ක්‍රීට් පුරවරය මැද අපට මහා ළ කවරණය තිබුණි.

ශ්‍රී ලංකාවට යානය ගොඩ බස්සන වේලාව රූපවාහිනී තිරයේ දැක්විණ. එය ශ්‍රී ලංකාවේ වේලාවෙන් හතරයි හතලිස් තුනය.

මගේ ජීවිතයේ මා වඩාත්ම ආදරය කළ පුදුමාකාර ලෙස ආදරය කළ මගේ සම්පත මට ඒ මොහොතේම අහිමි වෙනු ඇත.

The Reader's Place Novel..

සමහර විට මට සමාධි සමඟ ඉන්නට ලැබෙන අවසාන කාලය මේ ගුවන් කාලය පමණක් වනු ඇත.

ගුවන් යානයට ගොඩ වූ මොහොතේම ලබාදෙන ඕඩිකලෝන් සුවඳැති ශීත තුවායක් ගුවන් සේවිකාවක් විසින් අපට ලබාදෙන ලදී. මම ඉන් සමාධිගේ මුහුණත් දෑතත් තෙත මාත්තු කළෙමි. එය ගුවන් යානයේදී ලබාදෙන්නේ රිෆ්‍රෙෂ් වීම සඳහාය... නැවුම් වීම සඳහාය.

"ජී..වි..තේ කො..ච්චර කල් ජීවත් වෙන්න ලැබෙයිද දන්නෑ... එ..ත..ක..ල් මං.. ළඟින්ම ඉන්න මහත්තයෝ..."

හදිස්සියේ මෙන් සමාධි මගේ දකුණු බාහුව බදාගෙන එහි කම්මුල් තද කරගෙන කීවාය.

"අපි ගොඩාක් කල් ජීවත් වෙනවා... මාත් මැරෙනකල් ඔයා ගාව ඉන්නවා... ඊට පස්සෙත් ඉන්නවා...



අවතාරයක් භූතයෙක් වෙලා හරි ඉන්නවා..."

"දැනුත් කොහොමත් එහෙම තමයි..."

සමාධි සිනාසී කීවාය. ඇය ලස්සනම මෙසේ සිනාසී ඉන්නා විටය.

"කොහොමද..."

"භූතයෙක් වගේ... මගේ රත්තරන් භූත පැටියා..."

"ආ මං භූතයෙක්..."

"අනේ නෑ... මං විහිළුවට කිව්වේ... රත්තරන් දෙවි පැටියා..."

සීතල දෙතොලින් මගේ උරහිස් සිපගනිමින් සමාධි කීවාය. ජීවිතයේ ප්‍රථම වසන්තය උදාවූයේ මේ දෙතොල් පහස හරහාය.

"මට හැම තිස්සෙම හඟුරන්කෙත අපි ආදරෙන් හිටපු දවස් මතක් වෙනවා.. ජේම්ස්ව රාජාව මතක් වෙනවා... අනේ දැන් මොනා කරනවද දන්නෑ... අපිව මතක් වෙනවද දන්නෑ නේද..."

"එහෙම අපි දෙන්නව අමතක වෙන්නෑ බබා..."

"ම්... එසේ මෙසේ පිස්සුවක් නෙමෙයිනේ නැටුවේ නේද..."

"ඒ කාලේ කරපු පිස්සු මට තාම මතක් වෙනවා..."

"මොනවද සුදූ ඒ පිස්සු..."

සමාධිගේ දෑස් සතුටින් බැබළිණ. ප්‍රේමය හැර යන මේ මොහොතේ මගේ තනියට ඉන්නේ ඒ සුන්දර අතීතය පමණි.

"හඟුරන්කෙතට ආපු වෙලාවේ ඉඳලා මහ ආඩම්බර කෙල්ලෙක් මට රවනවා රවනවා ඉවරයක් නෑ..."

"අ..නේ මං ආඩම්බර නෑ... ලස්සන කොල්ලෙක් හිටපු නිසා පොඩ්ඩක් ගෑස් පෙන්නුවා... ම්.. කාගේ කොල්ලෙක්ද කියලා මං දන්නෑනේ... මට ඊර්ෂ්‍යා හිතුණා... හරි ඉතින් ඊට පස්සේ..."

"ඔන්න ඊට පස්සේ එක්කෙනෙක් හඟුරන්කෙතට ඇඳුම් දාන් ආපු කිට්බෑග් එකේ ලොක් එක තද කරගෙන දැඟලුවා... පව් වැඩේ ගෑණිට අඳින්න ජංගියක් වත් ගන්න බෑ..."

"මං ජංගියක් ඇඳුන් හිටියේ..."

"ඒත් ඉතින් හඟුරන්කෙතට ආවම මාරු කරන්න ඕනනේ..."

"මහා වල් කොල්ලෙක් කෙල්ලෝ මාරු කරන එවා ගැන ඔයා මොනවටද හිතන්න ගියේ..."

සමාධි මගේ අතට ගසා කීවාය.

"මනුස්සකමට හිතුවේ... මං දැක්කනේ සීතලේ වෙව්ල වෙව්ල හිටපු හැටි..."

"පස්සේ..."

"පස්සේ මං ගිහින් බැලුවා... මාව ගණන් ගත්තෙවත් නෑ... මං ඇරලා දෙන්නද කියලා ඇහුවා... ඕන්නෑ මට පුළුවන් කිව්වා..."

"ඇත්තනේ මේ කොහේවත් යන කොල්ලෙක් මොකටද මගේ බෑග් ඇරලා දෙන්න එන්නේ... ආවා මාත් එක්ක යාළුවෙන්න..."



"ඒත් අන්තිමට ගෑණි පැරදුනා... පුළුවන් නම් අරින එකයි ඇත්තේ කියලා මට දුන්නා... පැරදුනා කියලා නෑ හරි ගෑස්... මෝඩ කෙල්ලෙක් කියලා හිතලා මං ඇරලා දුන්නා... පොඩි ගැජට් එකක් එහෙට මෙහෙට කරන්න විතරයි තිබ්බේ..."

සමාධි සිනාසුනාය.

"ඇත්තටම බෑග් එක ඇරලා ඉස්සෙල්ලාම මොනවද දන්නවද කළේ..."

"නෑ..."

The Reader's Place

"බාත්රූම් එකට දුවලා ගිහින් චූ දාලා ඇවිත් අලුත් ජංගියක් ඇන්දා..."

පිරිසිදුව ඉන්නා යුවතියන් එහෙමය.

Novel..

"ඊට පස්සේ..."

"ඔන්න ඊට පහුවෙනිදා හවස..."

"හවස මොනවද උනේ..."

"ගෙදෙට්ට බඩු ගන්න මායි රාජයි අර ආඩම්බර කෙල්ලයි නුවරඑළියේ ෆුඩ් සිටි එකට ගියා..."

"අපි පව් කියලා හිතලා එක්කන් ගියේ... දණ හකුළුවා විරිත්තලා ඇහුවා මාත් එන්නද කියලා..."

"හරි හරි එහෙම හිතලා හරි ගියා කියමුකෝ... ඔන්න රාජව එළියේ තියලා මායි අර කෙල්ලයි ෆුඩ් සිටි එකට ගියා... එක්කෙනෙක් ජීන්ස් එකක් ගහලා අත් දිග ටීෂර්ට් එකක් දාලා නිකං අපට පේන්න... මාත් ඉතින් වැඩකාරයා වගේ එයා පස්සේ ට්‍රොලියත් තල්ලු කරන් ගියා..."

"ඒ වෙලාවේ නම් මට ඇත්තටම දුක හිතුනා... ටිකක්

හොඳ කොල්ලෙක් කියලා හිතුණා..."

"ඔන්න ඉතින් අර කෙල්ල බඩු ලෝඩ් එකක් ට්‍රොලියට දානවා... ෂැම්පු දානවා සබන් දානවා... ඔහොම යනකොට..."

සමාධි තොල් පට තද කරගත්තාය.

"ඉතින් කියන්න..."

"අරවා තියෙන රැක් එකක් ළඟ නතර උනා..."

"මොනවද..."

"අරවා... අරවා... අර ගෑණු ළමයි දාන්නේ... ඒවා... දැන් ගෑණිට ඕන එකක් ගන්න... ඒත් මං ඉන්න නිසා ලැජ්ජයි..."

"එහෙම තමයි හැදිච්ච ගෑණු ළමයි... ඒවා පිරිමි ළමයිට පේන්න උස්සන් යන්නෑ... කඩේකින් ගත්තත් මුදලාලි බ්‍රවුන් පේපර් එකක දාලා ඔතලා දෙන්නේ..."

"හරි හරි... ඒත් ඕකේ මොකක්ද හංගන්න තියෙන්නේ... ගෑණු ළමයිට ඕක හැදෙනවා කියලා කව්රුත් දන්නවනේ... හැදුණම මේවා අඳිනවා කියලා දන්නවනේ..."

"හරි ඉතින්..."

"එයින් එකක් දෙකක් ගත්තහම එකක් දෙනවා කියලා ගහලා තිබ්බා... මං පස්සේ ඒක බලලා අර කෙල්ලට කිව්වා... එයා අහක බලාගෙන කියනවා "හ්ම් දාන්න..." කියලා... හරියට ඒවා මං අඳිනවා වගේ..."

"එපාම කරපු කොල්ලෙක්..."

ඇය මගේ උරහිසේ හිස ගසා කීවාය.



"මං දැන් කියන්නද..."

සමාධි ඇසුවාය.

"ම්..."

"දවසක් රෑ මායි රාජයි මිදුලේ කතා කර කර උන්නා... රාජා ඒක බලපු විජේගේ ටැමිල් ෆිල්ම් එකක් මට කිය කියා හිටියේ... විජේගේ ඇක්ෂනුත් එක්ක..."

"ඒකා කියන්නේ ඔයා සිම්රන් වගේ කියලා..."

"ඒකට පිස්සු... ඉතින් අහන්නකෝ... පස්සේ රාජා මිදුලේ මාව දාලා කෝපි ගේන්න කුස්සියට ගියා... මට හරි පාළුයි... මං බැලුවා එක්කෙනෙක්ගේ කාමරේ දිහා... එයා නිදා... එදා නර්සරි එකට පැළ ගෙනාපු දවස... පව් ඉතින් දවසම මහන්සි උනා... ඒ මහන්සියට නිදි... මං හිමිහිට මිදුලෙන්ම ගියා කාමරේ ළඟට... දොර අඩවල් කරලා තිබ්බේ... මං ඇරියා හෙමිහිට... අනේ කොට කළිසමකුයි වෙස්ට් එකකුයි විතරක් ඇඳගෙන පොරවන්නෙවත් නැතුව නිදි..."

සමාධිගේ දෑස් කඳුළින් පිරී ගියේය. මම සීට් එක පැත්තෙන් අත දමා ඇගේ හිස පිරිමැද්දෙමි.

"ම..ම..ට හ..රි..."

"ඉතින්..."

"ආ..ද..රේ හිතුණා... ළඟට ගිහින් ඇඳ උඩ වාඩිවෙලා ඉඹින්න හිතුනා... එහෙම කා ගැනවත් හිතිලා නෑ... පස්සේ පොරවන රෙද්ද අරගෙන කකුල් දෙකේ ඉඳලා ඔළුව වෙනකල් පෙරෙව්වා... එකපාරටම ඒ කොල්ලා අනිත් පැත්තට හැරුණා... මං හිතුවා ඇහැරුණා තමයි කියලා...

The Reader's Place Novel..

කොහෙද ඒකා කොට්ටේ බදාගෙන ආයෙත් සැපට නිදි... මං තවත් ටිකක් වෙලා බලන් ඉඳලා එළියට ආවා... එනකොට රාජා එතන... පොළව පලන් යන්න හිතුණා..."

"එතකොට..."

"ඒකා මුකුත් අහන්නෑ... ඒත් මූණේ ප්‍රශ්න කෝටියයි... මං කිව්වා පොතක් තියේද කියලා බලන්න ගියා කියලා..."

"එතකොට රාජා කොල්ල කියපි.. පුංචි නෝන නිර්වාන් මහත්තයට පොරවපු එක හොඳයි නැත්නම් සීතලේ මැරෙයි කියලා... මට පොළව පලන් යන්ඩ හිතුණා... මං කිව්වා මං පොරෝපු එකක් නෑ කියලා..."

"එහෙනම් තව දෙයක් කියන්නද..."

මම ඇසුවෙමි.

"ම්..."

"ඒ කොල්ලා එදා නිදාගෙන හිටියේ නෑ... හොඳට ඇහැරගෙන ඒ කෙල්ල මිදුලේ කතා කරන ඒවා අහගෙන හිටියේ... රාජා අන්තිමට කියව කියව හිටියේ විජේ ඇවිත් කෙල්ලව කෝවිල ළඟින් අරගෙන බයික් එකේ තියන් යන හැටි... මඟදී කෙල්ලගේ තාත්තගේ මිනිස්සු ඉන්නවා විජේට ගහන්න හරිද..."

"බලන්න... ඇයි එහෙම කළේ..."

"මට ඇහුණා කාමරේ පැත්තට එනවා... මං ටක්ගාලා ඇඳට පැනලා ඇස් පියාගත්තා..."

"ඇත්තටම නිදාගෙන නෙමේද හිටියේ..."

"නෑ... ඊට පස්සෙත් ඇහැරිලා හිටියේ... රැක් එකෙන් පොරවන රෙද්ද ගන්නකොට මං ඇහැ ඇරලා ටිකක්



බලලා ආයෙත් ඇස් වහගත්තා..."

"හරි මොකක්ද මං ඇඳන් හිටියේ... කියපන් බලන්න..."

"ඇඳන් හිටියෙද... සුදු හාවෙක් වගේ ඇඳුමක්... සුදු දිග පැනල් ජම්පර් කලිසමයි ඒකෙම ටොප් එකයි... උඩින් රතු පාට ජර්සි එකක් දාන් හිටියේ... හරිද..."

සමාධි අනේ කියන්නාක් බඳුව බලාගෙනම උන්නාය.

"දැන් එතකොට මහත්තයා විශ්වාස කරනවද මං එදා ඉඳලා ආදරේ කළා කියලා..."

"මං විශ්වාස කරන්නේ එදා ඉඳලා බබා මට ආදරේ කළා කියලා නෙමේ..."

"එහෙනම්..."

"ගිය ආත්මේ ඉඳලා... ඊටත් එහා ආත්ම වල ඉඳලා මට ආදරේ කළා කියලා..."

"මටත් එහෙම හිතෙනවා..."

"එදා බබා නිදාගන්න යද්දී රාජට කිව්වා..."

"මොනාද කිව්වේ..."

"අරයා හරියට කාලත් නෙමේ නිදාගත්තේ ඇහැරවලා නෙස්ටමෝල්ට් එකක් දෙන්න කියලා... ඒ වෙලාවේ..."

මම තොල් පට තද කරගෙන බිම බලාගත්තෙමි.

"කියන්න... ඒ වෙලාවේ..."

"මගේ ඇස් දෙකට කඳුළු ආවා..."

දැනුත් මේ මොහොතේත් මගේ ඇස්වල කඳුළුය.

The Reader's Place
Novel..

"අ..නේ අඬන්නෙපා... මං එදාටත් වඩා දැන් ආදරෙයි..."

"මං... ද..න්..න..වා බ..බා..."

"එහෙනම් අඬන්නේ..."

"අඬන්නෑ බබා... ඒවා මතක් කරනකොට හරි ආසයි... හ..රි..ම ආ..සයි..."

සමාධි මගේ උරහිසට හිස තබා දෑස් පියාගත්තාය.

ගුවන් ගමන නිමාකර ගමනාන්තයට ළඟා වීමට තව ඇත්තේ පැයකුත් විනාඩි හතළිස් තුනක් බව ගුවන් යානයේ රූපවාහිනී තිරයේ සටහන් විය. දැන් යානය පියාසර කරමින් ඉන්නේ ජකාර්තා වලට ඉහළින් මලක්කා සමුද්‍ර සන්ධිය හරහාය.

"අපි කෑම ටිකක් කමු බබා..."

ගුවන් සේවිකාව විසින් යානයේදී ලබාදෙන දහවල් ආහාරය ගෙනවිත් දුන්නාය. එය චිකන් බුරියානි සමඟ සකස් වූ තවත් කෑම එකකි.

"ඔය මළ ජරාව කන්න බෑ සුද්දූ..."

සැබෑය. මටද කන්නට හිතක් නැත.

"එහෙනම් මේ බනිස් ගෙඩිය කමු... මං බටර් ගාල දෙන්නද... කාලා ඔරේන්ජ් එකක් බොමු..."

සමාධි තෝන්තුවාවෙන් මෙන් හිස වැනුවාය. අප මේ ළඟා වෙමින් සිටින්නේ බරපතල දුක් සංසාරයකට බව ඇයද දනී. මමද දනිමි.

"මධූයි සුභාෂුයිත් එයාර් පෝට් එකට එනවා කිව්වා නේද..."

The Reader's Place
Novel



"ඔව්... අපේ අයියත් එනවා කිව්වා..."

"අනේ කට්ටියම හිටියොත් හොඳයි... මට හ..රි බ..ය..යි සු..ද්දූ..."

ඒ බිය එහෙමම සමහර විට ඊටත් වඩා මට දැනෙයි. ඒ බිය දැනෙන්නේ අන් කවරක් නිසා වත් නොව මේ ගමනාන්තයෙන් පසුව අපේ ආදර කතාවේ වන අම්හිරිම පරිච්ඡේදය උදාවන නිසාය.

සමාධි කෙටි නින්දකට පිවිසියාය. මමද එහෙමම ඇයව උරහිසේ තබාගෙන උන්නෙමි. එසේ සිටියදී මගේ දෑසට දෙතුන් වරක්ම කඳුළු පිරුණි. එහෙට මෙහෙට යන ගුවන් සේවිකාවන්ට නොපෙනෙන්නට මම දෑස් පිසදා ගත්තෙමි.

මගේ සම්පත... මගේ ජීවිතය... මගේ ආදරය... මගේ සන්තකය තවමත් මගේ උර මඬලේය. එසේ සිටියදීම මෙසේ පපුව කඩාගෙන විත් ඇඬෙන මට ඇයව අහිමි වූ පසුව කෙසේ ඇඬේවිද...

මට සිතා ගන්නට වත් නොහැක.

එපමණ යැයි මෙපමණ යැයි ප්‍රමාණයක් කිව නොහැකි පමණටම මම සමාධිට අප්‍රමාණවම ආදරය කරමි. ආදරය කරන වස්තුව ශාරීරිකව සන්තකයේ නොවුනද ආදරය කළ හැක. එහෙත් අත තබා ස්පර්ශ කළ නොහැකි වීම... ළවන් තබා සිපගත නොහැකි වීම ශාරීරිකව තමාගේ යැයි හැඟීමක් හදවතට නොනැඟෙන විට ආදරය දුකකි. වියෝගයකි.

ආදරය පපුවේ ඇති මුත් අතගා බලන්නට ශාරීරික ප්‍රේමයක් නැති වූ කල හදවතට නිවනක් නැත.

අනාගතයේදී මට විඳින්නට වන්නේ ඒ වේදනාවය. විරහී ගින්දරය. සමහර විට මා ඒ ගින්දරින්ම දැවී පිච්චී අළුවී මිය යා හැක.

ආදරය නමින් මිය ගිය එකම පෙම්වතා මම නොවන්නෙමි.

කටුනායක ගුවන් තොටුපලේදී කුමක් විය හැකිද... මම මවාගන්නට නොගියෙමි. ජීවිතයේ උදාවන අවාසනාවන්ත සිදුවීම් මවා ගන්නට ආශා කරන්නේ කවුද...

මම මගේ උරහිසේ නිදන මගේ බිරිඳගේ මුහුණ දෙස ඕනවාටත් වඩා බලා උන්නෙමි. මේ මගේ බිරිඳගේ මුහුණ දෙස මට බලා ඉන්නට වන අවසාන මොහොත යැයි මට සිතුණි.

මේ ලෙස සසරේ

ළතැවුල් අතරේ

පෙම් වියෝග දුක් විඳින්න

ඇයිද හමුවුනේ...

සිංහල ගීතයක පද කිහිපයක් මට සිහිවිය. කොතරම් දුකක් වුව කොතරම් ගින්දරක් වුව සමාධිව හමුවීම ගැන මම මගේ දෛවයට අනේක වාරයක් පින් දුන්නෙමි. මගේ ජීවිතයේ සිදුවූ එකම මංගල්‍යය සමාධිව හමුවීමය. එය නිකම් මංගල්ලයක් නොව මහා මංගල්ලයකි.

එහෙව් මංගල්ලයක් මා වැනි සාමාන්‍ය පන්තියේ කොල්ලෙකුගේ ජීවිතයේ වන්නේ එක් වරකි.

හදවත තව්තිසාවක් කළ දිව්‍යාංගනාව සමාධිය. ඒ



දිව්‍යාංගනාව අද හෝ හෙට මට අහිමි වී යා හැක. දිව්‍යාංගනාවක් කොහොමත් මනුස්ස පුත්‍රයන්ට සදාකාලිකව හිමි නොවේ. සමාධිව හමු වූ දිනයේ සිට මම මහා බියකින් උන්නෙමි. ඒ ඇය කොයි මොහොතක හෝ මට අහිමි වේ යැයි කියාය.

ඉතා බියෙන් උන් ඒ දවස දැන් උදාවී ඇත... “දෛවය මෙය නම් සුදූ අපි නාඬමු...” කියා මට සමාධිට සමු දිය නොහැක. ඇය මගෙන් වෙන්වෙද්දී ඒ වෙන්වන්නේ හදවතේ නහරද ඇට මස්ද දවාගෙනය.

නිර්වාන්ගේ පණ තිබුණේ සමාධි ළඟය.

මට මේ කරන්නට යන දේ හතුරෙකුටවත් කරන්නට එපා යැයි මම දෙවියන්ට කියමි. මෙහෙම දුකක් පපුවක් ඇති කෙනෙකුට දීම සාධාරණ නැත. මන්ද හදවතද... මේ ජීවිතයද ඒ දෙකටම දුක් දෙන ආදරයද දෙවියන්ගේම මැවීමක් නිසාය.

“පැසෙන්ජර් එනවුන්ස්මන්ට්...”

ගුවන් නියමුවා පණිවිඩයක් දෙන්නට යන බව රූපවාහිනී තිරයේ දැක්වින.

සිංගප්පූරුවේ සිට පැමිණි එස් කියු යානය තවත් හරියටම විනාඩි විස්සකින් කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට ළඟා වන බව නිවේදනය කෙරිණ.

මම යානය ගුවන් ගතවන අහස් ක්ෂිතිජය දෙස බැලුවෙමි. සිංගප්පූරුවේ සිට එන යානය දැන් පියාසර කරමින් තිබෙන්නේ ශ්‍රී ලංකාවේ මඩකලපුව අම්පාර ප්‍රදේශය උඩිනි. හරියටම කිවහොත් තව මොහොතකින්

The Reader's Place Novel..

මේ යානය ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය උඩින් ගමන් ගනී.

හඟුරන්කෙත ඇත්තේත් ඒ මධ්‍යම කඳුකරයේ නුවරඑළිය දිස්ත්‍රික්කයේය. අපේ හමුවීම් වල මතක... අපි එකට ජීවත් වූ මතක... අපි එකට පවුල් කෑ මතක සියල්ල තව මොහොතකින් මතකයක්ම කරමින් අපට වෙන්වන්නට සිදුවෙනු ඇත.

යානය තවත් විනාඩි දාහතරකින් කටුනායකට ගොඩ බසින බව දැක්විණ.

ජීවත් වීමට තව ඇත්තේ විනාඩි දාහතරක් මෙන් මම ඇතුළතින් ඇවිලී ගියෙමි. කටුනායකදී කුමකින් කුමක් විය හැකිද... ජයසූරිය මහතා සුදේශ් වැන්නවුන් මා දෙස කාරුණිකව බලතැයි මම නොසිතමි.

මේ අප ප්‍රාර්ථනා කරනා ලෝකය නොවේ.

යානය ගොඩ බස්සන්නට ඇත්තේ තව විනාඩි දොළහකි.

ආරක්ෂක ආසන පටි තද කරගන්නා ලෙස නිවේදනය කෙරිණි. සමාධි නැඟිටින්නේ නොමැතිව මට ඇගේ ආසන පටි තද කළ නොහැක.

මගේ දෑස් වේගයෙන් තෙත් වෙමින් තිබුණි. එය නවත්වා ගන්නට මට හැකි හැම ධෛර්යයක්ම යෙදුවෙමි. එහෙත් මම පැරදුනෙමි. අවසානයේ මම ටිෂූ එකක් දෙනෙත් වලට තබා තද කරගෙන මොහොතක් උන්නෙමි. මොහොතකින් ටිෂූ එක තෙත් විය.

"පාසින් යුවර් සීට් බෙල්ට් සර්..."



ගුවන් සේවිකාවක් යුහුසුළුව කියාගෙන ගියාය. ඔවුන් මේ කලබලයෙන් සූදානම් වන්නේ යානය ගොඩබැස්සවීමටය.

"බ..බා..."

මම දෑස් අමාරුවෙන් පිසදා සමාධිට කතා කළෙමි. ඇයව නොඇහැරවාම ඔසවාගෙන ගොස් බාරදෙන්නට ඇත්නම් යැයි මට සිතුණි.

"බ..බා..."

මම යළිත් ඇයට කතා කළෙමි. සමාධි අමාරුවෙන් මෙන් දෙනෙත් එසෙව්වාය.

"සු..දූ.. ම..ගේ ඔ..ළුව රි..දෙ..න..වා ම..හ..ත්..ත..යෝ..."

සමාධි නැඟිට්ටේ හිස ඇඟිලි වලින් මිරිකමිනි. මම ඇත්තටම බිය උනෙමි.

"හෙඩ් ඒක් ආවොත් ටැබ්ලට් එකක් තියෙනවා බබා... අපි ඒක බීලා ඉමු... තව ටි..ක..කින් අපි කටුනායකින් බහිනවා..."

ඒ වචන ටික කියද්දී මගේ කටහඬ බිඳී ගියේය.

"මෙ..ච්..ච..ර ඉක්මනට..."

"වෙලාව ගියා බබා... ඔයා නිදාගෙනනේ උන්නේ..."

සමාධි පුදුමයෙන් මෙන් මොහොතක් මා දෙස බලා උන්නාය.

"අ..නේ ඔයා අඬලා නේද..."

මගේ බිරිඳට මගේ මුහුණේ වන වෙනස්වීම් එක වරක් බලා කිව හැක.

The Reader's Place Novel.

"නෑ බ..බා මං ඇ..ඬු..වේ නෑ..."

ඒ ටික කියද්දීත් මගේ ඇස්වල කඳුළුය. සමාධි ඇගේ සිහින් ඇඟිලි වලින් මගේ මුහුණ පිරිමැද්දාය.

"බයවෙන්නෙපා මහත්තයෝ... මං ඉන්නවනේ... බ..ය..වෙ..න්..නෙ..පා..."

සමාධිද හඬමින් කීවාය.

"පාසින් යුවර් සීට් බෙල්ට් සර්..."

ගුවන් සේවිකාවක් නැවත කියාගෙන ගියාය.

"කෝ මැණිකගේ සීට් බෙල්ට් එක තද කරන්න..."

සීට් බෙල්ට් එක තද කරද්දී සමාධිගේ දෙනෙතින් ආ කඳුළක් මගේ අතට වැටුණි. ඇයට විශාල කම්පනයක් ඒම හොඳ නැත.

"අඬන්නෙපා..."

"ම්..."

යානය තව විනාඩි තුනකින් පොළෝගත කරන බව නිවේදනය කෙරිණ. සියළුම මගීන් ගොඩ බැසීම සඳහා සූදානම් විය.

පිට රටක සිට මව්බිමට එද්දී කොතරම් සතුටක් දැනෙනවාද... ඒත් මට ඒ සතුට නැත. මා කොතරම් පව්කාරයෙක්ද...

"ඔයාගේ අතත් වෙව්ලනවා සුද්දා..."

සැබෑය... සමාධිගේ උකුල මත තිබූ මගේ අත ඇත්තටම වෙව්ලමින් තිබුණි.

"මොනවත් හිතන්නෙපා බ..බා..."



සමාධි මගේ වෙව්ලන අත පහත් වී නොනවත්වා සිපගත්තාය. මොනවා කීවද ඇයටද අහිමි වීමක වියෝගයක කම්පනය දැනෙමින් තිබෙනවා විය යුතුය.

"තව විනාඩියයි..."

සමාධි කීවාය. මම ඇය දෙසම බලා උන්නෙමි.

"මැරුණත් මං ඔයාගේ සුදූ..."

ඒ පොරොන්දුව මේ දුෂ්කර මොහොතේදී හිත හදා ගන්නට මට ඇතිය.

එකවරම යානය කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට ගොඩබැස්සවිණ. දැන් යානය යන්නේ කටුනායක ගුවන් පථය ඔස්සේය.

මව්බිමේ පොල් ගස් දෙස මම කුඩා කව්ළුවෙන් බලා උන්නෙමි.

"ම..ට අ..මා..රු..යි ව..ගේ ම..හ..ත්..ත..යෝ..."

සමාධි පපුවට අතක් තබාගෙන කීවාය. ඇගේ පපුවේ අමාරුව වැඩිවෙන්නට ඇත්තේ හදවතට දැනුණ කම්පනය නිසා විය යුතුය.

"අනේ මැණික... ඔයාව සනීපෙන් මට බාරදෙන්න ඕන... මේ ටැබ්ලට් එක අරන් ටිකක් රිලැක්ස් වෙන්න බබා..."

මම වහා හදිසි අවස්ථාවකට ගන්නා ටැබ්ලට් එක දුන්නෙමි. ඒත් සමඟම ගුවන් මගීන් ගුවන් යානයෙන් පිට වීමට නැගිට්ටෝය. මම බිය මුසුව සමාධි දෙස බැලුවෙමි.

"ම..ට කලන්තේ වගේ ම..හත්තයෝ..."

The Reader's Place Novel..

පිට වීමට ප්‍රථම සමාධිට අමාරු වෙතැයි මම බිය වීමි. දෙවියන් මගෙන් පළිගන්නේ ඉතාම කුරිරු ලෙසය. මේ ආත්මයේ වරදක් පවක් නොකළද මා නම් පූර්ව ආත්මයක මහා පවක් කරන්නට ඇත. ගුවන් ගමන පුරාමත් ඊට කලිනුත් මම දහස්වර දෙවියන්ට මේ ගැන කීවෙමි. එහෙත්...

"තා..ත්..තලා හම්බවෙනකල් ටි..ක..ක් ඉවසන් ඉන්න සු..දූ.. ආ.. මේ පෙති දෙකත් බොන්න..."

මම සාමාන්‍ය පැරසිටමෝල් පෙති දෙකකුත් සමාධිට දුන්නෙමි. අප දෙදෙනාගේම දෑස් බලන්නට බැරි තරම් රතු වී තිබුණි.

අප අද වෙන් වුවද මම එක් දෙයක් ගැන සැනසෙමි. ඒ මට හමු වූ දා සිට මගේ බිරිඳ මට දෙවියෙකුට මෙන් ආදරය කළේ යැයි සිතාය. ඉන් පසුවත් ඇය මට එලෙසම ආදරය කරන බව මම දනිමි.

"අපි බහිමු සු..දූ..."

අප දෙදෙනා ගුවන් යානයෙන් බැස්සේ අන්තිමටය. සිංගප්පූරු ඇඳුමින් සැරසුණු ගුවන් සේවිකාව දෙස මම අවසන් වරටත් බැලුවෙමි.

ගුවන් යානයෙන් බසිනා පඩිපෙළේදී මම සමාධිගේ අතින් තදින්ම අල්ලාගෙන උන්නෙමි. සමහර විට මේ මගේ බිරිඳගේ අතින් අල්ලාගෙන ඉන්නට මට ලැබෙන අවසාන අවස්ථාව වන්නට පුළුවන.

"ඔයා..ගේ අත හරි රස්නෙයි..."

එසේ කියා සමාධි අමාරුවෙන් මගේ ගෙළට පිටි අත්ල තැබුවාය.



"දෙයියනේ සුදූ ඔයාට උණ... අ..නේ දෙ..යි..ය..නේ මොනවද මේ කරන්නේ..."

මට උණ ගත්තේ දැන් නොවේ. යානයට ගොඩ වෙද්දීමය. එහෙත් මට මගේ අමාරුවක් නොදැනෙයි.

"ම..ට වතුර ටිකක් බොන්න දෙන්න සු..දූ..."

සමාධි ඉන්නේද කලන්ත ගතියෙනි. මම වතුර බෝතලය ගෙන ඇයට දුන්නෙමි.

"ඔය ඇස් දෙකත් දැන් පිහදගන්න... ආ..."

ගුවන් යානයේ සිට ගුවන් තොටු පළේ පර්යන්තය දක්වා ගෙන යන බස් රියට අපි ගොඩ වූයෙමු. මේ බස් රියට නැග අප එද්දී සමාධිගේ මුහුණ තිබුනේ අදට වඩා සුන්දරවය.

"පවුඩර් ටිකක් වත් දාගමු මැණික... එයාලා නැත්නම් කියයි මූ කෙල්ලව නාස්ති කරලා කියලා... ආ..."

සමාධිගේ බෑගය හැර මම ඇගේ කුඩා රෝස පවුඩර් පෙට්ටිය ඇයට දුන්නෙමි.

"මං ගාන්නද..."

මම මගේ අතින්ම සමාධිගේ මුහුණේ රෝස පවුඩර් තැවරුවෙමි. ඒ කඳුළු යළිත් අලුත් විය. මම රෝස පවුඩර් තවරන ස්පොන්ජ් එකෙන්ම ඒ දෙනෙත් තැව්වෙමි.

"මා..ව මැ..රෙ..න්..න ව..ගේ සු..දූ..."

ආසනයේ ඉඳගෙන උන් සමාධි හිටගෙන උන් මගේ දෙපා බදාගත්තාය.

බස් රිය පර්යන්තය බලා පිටත් විය. මේ ළංවන්නේ අපේ වියෝග මොහොතටයි. කුමක් කරන්නද... දෛවය

The Reader's Place Novel..

මෙයයි...

බසයෙන් බසිද්දී ඇගේ තත්වය වඩාත් නරක අතට හැරිණ. මම අමාරුවෙන් ඇගේ හිත හදමින් ඇයව ඇ ගෙන ආවෙමි. ආගමන ලියකියවිලි පෙන්නා අපි ඉක්මනින්ම බැගේජ් කවුන්ටර් වෙත ආවෙමු...

සිංගප්පූරුවේ ගත කළ මතකයන් හැරෙන්නට අන් සියල්ල පැක් කළ අපේ බෑගය මම බැගේජ් බෙල්ට් එකෙන් ගත්තෙමි.

"ඔයාව ගැහෙනවා මැණික... ආ... තව වතුර ටිකක් බොන්න..."

සමාධි වතුර ටික බිව්වේ වෙව්ලමිනි.

"තව ටිකයි මැණික..."

මම රේගු කවුන්ටරයට අපේ පාස්පෝට් සමඟ ලියකියවිලි පෙන්වා එය සීල් කර ගත්තෙමි.

පිටවීමේ අවස්ථාව උදාවිය. මම අපේ බෑගය ට්‍රොලියක තබාගෙන එය එක් අතකිනුත් සමාධිව තවත් අතකිනුත් වත්තන් කරගෙන අරයිවල් ගේට් වශයෙන් හඳුන්වන පැමිණීමේ ගේට්ටුව වෙත ආවෙමි.

විශාල පිරිසක් එහි විය. මම මගේ අසරණියවද වත්තන් කරගෙන ඒ වටාම දෙනෙත් යැව්වෙමි... අවසානයේදී මම ඒ මුහුණු ටික දැක්කෙමි. ජයසූරිය මහතා සුදේශ් අම්මා සමඟ මධූත් සුභාෂුත් උන්නෝය. අයියාද පැත්තකින් විය. මම හිරි වැටී ගිය දෙනෙතින් ඔවුන් දෙස බලා උන්නෙමි.

සමාධි උන්නේ සිහි නැති වූවාක් බඳුව අමාරුවෙනි.

The Reader's Place Novel..



"බ..බා.. තා..ත්..ත..ලා ඇ..වි..ත්..."

මම වෙව්ලමින් කීවෙමි. සමාධි මගේ දෙවුර බදාගෙනම හිස අමාරුවෙන් එසවූවාය.

"අපි.. ය..න්..."

කරන්නට දෙයක් නැත. මම සමාධිවද වත්තන් කරගෙන ඉදිරියට ගියෙමි.

"අ..නේ ම..හ..ත්..ත..යෝ..."

ජයසූරිය මහතා ඉදිරියට එද්දී සමාධි මාව තදින් අල්ලාගෙන උන්නාය. ඇයට වචන පිටවෙන්නේවත් නැත.

"පු..තේ..."

අම්මා බියෙන් ජයසූරිය මහතාටත් වඩා වේගයෙන් අප කරා ආවාය. මගේ දෑස් තෙත් වී කඩා හැලෙමින් තිබුණි.

"අ..ම්..මේ..."

මම සමාධිව අල්ලාගෙනම අම්මාට යංතමට පහත් වී වැන්දෙමි.

"අ..නේ ම..ගේ කෙ..ල්..ල..."

"අ..ම්..මේ..."

සමාධි අම්මාගේ පපුවට බර වූයේ එහෙම කියාගෙනය. ජයසූරිය මහතා මගේ දෑස් වෙතම දෙනෙත් තබාගෙන අප කරා ආවේය.

"ස..ස..ර්... ම..ට ස..මා..වෙ..න්..න..."

මම එහෙමම ඔහුගේ පාමුළ වැඳ වැටුනෙමි. ඔහු මා දෙසවත් බැලුවේ නැත.

"කරුණාකරලා මගේ දැහැට නොපෙනී පලයන්... නිර්වාන්..."

ඔහු ඒ තරමටම අකාරුණික විය.

"අ..නේ තා..ත්..තේ... ම..ගේ අහිංස..ක..."

සමාධිට කියන්නට ලැබුණේ එපමණකි. ඇය එහෙමම සිහි නැතුව අම්මාගේ ළයට කඩා වැටුණාය.

"බ..බා..."

මම පැන්නෙමි... ජයසූරිය මහතා මාව වැළැක්වූවේය.

"ඇති.. හොඳටම ඇති... දරුවගේ ජීවිතේ කාලකන්නි කළා හොඳටම ඇති... තමුසේ මගේ කෙල්ලව මළ කඳක් කරලා ගෙනාවනේ... දැන් මං ඒකිව වළදාලා පංශකූලේ දෙන්නම්... දැන් කරුණාකරලා යනවා..."

මම අසරණව අම්මා දෙස බැලුවෙමි. ඇයටද කරන්නට දෙයක් නැත.

"ස..ර් බ..බා..."

මම යමක් කියන්නට ගියෙමි.

"ගෙ..ට් අ..වු..ට්..."

සුදේශ් පැමිණ මගේ උරහිසට අත තබා කීවේය. මාව වෙව්ලන්නට විය.

"ඉමර්ජන්සි..."

ජයසූරිය මහතා කෑ ගැසුවේය. ඔවුන් සමාධිව රැගෙන ඉදිරියට ගියෝය. මම හඬමින් ඔවුන් පසුපස ටික දුරක් ගියෙමි. කව්රු හෝ පැමිණ මගේ අතක් අල්ලාගනු පමණක් මට මතකය.

The Reader's Place
Novel..



යළිත් සිහිය එද්දී මා උන්නේ ගුවන් තොටුපළේ දිග ආසනයක් මත වැතිරීය. මා වටා අයියාත් මධූත් සුභාෂුත් විය... සිහිය ආ විගසම මට ඉකි බිඳුණි.

"අ..නේ ම..ධූ... ම..ගේ කෙ..ල්..ල කෝ..."

මම හඬමින්ම ඇසුවෙමි. මගේ පපුව කැඩී ගැළවී විසි වී යන්නාක් මෙන් මට දැනුණි. ඔවුන්ද ඇස් වල කඳුළු පුරවාගෙන එකිනෙකාගේ මුහුණු දෙස බලමින් උන්නෝය.

"බ..ය..වෙ..න්..නෙපා නිර්වාන් අයියේ... ඔයාගෙ කෙල්ල ඔයාට නැතිවෙන්නෑ..."

මධූ මගේ හිස අතගා කීවාය. මට යළිත් හඬිණ.

"කෝ... එ..යා..."

"අන්කල්ලා එහෙමම අරන් ගියා..."

"අ..නේ සි..හි..ය ආ..ව..ද..."

මධූ නැතැයි කියන්නට මෙන් හිස වැනුවාය. මම පිච්චී ගියෙමි.

"බෙහෙත් රිපෝට්ස් ඔක්කොම මං ගාවනේ..."

"මං ඒවා අරන් යන්නම්... හැම දේකටම කළින් කෙල්ලගේ ජීවිතේ බේරගමු..."

"එයා පව්... බ..යේ හි..ටි..යේ..."

"අපිටත් හරි දුකයි මචං... නේද අයියේ... ඒත් උඹ බයවෙන්නෙපා... පිරිමි අපි වෙනස් උනත් ගෑණියෙක් වෙනස් වෙන්නෑ... උන් එක හිතින් ඉන්නවා..."

මම ආසනය මත ඉඳගෙනම කඳුළු පිසදා ගත්තෙමි.

"එ..යා..ව කොහේ අරන් ය..යි..ද දන්නෑ..."

"කිව්වේ නෑ අයියේ... බයවෙන්නෙපා... මටයි සුභාෂ්ටයි යන්න පුළුවන්නේ..."

"අනේ මධූ... ඔයා මං ගාව ඉන්නෙපා... ආ.. රිපෝට්ස් ටිකත් අරන් යන්න... මේ සිංගප්පූරුවෙන් දුන්න බෙහෙත් ටික... මෙකේ එයාගේ රෝග වාර්තාව තියෙනවා... මේ ඩොක්ටර්ගේ රිපෝට් එක..."

"හරි... මං යන්නම්..."

මට මගේ ආදරය අහිමි වූයේ එසේය. එදා රාත්‍රියේ මම රවීටද පින් දී අයියාත් සමඟ කුලී රියකින් කොළඹ ආවෙමි. එන මඟ පුරාවටම මා කළ එකම දේ හැඬීම පමණි. අයියා මාව සැනසුවේද නැත. මා එසේ සැනසෙන්නේ නැති බවද ඔහු දැනගෙන උන්නේය.

ජීවිතයේ සන්තකයම අහිමි වූවාක් බඳු වියෝග දුකකින් මම පැලී ගියෙමි. මෙයින් මත්තට ජීවත්වීම අරුත් සුන් දෙයකැයි මට සිතුණි. ඇසට ඇසිපිය මෙන් උන් අප දෙදෙනාව වෙන් කර අද දෙවියන් ලබන සතුට කුමක්දැයි මට නම් සිතාගන්නටවත් නොහැකි විය. ලංකාවට එන්නට පෙර කීවරක් දෙවියන්ට කීවාද... කොතරම් නම් දෙවියන්ට මා කන්නලව් කළාද... ඒ කිසිවක් නාසා ඉන්නට මා පව්කාරයෙක්ද...

මේ ගෙවී යන්නේ මගේ ජීවිතයේ අවසාන දවස් ටික යැයි මට යංතමට මෙන් දැනුණි. එසේ ප්‍රාණය හදවතින් ගිලිහී යන්නට ප්‍රථම තව එක් වරක් ඇයව බලාගන්නට ඇත්නම් යැයි මට සිතුණි.

ආදරය නාමයෙන් කළ සියළු සත්‍ය ක්‍රියාවන්ම

The Reader's Place Novel..



නිෂ්ඵල වූ තැන මා පතන මේ දුප්පත් ඉල්ලීමවත් දෙවියන් පිළිගත යුතුය.

අවුරුදු විසි දෙකක මේ ජීවිතය පුරාවටම මම වරදක් කර නොමැත්තෙමි. මම අහිංසකයෙකුගේවත් පණක් නොසින්දෙමි. කිසිවෙකුගේ දෙයක් මම නොගත්තෙමි. ඒ වූ සත්‍ය ක්‍රියා බලයෙන්වත් මගේ ප්‍රාණය නිරුද්ධ වන්නට ප්‍රථම මට එක මොහොතක් මගේ අහිංසක බිරිඳගේ මුහුණ බලාගන්නට ඉඩ දිය යුතුය.

මින් මත්තට මා පතන්නේ කාවද... මින් මත්තට මා දුක සැප බලන්නේ කාගේද... මින් මත්තට මගේ යහන කෙළවර නිදන්නේ කවුද... රාත්‍රියේදී සිහිනයෙන් මෙන් මට දැනෙන සේ මගේ හිස පිරිමදින්නේ කවුද... නැත. ලෝකය එකම අඳුරු ගුහාවකි.

ඔබ නැති ජීවිතය අපායකි. දෛවය කියන්නේ ඔබ නොමැතිව ජීවත් වන්නට කියා නම් මම දෛවයටම පෙරලා මෙසේ කියමි. ඇගෙන් තොර වූ ජීවිතයක් මට අවශ්‍යම නැත. සියල්ල අහිමි කර ආත්මය නන්නත්තාර කර දැස් පනාපිටම මහා වියෝගයක් දී තවත් මාව ජීවත් කරවීම පාපයකි.

තව එකම වරක් පමණක් මට ඒ සුන්දර මුහුණ පෙන්වා මාව සදහටම මේ ජීවිතයෙන් මුදා හරින්න.

මා රන් මුදුවක් දැමූ ඒ සුරත යළිත් මට හිමි නොවෙනු ඇත.

අකමැත්තෙන් වුවද මා පිළිගත යුතුය. මේ අපේ ආදර කතාවේ අවසානයයි. එ..හෙ..ත් ප්‍රේමය තෘෂ්ණාවකි... ඒ තෘෂ්ණාවේ නාමයෙන් ජීවත්වෙන

අවසාන මිනිත්තු කිහිපයේ හෝ මා ඒ මුහුණ දැකගත යුතුය. නොවේනම් මා මතු ආත්මයකට යන්නේ සැනසීමකින් නොවේ.

ජයසූරිය මහතා කෙසේ හෝ සමාධිව සුව කර ගනු ඇත. ඉන්පසු ඔහු ඔහුගේ මුදල් බලයෙන් තම දියණියගේ දෛවය වෙනස් කරනු ඇත.

මා ජීවත්ව සිටියහොත් සමාධිව වෙනත් කෙනෙකුට විවාහ කර දෙන්නට වන්නේ මගේත් සමාධිගේත් විවාහය කටු ගැමෙන් පමණි. එසේ නම් අප දෙදෙනා දික්කසාද විය යුතුය. නැත. උසාවියකදී මට මගේ ආත්මයේ ලේ නහර කපා වෙන් කර දැමිය නොහැක. ඒ පාපය මම කිසිම දිනයක නොකරන්නෙමි. අපේ ප්‍රේමය සදාතනිකය. එය එහෙමම සදාතනික විය යුතුය. අමරණීය විය යුතුය.

සමාධි යළි විවාහ වන්නට නම්... අප දික්කසාදත් නොවේ නම් මේ කතාවේ අවසානය වෙනස් විය යුතුය. ඒ කතාවේ එක් චරිතයක් සදහටම දෙනෙත් පියාගත යුතුය.

ඒ මාය. මා මිය ගියහොත් ඇයව යළි වෙනත් කෙනෙකුට විවාහ කර දිය හැකිය.

මට ඇඬුණේ මට ඇයව අහිමි වී ගියා නොවේදැයි පපුවට තදින් දැනුණ නිසාය.

"ම..ල්..ලී..."

මා හඬද්දී අයියා මගේ උරහිසින් අල්ලා පිරිමැද්දේය.

"දැන් කටුනායක ඉඳලා උඹ කොච්චර ඇඬුවද කොල්ලෝ... ටිකක් හිත තද කරගනින්කෝ..."



ඔහු කීවේ අසරණවය.

"ම..ට එ..යා නැ..තු..ව ඉන්න බෑ... අ..යි..යේ... ඉ..න්..න.. බෑ..."

ආදරය මේ තරමටම පපුවේ පිහි ඇණුම් තුවාල හදනා දෙයකැයි මම නොසිතුවෙමි. එහෙත් එය එසේමය. ආදරය නිසා කෙනෙකුගේ පපුවේ ඇතිවන්නේ මරණීය තුවාලය.

"දන්නවා මල්ලියේ... දන්නවා... උඹ හිතනවද නංගිට උඹව නැතුව ඉන්න පුළුවන් කියලා..."

"එ..යා..ට..ත් බෑ..."

"ඉතින්... ජයසූරිය සර් උඹට බැණලා කෙල්ලව අරන් ගියාට උඹට ඒකිව නැති වෙනවද... ආදරයක් එහෙම නැති කරන්න පුළුවන්ද..."

සැබෑය. එහෙත් අප හිතනවාට වඩා මේ ලෝකය විෂකුරුය. කපටිය. ඒ කපටි විසකුරු ලෝකය මැද සමාධිත් මමත් අහිංසක හා පැටවුන් දෙදෙනෙකු මෙනි. ඇයද අසරණය. මම ඊට වඩා අසරණය.

අහිංසක අප දෙදෙනාට මෙසේ කළේ ඇයි...

කුලී වාහනය කොළඹට ළඟා වෙමින් තිබුණි. වාහනය කැළණි නව පාලමෙන් එගොඩ වී බේස්ලයින් පාර දිගේ යද්දී මම ඇතින් විසිතුරුව පෙනෙන කොළඹ නගරයේ ගොඩනැගිලි දෙස බලා උන්නෙමි. ජයසූරිය මහතා සමාධිව රැගෙන ගියේ කොහාටද...

"අ..යි..යේ..."

බේස්ලයින් පාර නිමා වී වාහනය බොරැල්ල දෙසට

The Reader's Place Novel.

යද්දී මම හිස එසවූයෙමි.

"මල්ලී..."

"අ..නේ අයියේ මට එයාව එකපාරක් බලන්න ඕන... එ..ක පාරක්... නැතුව මං කොහොමද ගෙදර යන්නේ..."

මගේ කඳුළු රෑරා වැටෙන්නට විය. අයියාද මා දෙස අසරණව බලා උන්නේය.

"එයාලා කෙල්ලව කොහේ අරන් ගියාද කියලා අපි දන්නෑනේ මල්ලී... ගෙනිච්ච හොස්පිටල් එක දන්නවා කියමු... ඒත් උඹ හිතනවද මේ වෙලාවේ එයාලා උඹට කෙල්ලව බලන්න දෙයි කියලා... එතනත් වෙන්නේ කලබලයක්නේ... ඉස්සෙල්ලා හිතන්න ඔය නංගිගේ අසනීපේ ගැන නේද..."

ජයසූරිය මහතාත් සංදේශුත් මට සමාධිව බලන්නට නොදෙනා බව සහතිකය. එහෙත් ඇය ප්‍රතිකාර ගන්නා රෝහල ළඟටවත් ගොඩ වන්නට ඇත්නම් යැයි මට සිතුණි.

"එහෙම කියන්නෙපා අයියේ... එයාට ගොඩාක් අමාරු වෙලා ගෙනාවේ... එයාර් පෝට් එකේදී සිහියත් නැති උනා... මො..න..වා උ..නා..ද ද..න්..නෑ..නේ... එයාට තියෙන්නේ බරපතල ලෙඩක්... පව්..නේ... ම..ගේ ගෑ..ණි..නේ අ..යි..යේ.. ඒ..."

මම හඬමින්ම කීවෙමි.

"මට තේරෙනවා මල්ලී... ඒත් මොකද කරන්නේ..."

"ම..ධූ..ට ෆෝන් කරලා බලමුද..."

"බලමු..."



අයියා ඔහුගේ අතේ වූ සෙලියුලර් දුරකතනය මා අතට දුන්නේය. මම ඉන් මධූගේ සෙලියුලර් අංකය එබුවෙමි. එය එහා පැත්තෙන් නාද විය. මගේ හිතට සහනයක් දැනුණි...

"ම..ධූ... මම..."

මට කතා කරද්දීම ඇඬුණි.

"අ..යි..යේ... මම දැනුයි හොස්පිටල් එකට ආවේ... ඔ..යා අඬනවනේ..."

"ම..ගේ කෙ..ල්..ල..ට මොකද උ..නේ..."

"ඔයා කලබල වෙන්නෙපා... එයාලා සමාධිව නවලෝකෙට අරන් ඇවිත් තියෙන්නේ... මං දැන් ගිහින් බලනවා... බලලා ඔයාට කතා කරන්නම්..."

"මා..ත් එන්න..ද..."

"එපා... මං කියන දේ අහන්න... එන්න හදන්න නම් එපා... කියන දේ අහලා දැන් ගෙදර යන්න... මං ඕනනම් ගෙදර එන්නම්..."

"එහෙනම් එනවද..."

"මං කිව්වනේ අයියේ... මං එන්නම් සුභාෂ් එක්ක... ඔයා ගෙදර යන්න..."

"අනේ බබාට කරදරයක් නෑ කියන්න..."

"හරි... අමාරු නම් මං කියන්නම්... මෙතනට එන්න එපා..."

"අනේ බබා ළඟම ඉන්න මධූ..."

"හරි අයියේ හරි... මං තියනවා..."

මම දුරකතනය තබා මොහොතක් උන්නෙමි.

The Reader's Place Novel..

කෙදිනකවත් මගෙන් සමාව ගත යුතු නැත. ඇය තරම් හොඳ නැන්දම්මා කෙනෙකු මට ආත්ම ගාණකට හමුවන්නේ නැත.

"මො..න..ව..ද මේ අම්මා කියන්නේ... අම්මා මොකටද මගෙන් සමාව ගන්නේ..."

අම්මාත් ඉන්දු අක්කාත් ඇස්වල කඳුළු පුරවාගෙන අප දෙස බලා උන්නෝය.

"ම..මං මට පුළුවන් විදිහට මගේ කෙල්ලව ඔයාගේ පුතාට දුන්නා නං..ගී... ඒ..ත්..."

සමාධිගේ අම්මා මේ කියන්නේ මගේ අම්මාටය. අම්මා පැමිණ සමාධිගේ අම්මාව ඇඳමත වාඩි කෙරුවාය.

"අනේ... දුවලගේ අම්මා ඔහොම අඬන්නෙපා... පුතා හිත හදාගෙන ඉන්නේ... මේ වෙලාවේ ඔක්කොම ප්‍රශ්න අමතක කරලා දරුවගේ අසනීපේ ගැනනෙ බලන්න ඕන..."

අම්මා කීවාය. ඇය එසේ කියූ එක හොඳයැයි මට සිතුණි.

"අ..නේ බලන්න නංගී මගේ දරුවට වෙච්ච දේ... මං සිංගප්පූරුවේ ගියානේ පුතාලව බලන්න... මං ගාවදිට වඩා සතුටින් පුතා ගාව කෙල්ල හිටියා... ඒත්..."

"බබාට පොඩි කාලේ මේ අසනීපේ තිබ්බද අම්මේ..."

"තිබ්බා පුතේ... අවුරුදු දෙකක් මං නෝනා වාට්ටුවෙමයි... ජයසූරිය මහත්තයා මේවා ඔක්කොම දන්නවා..."

"සර් බැණ්නට කමක් නෑ... මගේ ඇති තරහක් නෑ..."



"ඔයා කොච්චර හොඳ දරුවෙක්ද කියලා කවදාහරි එයාලා තේරුම් ගනියි... කෙල්ල අඬනවා පුතේ ඔයා නැතුව... පව්..."

ආදරයක් තේරුම් ගන්නට තරම් උණුවෙන හදවතක් තිබ්බානම් මේ කිසිවක් වන්නේ නැත.

"බබාට සනීප වෙයි නේද අම්මේ..."

"අද තමයි හොඳට ඩොක්ටර් එයාව බලන්නේ... පුතත් බෝධි පූජාවක් පටන් ගත්ත එක හොඳයි... මාත් හවසට බෙල්ලන්විල යනවා... අනේ අර දරුවත් පව්... කෙල්ල ගාවටම වෙලා ඉන්නවා..."

මට ඇති එකම සැනසීමත් මධූ සමාධි අසළ සිටීමය. මධූ අක්කා කෙනෙක් මෙන් සමාධිව රකිනා බව මට විශ්වාසය.

"ඔයාගේ මූණ දකිනකල් මට නිවනක් තිබ්බේ නෑ පුතේ..."

"දුවලගේ අම්මා මොනාහරි කාලා යන්න..."

"කන්න හිතක් නෑ නංගී..."

මේ ගැහැණිය ජීවිතය පුරාම වින්දේ දුක් පමණි. ඇය තම එකම වස්තුව වූ දියණියව මට දුන්නේ සැනසෙන්නට සිතාගෙනය. එහෙත් ඉන්වත් ඇයට සැනසීමක් ලැබුණේ නැත.

* * * * * * * * *

සමාධිව නොදැක මගේ දෑස් කකියන්නට විය.

The Reader's Place Novel..

හඟුරන්කෙතට ගිය එක දවසකින් පසුව මම ඇයව මගේ දෑස් මතම තබාගෙන උන්නෙමි. දැන් ඒ රුව මගේ දෑස් මත නොපැටලෙද්දී මගේ දෑස් දන්නට ගෙන ඇත.

කවදා වන තුරු මේ දුක් ගින්දර විඳින්නදැයි මම නොදනිමි.

තේ ටිකක් ඇරෙන්නට අන් කිසිදු කෑමක් බීමක් මගේ බඩට වැටුණේ නැත. බත් කටක් කන්නට දෙවරක්ම උත්සාහ ගත්තද එය මට අපහසු දෙයක් විය. එකටම කාගෙන බීගෙන නිදාගෙන වැටී උන් අප දෙදෙනාට අද මෙසේ වෙන්වී ජීවත් වන්නට සිදුව තිබියදී කන්නේ කෙසේද...

පපුවේ කිසිවක් ඉතුරු කර නොගෙනම ආදරය කළ අපව අද සනසන්නට කිසිවෙකුට නොහැක. අපව සැනසිය හැක්කේ අපටම පමණි.

අනේ අහිංසක කෙල්ල මාව කොතෙක් නම් සැනසුවාද... මම ඒ ආදරය තුරුලේ කොතරම් නම් සැනසුනාද...

පපුවම ඉරී යන්නේ ඒ සුවය යළිත් නොලැබේ යැයි පපුවට බියක් දැනෙනා විටදීය.

දින දෙකකින් පසු සමාධි සුභාෂ් අත මට පුංචි කොළ කැබැල්ලක් එව්වාය. නවලෝක රෝහලේ නම මුද්‍රණය කර තිබූ ඒ කඩදාසිය මැද ඇය ඇගේ රවුම් සුන්දර අත් අකුරින් ඒ ලිපිය ලියා තිබුණාය.

මගේ රත්තරන් සුදු පැටියෝ...

මං සනීප වෙනවා. ඒ නිසා ඔයා බයවෙන්නෙපා.



මට මගේ මහත්තයා නැතුව ඉන්න බෑ. ඉන්නම බෑ.

ඒ නිසා මං සනීප වෙලා එනතුරු හොඳින් ඉන්න. නොකා නොබී ඉන්නවා කියලා සුභාෂ් අයියා කිව්වා. ඇයි එහෙම කරන්නේ. මට ආදරේ නැද්ද. මං ඔයාට හරි ආදරෙයි. ඒ නිසා කාලා බීලා ඉන්න.

අනේ මට බෝධි පූජාත් කරනව නේද. පොඩ්ඩ නින්ද යන්න බෑ මට ඔයාවම හීනෙන් පේනවා.

මං ඔයාගේ

මැණික.

මගේ දෑස්වල කඳුළු පිරුණි. ඒ තරම් අසනීප මැදත් ඇය මේ ටික මට ලියා එව්වේ මගේ හිත හදන්නටය. ඇය එහෙමය. හැමදාමත් සිතුවේ මා ගැනය.

The Reader's Place Novel..

සුභාෂ් මා දෙසම බලා උන්නේය. මා නොකා නොබී දුක් විඳින බව ඔහු ගොස් සමාධිට කියන්නට ඇත. මා මෙසේ කඩා වැටී ජීවත් වෙනවා දකින්නට ඇය කෙදිනකවත් කැමති වූයේ නැත. අනන්ත ප්‍රශ්න මැද්දීත් ඇය බැලුවේ මගේ හිත හොඳින් තබන්නටය. අනුරාධපුරයට යද්දීත් එහෙමය. සිංගප්පූරුවට යද්දීත් එහෙමය. සිංගප්පූරුවෙන් එද්දීත් එහෙමය.

"දෙන්නෙක් වෙන්වෙලා උන්නත් දෙන්නා මචං ඒ දෙන්නා ගැන හිතනවනම් ආයේ උතුරු ඇමරිකාවෙයි උතුරු කොරියාවෙයි උනත් කමක් නෑ.. නේද..."

සැබෑය. අප දෙදෙනා වෙන්වී ඇත්තේ කිලෝමීටර් ගණනකිනි. එහෙත් හදවතින් අප එකිනෙකාව තදින් වැළඳගෙන ජීවත් වන්නෙමු. අපේ හුස්ම වැටෙන හඬ පවා අපට තදින් දැනෙයි.

"මං ටිකක් අවුල් වෙලා මචං ඉන්නේ..."

"අච්චර ලෙඩ මැදත් කෙල්ලට පුළුවන් නම් කෙළින් ඉන්න ඇයි උඹට බැරි... ඒ කෙල්ලගේ මෙතනට කටු ගහලා... මෙතනට ගහලා... පපුවට මැෂින් ගහලා... අතට සේලයින් ගහලා... උඹ දන්නවද ඒකි අකුර අකුර ගලප ගලප ඕක ලිව්වේ... මධූ කිව්වා උඹ කියපන් මං ලියන්නම් කියලා... ඒත් කෙල්ල ඇහුවේ නෑ... කෙල්ල ඒකිගේ අත් අකුරින්ම ඕක ලිව්වේ ඇයි..."

සුභාෂ් මා දෙසම බලා ඇසුවේය.

"එයා ආස නෑ මං මෙහෙම ඉන්නවට..."

ඔහු මගේ කරට අතක් දමාගත්තේය.

"ඔව් මචං... කඩා වැටෙන්නෙපා... මේක හරි අමාරු දවස් ටිකක් නිර්වාන්... දරාගනින්..."

දරාගන්නවා හැරෙන්නට කළ යුතු දෙයක් නැත.

"උඹට බොන්න ඕනද..."

සුභාෂ් මගේ උරහිසට අත තබා ඇසුවේය. මම එපා කියන්නට මෙන් හිස වැනුවෙමි.

"මං බීලා නාස්ති වෙන්න ආස නෑ මචං..."

"උඹ ඒක තේරුම් ගත්ත එක ලොකු දෙයක්... උඹට හැදෙනවනම් හැදෙන්න මේ කෙල්ලගේ අකුරු ටික ඇති..."

මම යටි තොල සපාගෙන හිස වැනුවෙමි.

එක ජීවිතයකදී හමු වන්නේ සතුටින් පිරුණ සමනල දවස්ම නොවේ. ජීවිතය දමා පලා යන්නට හිතෙනා තරම් අමාරු දුෂ්කර දවස්ද උදාවෙයි. අපි දෙදෙනා අපව එකට

The Reader's Place
Novel..



වැළඳගෙන ජීවිතය දරාගන්නට පුළුවන් වූ කාලයේදී එසේ කළෙමු. දැන් පැමිණ ඇත්තේ වෙන්වී ජීවිතය දරා ගත යුතු කාලයයි.

අනන්ත වූ බියක් දැනෙතත් සියල්ල හොඳින් විසඳේයැයි පුංචි බලාපොරොත්තුවක් මසිතේ විය. එය හදවත රවටා ගැනීමක් විය හැක. එහෙත් මාද ජීවත් විය යුතුය. අඩුම තරමේ ඇගේ සිනා මුහුණ එක් වරක් දකින්නට වත් ජීවත් විය යුතුය.

කව්රුන් කොහොම අප වෙන් කළද සමාධි මගේ නීත්‍යානුකූල බිරිඳය. ඇගේ නීත්‍යානුකූල සැමියා මම වන්නෙමි. පෙම්වතියක් පෙම්වතාගෙන් වෙන් කිරීම පහසුය. එහෙත් සැමියෙකුගෙන් බිරිඳක් වෙන් කිරීම අමාරුය.

කොහේ ගියද අවසානයේ ඒ වෙන්වීම නීත්‍යානුකූල කරන්නට නීතිය ඉදිරියට එන්නට සිදුවෙයි. එය අන් කෙනෙක් නොව සමාධිම කළ යුතුය. ඇය උසාවියට පැමිණ මගෙන් වෙන් විය යුතු බව කිව යුතුය.

බටහිරින් ඉර පැයුවද ඇය මගෙන් දික්කසාද නම් නොවන බව මම දනිමි. සමාධි ඒ තරම්ම මට ආදරය කළාය. ආදරය කළා පමණක් නොව ඇය මට අදහා ගත නොහැකි ලෙස ඒ ආදරය මගේ දෑස් ඉදිරිපිට ඔප්පුද කළාය.

මට සමාධිට හිමිවන දේපොළ වලින් එක රුපියලක් හෝ අවශ්‍ය නැත. සියල්ල කාට හෝ දී මට මගේ බිරිඳව පමණක් දෙනවා නම් ඇතිය.

සුභාෂ් කීවාක් මෙන් මට සමාධිව බලන්නට කාගේ

හෝ අවසරයක් අවශ්‍ය නැත. ඇයව බලන්නට පමණක් නොව ඇයව මට කැමති ලෙස අරගෙන යන්නටත් මට බලයක් ඇත. එහෙත් ඒ සියල්ල මම අසරණ කෙල්ලගේ ජීවිතය නමින් ඉවසමි.

ඇය සිංගප්පූරුවේදී අසනීප නොවුනා නම්... ඒ අසනීපය සිංගප්පූරුවේදීම සුව කරගන්නට මට හැකියාවක් තිබුණි නම්... මේ වෙන්වීම මෙලෙස සිදු නොවේ. කවර තත්වයක් ඇති වුවද සියල්ලටම පෙර සමාධි සුව විය යුතුය.

ඇගේ ජීවිතය වෙනුවෙන් ඉවසන්නට මම පුරුදු උනෙමි. අමාරුම මොහොතකදී සිංගප්පූරුවේ ස්ටුඩියෝ එකකින් අප එකට සිට ගත් පින්තූරය දෙස බලා මම හිත හදා ගන්නට පුරුදු උනෙමි. මේ ඡායාරූපයේ කොපියක් තිබුණි. එය සමාධිට යවන්නට ඇත්නම් කියා මට සිතුණි. එහෙත් ඒ ඡායාරූපය දැක ඇය අතීතය සිහිවී වැළපේවි යැයි බියෙන් මම එය නොඇරියෙමි.

ජීවිතය දරා ගන්නට වූ මට හයියක් තිබිය යුතුය. ගැහැණියක ලෙස සමාධි අසනීප මැදත් ජීවිතය දරාගෙන ඉන්නීය.

හවස් වරුවේ දරාගෙන ඉන්නට බැරිම මොහොතක මම නවලෝක රෝහල පිහිටි කොම්පඤ්ඤ වීදිය දෙසට ගියෙමි. අම්මා මාව තනියම යවන්නට කැමති වූයේද නැත. මම බෝධි පූජාවට කැළණි යනවා යැයි කියා ගෙදරින් එළියට බැස්සෙමි.

මඟදී මහා අනෝරාව පටන් ගත්තේය. සිංගප්පූරුවේ කාමරයේ තනිවී උන් ඉරිදා සවසක සිංගප්පූරුවට වැස්ස



බව මට සිහිවියි. අපි එකිනෙකාව බදාගෙන කුඩා කව්ළුවෙන් වැස්ස දෙස බලාගෙන උන්නෙමු.

එදා හවස අප වේලාසනින් ගෙනා කුඩා චොකලට් කේක් එකක් කපා කිරි තේ හදාගෙන බීවෙමු. එදා කෑ ඒ චොකලට් කේක් එකේ රස තවමත් මගේ දිවඟට දැනෙන්නට විය.

එකසිය තිස් අට බසය කොම්පඤ්ඤ වීදිය හන්දියේ නවත්වද්දී මම ඉන් පැන මහ වැස්සේම නවලෝක රෝහලට දුවගෙන ගියෙමි. තරමක සෙනඟක් එහිවිය. මම වටපිට බැලුවෙමි. එක මොහොතකට මට සමාධිව බලාගන්නට ඇත්නම් යැයි මට සිතුණි.

මේ ගෙවී යන්නේ බෝධි පූජාවේ තුන්වෙනි දවසය. ඒ අනුහස් වලටවත් මට මගේ කෙල්ලගේ මුහුණ දකින්නට වාසනාවක් තිබිය යුතුය.

අවට මහා වැස්සය. වේලාව සවස හතරට ආසන්නව තිබුණි. වැනල් අංශයේ තිබූ පුටුවකට බරවී මොහොතක් මම කල්පනා කළෙමි. අවසානයට මම අත තිබූ සෙලියුලර් දුරකතනයෙන් මධූගේ අංකය එබුවෙමි.

වාසනාවකට එය නාද විය.

"ම..ධූ මම..."

ඇයට දැන් මගේ අසරණ හිඟන හඬ හොඳට පුරුදුය. මම දවසකට තුන් හතර වතාවක් කතා කරමි.

"නිර්වාන් අයියේ..."

"හොඳටම වැස්ස නේ..ද..."

"ඔව්..."

The Reader's Place Novel..

"බබා මොනාද කරන්නේ..."

"දැන් නිදි... ඇහැරවලා දෙන්නද..."

"බබා ළඟ කවුද ඉන්නේ කියන්න..."

"තාම මං විතරයි... තව ටිකකින් කට්ටිය එයි... ඇ..යි අයියේ..."

"මං.. මං.. ඉ..න්..නේ නවලෝක හොස්පිට්ල් එකේ පහළ... මං.. මං.. නං..ගී විනාඩියකට ඇ..වි..ත් කෙල්ලගේ මූණ බලලා ය..න්..න..ද... බලන්න විතරයි ඕ..නේ..."

මට කතා කරද්දී හැඬුණි.

"අ..නේ දෙ..යි..ය..නේ.. අනේ රත්තරන් අයියේ දැක්කොත් මාවත් මෙතනින් එලවයි... ඒ..ත්.. මං කොහොමද ඔයාට එ..න්..නෙ..පා කියන්..නේ..."

"මං විනාඩියකට එන්නම්... බබාට ඇහැරවන්නෙපා... එක තත්පරයයි... බැලුවා ගියා... වෙන රූම් එකකට එනවා වගේ එන්නම්..."

"ඕන ඉලව්වක් වෙද්දෙන්... අයියා එන්න... ඔයාගේ ගෑණිනේ දෙයියනේ... මගේ මිනිහට මාව බලන්න බැරිද... එන්න..."

"මං ඔයාව අමාරුවේ දාන්නෑ රත්තරන් නංගී... විනාඩියයි..."

"හරි මෝඩයෝ... එන්න.. කතා නැතුව එන්ඩ... තර්ඩ් ෆ්ලෝර් එකේ රූම් නම්බර් ටුවෙන්ටි ෆයිව්..."

මම දුරකතනය වසා වේගයෙන් තුන්වෙනි මහළ වෙත ගියෙමි. ඉහළ මාළයට යන ලිෆ්ට් එක තිබුනේ උඩම තට්ටුවේය. එය පහළට එනතුරු බලා නොසිට මම



තරප්පු පේළිය දිගේ දිව්වෙමි.

අතරමගදී මගේ පය පැටලී තරප්පු පේළියේ මාව වැටෙන්නට ගියේය. මම දණගාගෙන මෙන් ඉහළට දුව ගියෙමි. තත්පරයක පමාව විශාල ප්‍රශ්නයකට මුල විය හැක.

තුන්වෙනි මහලේ කාමර අංක විසිපහේ දොරට තට්ටු කරද්දී මට හොඳටම හතිය. මම වෙව්ලන අතින් දොරට තට්ටු කළෙමි.

"එ..න්..ඩ දෙයියනේ..."

මධූ මාව කාමරයට ගත්තේ මාව ඇදය. ඇය එහෙමම වටපිට බලා දොර වැසුවාය.

"හදස්සියේවත් දොරට කවුරුහරි තට්ටු කළොත් ටොයිලට් එකට යන්න..."

සමාධි දෙස බලද්දී මගේ පපුව ගැලවී යන්නට තරම් විය. ඇය තවමත් මලක් වැනිය. සුදු නයිටියක් වැනි සැහැල්ලු ගවුමක් ඇයට අන්දවා තිබුණි. කනේ කරාබු නැත. බෙල්ලේ මාල නැත.

අඬන්නට නොහිතා උන් නමුදු මගේ මුළු දෙතොලම වෙව්ලා මට ඇඬෙන්නට විය.

"අඬන්නෙපා අයියේ... ඔය කඳුළු පිහදාගන්න මං කෙල්ලට ඇහැරවන්න..."

මධූ හැදුවේ සමාධිට ඇහැරවන්නටය.

"එපා මධූ... එයාට ඇහැරවන්නෙපා..."

"ඇයි ඒ..."

"මාව දැක්කොත් එයාට තව දුක හිතෙයි නංගී..."

The Reader's Place Novel..

"ඔයාව දැකලා කෙල්ලට දුක හිතෙන්නේ මොකටද... ඉන්න..."

මධූ සමාධිගේ ඇඳ අද්දරට ගොස් ඉඳගත්තාය.

"කෙ..ල්..ලේ... නැගිටින්න පැටියෝ... බලපන් කවුද ඇවිත් ඉන්නේ කියලා..."

සමාධි දෙනෙත් ඇරියේ යංතමටය. ඇය මා දෙස බලද්දී මගේ ඇස්වල තිබූ කඳුළුත් බලාපොරොත්තු නොවූ ලෙස පිට විය.

"අ..නේ ම..ගේ මහත්තයා..."

ඇය දෑත පෑවේ දරුවෙකුව වඩාගන්නට මෙනි. අපි එහෙමම එකිනෙකාව වැළඳගත්තෙමු... සමාධි එක දිගට හඬද්දී මම ඇත්තටම බිය උනෙමි.

"අඬන්නෙපා මැණික... මටත් ඇඬුණේ සතුටට..."

"අ..නේ සු..දූ මට ඔයා නැතුව ඉන්න බෑ සුදූ... මං.. මං... ඇනුත් ඔයාව හීනෙන් දැක දැක හිටියේ..."

"ම..ට..ත් හරියට ඔයාව හීනෙන් පේනවා මැණික... අඬන්නෙපා..."

මම සමාධිගේ මුහුණ දෝතට ගත්තෙමි.

"මං.. මං... ස..නී..ප වෙලා එන්නම් ම..හ..ත්..ත..යෝ... ඔයා බලන් ඉන්නවා නේද..."

"මං ඔයා එනකල් බලන් නොඉඳ කව්රු එනකල් බලා ඉන්නද මැණික..."

"මං දන්නවා..."

මධූ බලා සිටියදීම සමාධි මගේ දෙතුන් පොළක් සිපගත්තාය. මගේ දෙකොලට ඇගේ කඳුළු වල ලවන



රසය දැනෙන්නට විය.

"පරිස්සමින් මහත්තයෝ... මට හරි බයයි..."

"මං ගැන බයවෙන්නෙපා..."

"ම..ට බඩුවක් කරලා දෙනවද..."

"කියන්න..."

"මට ලියුම් එවන්න... එතකොට මේ පපුවට හරි සැනසීමයි... හ..රි..ම සැනසීමයි..."

"මං එවන්නම් බබා... දවස ගානේ එවන්නම්..."

"මං සනීප වෙච්ච ගමන් ඔයා ගාවට එනවා... බයවෙන්නෙපා... කාටවත් බෑ අපිව වෙන් කරන්න..."

"මං දන්නවා..."

මම උගුරෙන් මෙන් කීවෙමි.

"මං.. යන්නම්... බුදු සරණයි..."

සමාධි යන්නට පෙර මාව තවත් වරක් වැළඳගෙන ඉම්බාය. ඊටත් පසු ඇය අත් එකතු කොට ඇඳ මත ඉඳගෙනම මට වැන්දාය.

"සුදූ..."

මම මධූගේද හිස අතගා එහෙමම පහළට ආවෙමි. මඟදී මට හැඬෙන්නට ගියේය.

තරප්පු පෙළ දිගේ පහළට එද්දී පහළ විදුලි සෝපානය අසළ ජයසූරිය මහතා ඉනු මම දැක්කෙමි. මම එහෙමම පාත් වුනෙමි.

ජීවිතය පුදුමය. ඇත්තටම පුදුමය. මම මහ වැස්සේ කොම්පඤ්ඤ වීදිය ටවුමට එමින් සිතුවේ ඒකය.

The Reader's Place
Novel..

මගේ ජීවිතය ඉදිරිපිට නොවිසෙඳනා ප්‍රශ්න රැසක් තිබුණි. සමාධිව... මගේ බිරිඳව... කිසිම දිනයක මට ප්‍රශ්නයක් නොවීය. එහෙත් අද දෛවය ඇයව ප්‍රශ්නයක් කර ඇත. ඇගේ අසනීපය වෙනුවෙන්... අපේ මතු එක්වීම වෙනුවෙන්... අපේ සුන්දර පවුල් ජීවිතය වෙනුවෙනුත් අද මට කළ හැකි කිසිවක් නැත. දෛවය විසින් ඒ සියළු මං අහුරා ඇත. ඒ නිසා ඒ වෙනුවෙන් මට කළ හැකි දෙයක් නැත.

එහෙත්... ජීවිතයේ හැම ප්‍රශ්නයක්ම මගේ දෛවයට බාර දිය හැකිද... මම සිතුවෙමි. දිගටම සිතුවෙමි. රෑ නිදි මරාගෙන සිතුවෙමි.

සමාධි සුව වනතුරු මට මෙසේ අඬමින් වැළපෙමින් හූල්ලමින් සිටිය හැකිද... මා කළ යුතු හොඳම දේ එයද... මෙසේ සිටීමෙන් සමාධි සුව වෙනවාද... මා මෙසේ නාස්ති වෙනවා දකින්නට ඇය ආසද... මෙසේ ජීවිතය නතර කරගෙන සිටීමෙන් මගේ අම්මා තාත්තා අයියා ඉන්දු අක්කා සතුටු වෙනවාද...

සමාධි සුව වී යළි මටම ලැබුණහොත් ඇයට යළි දුකක් නොදී බලාගන්නට මට හැකිද. මා උන්නාටත් වඩා ජීවිතය නාස්ති කරගෙන ඉන්නේ නම් මට කොන්දක් කෙලින් තබාගෙන ගොස් ජසයූරිය මහතාගෙන් සමාධිව ඉල්ලිය හැකිද. සමාධිට යළි දුකක් නොදී බලාගන්නා බවට මට ඒ අම්මාට පොරොන්දුවක් දිය හැකිද. එසේ පොරොන්දුවක් දෙන්නට අද මට ඇයි හයිය කුමක්ද...

මේ ආදී දහසක් ප්‍රශ්න මගේ හදවතේ පොදිකන්නට විය. නැත... මේ යන ආකාරයට ගියහොත් මට උරුම

The Reader's Place Novel..



වන්නේ තව තවත් නොලැබීමම පමණි. සුදේශ් වැනි මස් වැද්දෙක් සමාධිව ගිල දමන්නට එද්දී මා මෙසේ කාමරයකට වී අඬ අඬා වැළපෙමින් නාස්ති විය යුතු නැත.

කළ යුතු හොඳම දේ එය නොවේ. සමාධිත් අපේ පවුල් ජීවිතයත් වෙනුවෙන් මට කළ හැකි එකම දේ දෙවියන් යැදීම පමණි. ඒ වෙනුවෙන් බෝධි පූජා විසි එකක් තබා දේවාල පනහකට හෝ ගොස් මම බාර වෙමි.

දෙවියන්ට සියළු ප්‍රශ්න විසඳිය නොහැක. දෙවියන්ටද කළ හැකි ප්‍රමාණයක් ඇත. ඒ ටික දෙවියන්ට දී ඉතිරි ටික අප කළ යුතුය.

මට දැන් රැකියාවක් නැත. සිංගප්පූරුවේ සිට ආවේ කරමින් උන් රැකියාවද දමාය. යළි සිංගප්පූරුවට එන්නේ නම් රැකියාව යළි ලබාදිය හැකි බව හර්බි අයියා කීවේය. එහෙත් සමාධිව ලංකාවේ තනිකර මට මව්බිම හැර දමා යා නොහැක.

ලංකාවේ නැවත රැකියාවක් හොයා ගැනීම හිතනා තරම් පහසු නැත. මටත් වඩා සුදුසුකම් ඇති තරුණයන් රැකියා පෝළිමේ තැවෙති. යළිත් සමාධිත් සමඟ ජීවිතය ලස්සනට පටන් ගන්නට ලැබේවි යැයි තුනී අපේක්ෂාවක් මා තුළ විය. එහෙත් ගැහැණියෙක්ව රැගෙන ගොස් ඇයව ලස්සනට ජීවත් කිරීමට මට මේ මොහොතේ හැකියාවක් නැත.

මම පාන්දර දෙකට පමණ නැගිට්ටෙමි. මුහුණ සෝදාගෙන පැමිණ මම යළි ඇඳ මත වාඩි උනෙමි. මේ ලෙස ජීවත් වුවහොත් ළඟදීම මගේ ජීවිතයේ විශාල ඛේදවාචකයක් බාරගන්නට මා බලාපොරොත්තුවෙන්

සිටිය යුතුය.

නැත. නිර්වාන් එසේ ලෙහෙසියෙන් පරාජය බාරගන්නට කැමති නැත. මම මගේ ජීවිතයද සමාධිගේ ජීවිතයද අපේ ජීවිත දෙකේ එක්වීමෙන් බිහිවන තවත් අලුත් ජීවිත දෙක තුනකද ජීවිත ගොඩ දැමිය යුතුය.

අද මා ජීවත් වන්නේ මට මාවත් ගොඩ දමා ගත හැකි ලෙස නොවේ. අද මගේ ජීවිතය ඇදගෙන යනු ලබන ජීවිතයකි. මට ආදරය කරන අය අද මගේ ජීවිතේ ඇදගෙන යති. එහෙත් ඔවුන්ට හැමදාම මෙසේ මගේ ජීවිතය ඇදගෙන යා නොහැක. ඔවුන්ට දුක් විඳින්නට වෙනත් දේ ඇත.

අම්මාත් තාත්තාත් ජීවත් වන්නේ තවත් දුක්විඳිය හැකි වයසක නොවේ. ඔවුන් දෙදෙනා ජීවිත කාලය පුරාම දුක් වින්දෝය. ඒ නිසා අද ඔවුන් සැපක් විඳිය යුතුය. එහෙත් ඔවුන්ගේ පොඩි පුතා මේ දක්වා ඔවුන්ට ගින්දරක් මිසක් අබමල් රේණුවක තරම්වත් සැපක් දී නැත.

අයියා මා වෙනුවෙන් සහෝදරයෙක් නොවිඳිනා තරම් දුක් වින්දේය. එහෙත් ඔහුටද රැකිය යුතු දරු පවුලක් ඇත. ඉන්දු අක්කා යහපත් ගතිගුණ ඇති අක්කා කෙනෙක් නිසා ඇය මේ සියල්ල ඉවසයි. වෙන නෑනා කෙනෙකු නම් අයියාට හොඳ දෙකක් කතා කර අවසානය. ඔහුටද දරුවන් ඇත. ඔවුන් ජීවත් වන්නේද අමාරුවෙනි.

මධූත් සුභාෂුත් ඔවුන්ගේ ජීවිතයේ ලස්සනම දවස් අපි වෙනුවෙන් කැප කර දුක් විඳිති. මධූ සමාධිත් සමඟ රෝහලේය. සුභාෂ් මාත් සමඟ පන්සල් ගානේ යන්නට



එයි. අද වැනි කෘෘර සමාජයක ඔවුන් වැනි මිතුරන් ඇත්තටම හිඟය.

මේ සියල්ලන්ටම මා වෙනුවෙන් හැමදාම දුක් විඳිය නොහැක. ජීවිතයේ අපමණ දුක් ඇති බව සැබෑය. එහෙත් තවමත් මගේ අතපය හොඳට ඇත. මටද යමක් කළ හැක. එසේ වී තිබියදී මා දුක් සංසාරයක පැටලී මට ආදරය කරන අයටද දුක් දෙමින් මා ඉන්නා මේ තත්වයේ තේරුමක් නැත.

ජීවිතය යළි පටන් ගන්නට නම් මට ජීවත් වන්නට කියා දුන් සඳ දෙව්දුව මට යළි ලැබිය යුතුය. එහෙත් ජීවිතය පටන් ගන්නට මා සූදානම් විය යුතුය. ඒ සඳහා මට නැති නාස්ති නොවී සිටිය යුතුය.

කුමක් කළ යුතු දැයි මම දහ අතේ සිතුවෙමි.

යළිත් රැකියාවක් කරන්නට මගේ හිතේ ආශාවක් නොවීය. මගේ ජීවිතයේ පවත්නා ප්‍රශ්න වලට හැටියට යළිත් රැකියාවක් කරන්නට තරම් මානසිකත්වයක් මට නැත.

පුංචියට මගේම ව්‍යාපාරයක් කිරීමේ ආශාව හැමදාම මා තුළ විය. සමාධිත් සමඟ අනුරාධපුරයට යද්දී මා උන්නේ එවැනි කුඩා ව්‍යාපාරයක් කරන්නටය. අප දෙදෙනාට ආ ප්‍රශ්න නිසා අපට සිංගප්පූරුවට පැන යන්නට සිදුවිය.

එදාට වඩා අද මම ශක්තිමත් යැයි මට සිතෙයි. බොහෝ මිනිසුන්ට නොලැබෙන වාසනාවන්ත ලැබීම් මට ඇති බව මම දනිමි. හොඳම උදාහරණය සමාධිය. මම තරමක් හෝ උසස් වී ඉන්නවා දකින්නට සමාධි

The Reader's Place Novel..

ආශා කළාය.

"මං වාහන වල ඕනතරම් ගිහිල්ලා තියෙනවා... රුපියල් ලක්ෂ පනහේ ජීප් වල ගිහින් තියෙනවා... ඒත් කවදාහරි මං සතුටු වෙන්නේ ඔයාගේ මේ අත් දෙකෙන් හම්බ කරලා ගන්නා පුංචි බයිසිකලයක හරි බඩල් අලා යන්න දවසට... මේ ඇත්තමයි මහත්තයෝ..."

සමාධි කීවේ එහෙමය.

ඒ අරමුණ... ඒ සිහින වෙනුවෙන් මට අද කැප වෙන්නට බැරි ඇයි. ඇතිවන්නට හෝ නැතිවන්නට කෙටි විරාමයක් දෙවියන් මට දී ඇත.

ඒ කාලය මෙසේ නිකරුනේ නාස්ති කරන්නේ ඇයි... මම අපේ ජීවිතය වෙනුවෙන් මහන්සි වී වැඩ කරන බව දැනගතහොත් සමාධිද යළි පිපෙනු ඇත.

"මෙන්න මං මගේ අත් දෙක සුදු මහත්තයාගේ අත් දෙක උඩින් තිබ්බා... අද ඉඳලා මේ අත් දෙකේ හයියත් ඔයාට එන්න ඕන... මෙන්න මම මගේ කකුල් දෙක ඔයාගේ කකුල් දෙක උඩින් තිබ්බා... අද ඉඳලා මගේ කකුල් දෙකේ හයියත් සුදූට එන්න ඕන... ඔයා මගේ යුනිකෝ... මගේ ස්ටැලෝන්... මගේ රත්තරන් ස්පයිඩර් මෑන්... තේරුණාද... හොඳ සුපර් මෑන්... ඔයාට වඩා වීරයෙක් මට මගේ ජීවිතේ නැහැ... තේරුණාද මහත්තයට..."

ජීවිතය පටන් ගත් කාලයේ උදෑසනක සමාධි මට එසේ කීවාය. මට ඒ වචන මතකය.

ඇගේ ජීවිතයේ ස්ටැලෝන් මෙසේ අඩා වැටිය යුතු නැත. ඇය අදහන සුපර් මෑන් මෙසේ කාමරයකට වී



දහඅතේ දුක් විඳින බව ඇය දැනගතහොත් ඇගේ වීරයා මැරිලා යැයි ඇය සිතනු ඇත.

නැත... ස්ටැලෝන් අවසාන ගේමට සූදානම් විය යුතුය. කාටත් නොව මාව අදහන ඇය වෙනුවෙන් මේ ජීවිතයේ එක වීරකමක් හෝ කළ යුතුය.

මට මේ ජීවිතයේ කළ හැකි එකම වීරකම ඇය වෙනුවෙන් ඇගේ අනාගත ජීවිතය ලස්සනට සාදා තිබීමය. සියල්ල හැර දමා මා කරා එන ඇයට ලස්සන සුරංගනා ලෝකයක් හදා තිබීමය. ඇගේ කුසින් දිනයක බිහිවන දරු පැටවුන්ට ලස්සන ලෝකයක් හදා තිබීමය.

මිනිහෙකුට මේ ජීවිතයේ කළ හැකි ලොකුම වීරකම එයයි...

ඒ වීරකම මා කළ යුතුය. දෛවය පවා අපට බිය වන්නේ එවිටය. නැතහොත් සිදුවන්නේ දෛවයේ ගොරහැඩි ඇති දෛවයට යටවී විනාශ වන්නටය.

ජීවිතය වෙනුවෙන් අලුතින්ම යමක් හිතන්නට මම සඳුදා පාන්දරම ඇහැරී උන්නෙමි. හිතට එකවර යමක් නොවැටහෙන බව සැබෑය. එහෙත් යමක් කරන්නට මගේ හදවතට අලුත් ශක්තියක් එයි.

වැඩිපුර වටින්නේ ඒ ශක්තියය. ඒ උනන්දුවය.

තව එකම එක වරක් සමාධිගේ මූණ බලා ඇගේ නළලතේ මේ අත තබා දිව්රා මම කියමි. ඇය සනීප වී එන විට අපගේ නව ලෝකය ලස්සනට ගොඩ නගන්නට හැකි තරමට මම නැගිටින බව මම කියමි.

ජීවිතය ගැන තරකටම සිතිය යුතු නැත. හැම

The Reader's Place Novel..

ගංවතුරකටම ගම් බිම් යටවන්නේ නැත. ගම්බිම් යට වුවද ගම් බිම් ගසාගෙන යන්නේ නැත. බැස යන්නේ ගංවතුරය.

ජීවිතයේ කරදරද වේදනාද කඳුළුද ගංවතුර මෙන් නැගී ජීවිතය යට කරගෙන පපුව බැසයයි.

ඊට එරෙහිව අප කෙලින් සිටිය යුතුය.

හිමින් සැරේ කුස්සියට ගොස් මම කෝපි එකක් හදාගෙන යළි සාලයට ආවෙමි.

"අඩියක් පස්සට අඩි දෙකක් ඉදිරියට..." පාසැලේදී කැඩෙට් කරද්දී නවරත්න සර් අපට ඉගැන්වූ අර්නස්ටෝ චේ ගුවේරාගේ ගරිල්ලා සටන් පාඨය මට සිහිවිය.

මම අඩියක් පස්සට ගත්තෙමි. දැන් පැමිණ ඇත්තේ අඩි දෙකක් ඉදිරියට තැබිය යුතු මොහොතයි...

මම මහා පාන්දරම ඇඳගත්තෙමි. ඒ වෙද්දී වේලාව පාන්දර හතරය. මේ වෙලාවේ රෝහලට ගියහොත් සමාධිව බලා ගැනීම අපහසු නොවනු ඇත.

"කරදර ගොඩක් පටලගන්න එපා පුතේ..."

අම්මා මා ඇඳගනිද්දී කීවාය.

"කරදර පටලගන්න නෙමේ අම්මේ... අම්මගේ පුතා හදන්නේ මේ කරදර වලින් ගොඩ ' එන්න... බය වෙන්නෙපා... මං නාස්ති වෙන්නෑ..."

"ඔයා නාස්ති වෙන්නෑ කියලා දන්නවා පුතේ..."

මම අම්මාගේ දෙඋරහිස් මත දෑත තැබුවෙමි.

"අම්මා වෙනුවෙන් අයියා වෙනුවෙන් තාත්තා වෙනුවෙන් මගේ ගෑණි වෙනුවෙන් මං ජීවත් වෙනවා අම්මේ... මං මට පුළුවන් විදිහට නැගිටිනවා..."



මම කීවෙමි. බලාපොරොත්තු නොවූ ලෙස මගේ දෑස් තෙත්විය.

"හිත හදා ගන්න ටිකක් අ..මා..රු..යි තමා පු..තේ... ඒ..ත් බලන්න..."

"අමාරුයි තමා අම්මේ... ඒත් මොනා කරන්නද... එයා කවදාහරි එයිනේ..."

"ඔයාට කවදාවත් ඒ දරුවව නැති වෙන්නෑ... නැති කළොත් මිසක්..."

අම්මා කියන්නේ ඇත්තය. සමාධිව මට නැති කළහොත් මිසක කිසිම දිනයක ඇයව මට අහිමි නොවේ.

"මං එකම එකපාරක් එයාව බලලා එනවා... සමහර විට ආයේ කවදාවත් මං එයාව ඊට පස්සේ බලන්න යන්නේ නැතිවෙයි අම්මේ..."

"පරිස්සමින් පුතේ..."

මා පාරට බසින විටත් පාන්දර අඳුර එහෙමම තිබුණි. එකසිය තිස් අට බසයක නැගී මම නවලෝක රෝහල වෙත ගියෙමි. යන මඟ අතරතුර මට බොහෝ දේ සිහිවිය.

අප උන් හැටියට අපට මෙහෙම වෙන් වන්නට වූ එකත් පුදුමය. එහෙත් දෙවියන්ටවත් වෙන් කරන්නට බැරි දෙදෙනෙක්ව දෙවියන්ගේ මල්ලී කියනා සල්ලි වලට වෙන් කළ හැකිය. ලෝකයා එහෙමය.

නවලෝක රෝහල අසළින් බැස මම මධූට කතා කළෙමි. පාන්දර නිසා අවට පරිසරය නිසංසලය. ශාන්තය.

මගේ අවාසනාවට මධූගේ දුරකතනය වසා තිබුණි. මධූත් සමාධිත් තවම නිදි වන්නට ඇත. නවලෝක

The Reader's Place Novel..

රෝහලේ දොරකඩට වී මම මොහොතක් කල්පනා කළෙමි.

සමාධිගේ මුහුණ බලන්නට සමහර විට අදින් පසු මට කිසිම දිනයක බැරි වන්නට පුළුවන්. දැඩි අධිෂ්ඨානයකින් මම විදුලි සෝපානයට යන බොත්තම එබුවෙමි.

පාන්දර නිසා වාට්ටුව බාරව උන්නේ හෙදියන් දෙදෙනෙකු පමණි. මම බියෙන් මෙන් ඔවුන් දෙදෙනා දෙස බලා සිනාසුනෙමි. ඔවුන් මාව නවත්වාවි යැයි මා සිතුවද ඔවුන් මා නැවැත්වූයේ නැත.

සමාධි ඉන්නා කාමරයේ දොර වසා තිබුණි. එය විවර කරන්නට පෙර මොහොතක් මම බලා උන්නෙමි.

The Reader's Place
Novel..

ආදරයට අධිපති හැම දෙවියෙකුටම මාව බලාගන්නටයැයි කියා මම දොරට තට්ටු කළෙමි.

දොර විවර වූයේ නැත.

දෙවන වරටද මම තට්ටු කළෙමි.

දොර විවර විය.

දොර ඇරියේ මධුය. මගේ ළයට හුස්මක් වැටුනේ ඉන් පසුය.

“දෙයියනේ අයියේ... එන්න ඇතුළට...”

“අනේ මට සමාවෙන්න නංගී... මං.. මං ආයෙත් එන්නෑ...”

මම බොඳවී ගිය දෑස් පොඩි කර කීවෙමි.

“අඬන්නෙපා අයියේ... මටත් ටිකක් නින්ද ගියා... ඊයේ රෑ වෙනකල් කෙල්ලත් එක්ක ඇහැරිලා හිටියා... වෙස්ට් ගොඩක් ගත්තනේ...”



සමාධි උන්නේ සුව නින්දකය. ඇගේ මුහුණ වෙනදාටත් වඩා කෙට්ටු වී ගොසිනි. මම ඇයට නොඇහැරෙන ලෙස ඒ නළලත පිරිමැද්දෙමි.

“පව් මගේ කෙල්ල...”

“ඊයේ රෑත් අයියා ගැන කිය කියා අඬ අඬා නිදාගත්තේ... නිදාගත්ත ගමන් හීනෙන් පේනවලු...”

“මාත් හිත හදාගෙන ඉන්නේ හරි අමාරුවෙන් නංගී...”

“මට තේරෙනවා... කෙල්ලගේ අසනීපේ හිතුවට වඩා දරුණුයි අයියේ...”

“මං දන්නවා නංගී... මං මෙහෙමම කැළණි යනවා බෝධි පූජාවට...”

මම සමාධිගේ පසෙකට වැටී තිබූ අත ගෙන සිප ගත්තෙමි.

“මාත් මෙහෙම ඉඳලා බෑ නංගී... මාත් මොනවා හරි කරන්න ඕන... මම මෙහෙමම නාස්ති වෙලා ගියොත් මේ කෙල්ලව කවදාවත් මට දෙන එකක් නෑ...”

“ඇත්ත... ඔයා අයියේ යමක් කමක් කරන්න බැරි කොල්ලෙක් නෙමේනේ... හිතට හයිය ගන්න... මං සුභාෂ්ටත් කියන්නම් අයියට උදව් කරන්න කියලා...”

“සුභාෂ් කරන උදව් කියලා නිම කරන්න බෑ නංගී... ඔයාට ඉන්නේ හොඳ මහත්තයෙක්...”

මම සිනාසී කීවෙමි.

“මට ඉන්නේ හොඳ මහත්තයෙක් තමා... ඒත් මේ නිදන් ඉන්න කෙල්ලට ඉන්නේ ඊටත් වඩා හොඳ

මහත්තයෙක්..."

"මං ආවේ නංගී මේ කෙල්ලගේ මූණ ටිකක් බලලා හිත හදාගෙන මොනා හරි කරන්න පටන් ගන්න..."

"වෙරි ගුඩ්... අයියා දන්නවද ඒක මේ කෙල්ලට කිව්වොත් ඒකිට ගොඩාක් සතුටු හිතෙයි... අයියා කන්නෑ බොන්නෑ කියලා හරියට හූල්ලනවා..."

"කෑවේ බිව්වේ නෑ තමයි නංගී... ඒත් එහෙම ඉඳලා බෑ... මේ ලෝකේ ඉන්න මිනිස්සු එක්ක හැප්පෙන්න අපට හයියක් තියෙන්න ඕන..."

"ඔව්... ඔයා බයවෙන්නෙපා... මේ කෙල්ල ඔයාට ආශිර්වාද කරනවා... තමන්ගේ ගෑණිගේ ආශිර්වාදේ තරම් මිනිහෙකුට තව කිසිම ආශිර්වාදයක් හරියන්නෑ..."

"මාත් ඒ කතාව අදහනවා නංගී..."

මම අවසන් වතාවටත් සමාධිගේ නළල ඉඹෙමි.

"ඇහැරුවේ නෑ කියලා දැන් මට බණී..."

"ඇහැරවන්නෙපා... පව්... මං ඇවිත් කිස් ගොඩක් දීලා ගියේ කියන්න..."

මම තවත් වරක් සමාධිගේ නළලත අතගා නවලෝක රෝහලෙන් පහළට බැස්සෙමි.

මම පෙරදාටත් වඩා ඕනෑකමකින් ආශාවකින් කැළණි බෝධිය අසළ බෝධි පූජාව තැබුවෙමි. බෝධිය වටා ප්‍රථම වටය යද්දී තිබුණාට වඩා ශක්තියක් මට දෙවන වටය යද්දී හදවතට දැනුණි. ඒ ශක්තිය තුන්වෙනි වටය යද්දී තවත් වැඩි විය. හත්වන වටය යද්දී මේ සියළුම ප්‍රශ්න මට විසඳාගත හැකියි යන අධිෂ්ඨානය මට ඇතිවිය.



ඒ මහා පාන්දර මම කැළණි බෝ මළුවට වී ගාථා සියල්ලම කියා වැන්දෙමි. තව දින තුනක් බෝධි පූජාව තැබිය යුතුය.

කැළණියේ බෝධි පූජාව නිමා වූ පසු දවසක පාන්දරම අනුරාධපුරයට ගොස් ජය ශ්‍රී මහා බෝධියටද පඬුරක් බැඳ සුරමයා ඇන්ටිලාගේ ගෙදරටද ගොස් එන්නට මම සිතාගත්තෙමි.

පන්සලේ සිට පා ගමනින්ම මම තොරණ හන්දියට ආවෙමි. කැළණි බෝ සමිඳු ඉදිරිපිට මම මටම පොරොන්දු වූ ආකාරයට දැන් අද සිට අලුතෙන්ම ජීවිතය ගැන සිතිය යුතුය. ජීවිතයේ ප්‍රබලම ආදරණීයම සන්තකය ලෙඩ ඇඳක සිටියදී ජීවිතය අලුතින්ම පටන් ගැනීම සිතනා තරම් පහසු නැත.

එහෙත් බලාපොරොත්තු වෙනුවෙන් දුක් විඳින්නට මම සිතාගෙන අවසානය. මේ සියල්ල කරන්නේ මටත් සමාධිටත් ලස්සනට ජීවත් වන්නට ලැබේවියැයි සිතාගෙනය. අවසාන බලාපොරොත්තුව එයය.

ඉන් බැහැරව මට ජීවිතයක් නැත. ආත්මයක් නැත.

ඒ නිසා ඒ වෙනුවෙන් වත් මම හිත හදාගෙන ජීවිතයට බැසිය යුතුය. පතුලටම බැසිය යුතුය.

කරන්නේ කුමක්ද...

විශාලම ප්‍රශ්නය එයයි.

විෂ නැසිය යුත්තේ විෂෙන්මය. මේ සමාජයේ ඇති විෂම දේ මුදල්ය. එහි විෂ නැසිය යුත්තේද මුදල් සෙවීමෙන්මය.

The Reader's Place Novel..

මේ සමාජයේ අමාරුම දේ එයයි. මිනිස්සු මුදල් සොයන්නට නොකරන දෙයක් නැත. එහෙත් මට මගේ ආදරයේ නාමයෙන් පව් කළ නොහැක. එවැන්න කර මුදල් සොයන්නට ගොස් මට දෙවියන්ව උදහස් කරගත නොහැක.

මම කැළණියේ තොරණ හන්දියේ වූ හෝටලයකට ගොඩවී හාල්මැස්සන් හොදිත් සමග ඉඳි ආප්ප කෑවෙමි. දෙවන තුන්වන කට කද්දී මට සිරවිය. මම එහෙමම අත සෝදගෙන තේ එකක් පමණක් බීවෙමි.

එකම ආත්මයකට හදවතද ආත්මයද සිතුවිලිද බැඳුනු පසු තනිවම ජීවත් වීම අමාරුය. එය එහෙමමය.

The Reader's Place Novel..

හෙට අනිද්දා දවසක සමාධිට කෑ හැකි දෙයක් බලා අම්මාට කියා හදාගෙන සුභාෂ් අතේවත් ඇයට යැවිය යුතුය. ඇයට වැළඳී තිබූ රෝගය අනුව ඇයට බොහෝ කෑම කෑම හොඳ නැත.

මම තොරණ හන්දියෙන් පිටකොටුව බසයක නැගී පිටුකොටුවට ආවෙමි. ජීවිතයට බලාපොරොත්තුවක් මහමඟ වැටී නැත. එහෙත් මම පිටකොටුවට ගොස් යළිත් එකසිය තිස් අටක නැග්ගෙමි.

මෙසේ රස්තියාදු ගසා තේරුමක් නැත.

ගේට්ටුවෙන් මා ඇතුල් වෙද්දී අම්මාත් ඉන්දු අක්කාත් මිදුලේ උන්නෝය. ඔවුන් උන්නේ පුතාව මිදුලේ තබාගෙන සෝදමිනි. වෙනිවැල්ගැට තැම්බූ වතුරින් පොඩි එකාව සෝදනවා මම ආශාවෙන් බලා උන්නෙමි.

“ඔයාවත් මෙහෙම තමා නෑව්වේ... ඒ දවස්වල හරි දාංගලේ...”



අම්මා පුතාව ආදරයෙන් නාවමින් කීවාය.

“තාමත් එහෙමනේ...”

ඉන්දු අක්කා කීවාය. මම බිම ඇණ තබාගෙන අම්මාගේ අතේ වූ කුඩා කෝප්පය ගෙන පොඩි එකාව නෑව්වෙමි.

“දෙන්න ෂැම්පු එක මං දාන්න...”

පොඩ්ඩාගේ කෙස් ගොඩාක් නැත. එහෙත් මම ෂැම්පු ටිකක් වැඩිපුර ගෙන ආශාවෙන් ඒ සිනිඳු හිසකේ වල ඇතිල්ලුවෙමි.

“බලාගෙන රත්තරන් ඇස්වලට යයි නේද කුක්කු පැටියෝ... මාමි ෂැම්පු දානවා... ආ... ෂෝයි මාමි නේද...”

අම්මා එසේ කියද්දී පොඩි එකා ජක ජක ගා වතුරේ කකුල් ගැසුවේය. පොඩි එකා වතුරට ආසාය.

“බෝධි පූජාව හොඳට තිබ්බද මල්ලී...”

“ඔව් අක්කේ අද හොඳට කෙරුණා... බෝධියත් නාවලා ගාථා ඔක්කොම ටිකත් කිව්වා...”

අම්මාත් ඉන්දු අක්කාත් මුහුණට මුහුණ බලාගෙන සිනාසුනේ වේදනාවෙනි.

“අද මං ඔයා එක්ක යන්න හිටියෙ... මල්ලි පාන්දරම ගිහින්නේ... හෙට අපි දෙන්නා යන්...”

“එන්න අක්කේ... උදේට පන්සල හරිම ශාන්තයි... හරියට දෙව්වරු වැඩලා වගේ...”

ඉන්දු අක්කා මගේ හිස පිරිමැද්දාය.

“ඒ වඩින දෙවියෙක් ඔයා දිහා නොබලා ඉන්න එකක් නෑ...”

"ඔව් අක්කේ... මං දිහා නොබැලුවත් කමක් නෑ... අර දුක් විඳින කෙල්ල දිහා බලනවනම්... මං පාන්දර ගියා බලන්න... ඊ වෙනකල් ටෙස්ට් වගයක් කරලා නිදි... පව්..."

"මල්ලී ඇහැරුණේ නෑ..."

"නෑ අක්කේ... පැය කීයද නිදාගත්තේ..."

"ඒ අහිංසක කෙල්ලට එහෙම අසනීපයක් තියෙනවා කිව්වහමත් හරි පුදුමයි... ඒත් නංගිට සනීප වෙනවා මල්ලී... ඔයා බයවෙන්නෙපා..."

"ඔව්..."

මම එසේ කියාගෙනම කාමරයට ගියෙමි. ඇඳ විට්ටමට කොට්ටයක් තබා මම ඇඳගෙන ආ ඇඳුම් පිටින්ම ඇඳේ ඇලවුනෙමි.

අතේ යහමින් මුදල් ටිකක් තිබ්බානම් කුමක් හෝ පුංචි බිස්නස් එකක් කරන්නට තිබුණි. එහෙත් සිංගප්පූරු ගමනට අතේ තිබූ සියළු මුදල් වැය විය. රැකියාවද මාස දෙකතුනක් වත් කරගන්නට නොලැබුණු නිසා ඉහළ ආදායමක් අතට ආවේ නැත.

අයියා කාමරයට ආවේ ඒ මොහොතේය.

"අයියා අද කඩේට යන්නැ..."

"යනවා මල්ලී... කඩේ වැඩට කොල්ලෙක්ව ගත්තනේ... උදේට මිනිහට මං ටිකක් ඉන්න කියනවා... ඉතින්... මල්ලී උදේ කෙල්ලව බලන්න ගියාද..."

"ඔව්... විනාඩියයි... බැලුවා හැරුණා ආවා..."

"එහෙමවත් බලාගත්තනේ මල්ලී... මොනාද කල්පනා කළේ..."



මම සිනාසුනෙමි. කල්පනා කරන්න කොතරම් නම් දේ තිබෙනවාද...

"මෙහෙම ඉඳලා හරියන්නැ අයියේ... මොනවා හරි කරන්න ඕන..."

අයියා ඇඳමත වාඩිවී හිස වැනුවේය.

"ඒක තමයි මල්ලී මාත් කියන්න හිටියේ... නංගි සනීප උනා කියමු... ආයෙත් උඹට නංගිව ලැබෙනවනේ... ඒකි උඹව දාල යන්නැනේ ජයසූරිය මහත්තයලා කියන එකෙක් එක්ක..."

"කවදාවත් යන්නැ..."

"එහෙනම් උඹ අද ඉඳලා හිතපන් කෙල්ල සනීප උනාට පස්සේ කොහොමද ජීවත් කරවන්නේ කියලා... බේහෙත් වලට ලොකු ගාණක් යනවා... ඒ මදිවට ජීවත් වෙන්න ඕන... පුංචි වාහනයක්වත් ගන්න තියෙනවනම් හොඳයි නේද..."

"ඔව් අයියේ... මට හරි ආසයි පුංචි ගෙයක් හදලා පොඩි වාහනයක් අරන් ලස්සනට එයා එක්ක ජීවත් වෙන්න..."

"ගෙයක් නම් මෙහෙත් තියෙනවනේ මල්ලී... මං ඒක ගන්නැනේ..."

"මං එහෙම හිතල කිව්ව නෙමේ අයියේ... මං කිව්වේ මං ආසයි කියලා..."

"ඔව්... මගෙත් එහෙම ආසාවක් තිබුණා... ඒත් දැන් පොඩි එකත් ඉන්න නිසා මට අමාරුයි... උඹ ඒ හීනේ

The Reader's Place Novel..

දැකපන්... මං උඹට ඕන උදව්වක් කරන්නම්... මොනවද කරන්න හිතන් ඉන්නේ..."

"ඒකම තමා හිතාගන්න බැරි..."

අමාරුම දේ දෙයක් පටන් ගැනීමය. පටන් ගත් පසු ඇදගෙන යාම අමාරු නැත.

"මොනවා කළත් අද තියෙන තත්වේ හැටියට ගොඩ එන්න ටිකක් දුක් විඳින්නම වෙනවා මල්ලී..."

"මට කටු කාලා හොඳට පුරුදුයි අයියේ..."

"ඔව්... උඹට කටු කන්න වයසත් තියෙනවා... මොනව වගේ දේකටද මල්ලී කැමති..."

The Reader's Place

"මොනාහරි දෙයක්... ඉක්මනට මට ගොඩ එන්න ඕන..."

අයියා කල්පනා කළේය.

"මගේ හිතේ කාලෙක ඉඳලා පොඩි අයිඩියා එකක් නම් තිබ්බා මල්ලී... මං හරි ආසාවෙන් හිටියේ ඒක කරන්න... ඒත් දැන් මට අමාරුයි... ඒත් උඹට පුළුවන්... උඹ මොකද මං මොකද..."

"මොකක්ද අයිඩියා එක..."

මම ඇඳ මත ඉඳගෙන උනන්දුවෙන් ඇසුවෙමි.

"පුංචි උන්ගේ ස්කූල් යුනිෆෝම් මහන තැනක් පටන් ගන්න... උඹ දන්නවද මල්ලී මේ පැත්තේ ටේලර් සාප්පු ඕන තරම්... ඒත් පොඩි අයගේ ඇඳුම් මහන්න ගන්න... ඉස්සර ඒවා මහන හුරු අය හිටියා... මහන ගෙවල් තිබ්බා... ඒත් දැන් නෑ... ඒත් ළමයි කොච්චර ඉස්කෝලේ යනවද..."



"අයිඩියා එක නම් මරු... කන්න බොන්න නැති උනත් දරුවන්ගේ ඉස්කෝලේ ඇඳුම් ටිකයි පොත් ටිකයි අම්මලා තාත්තලා අරන් දෙනවනේ..."

"කරනවා නම් උඹට හොඳට කරන්න පුළුවන්... ලස්සනට වැඩේ කළොත් බිස්නස් ගලාගෙන එයි... පොඩි ලීෆ්ලට් එකක් ගහලා ඉස්කෝලවල් වලටත් දෙමු... මේ ඉස්සරහින් පොඩි කැල්ලක් ගහගත්තම මරු... මං ඔය වැඩේ ගැන සැහෙන්න හෙව්වා... කොළඹින් ඕල් සේල් ගාණකට සුදු රෙදි ගන්න පුළුවන්..."

"මැෂිමක් ගත්තා... මැහුවා..."

"ඔව්... පස්සෙ හිමිහිට ගැණු ළමයි දෙතුන් දෙනෙක් දානවා... කටින් කට ප්‍රචාරේ ගියහම වැඩ ඕන තරම් එනවා..."

Novel..

අයියා දුන්නේ කදිම අදහසකි.

"මුලින් ලෝන් ගහන්න ඕනෙත් නෑ නේද අයියේ... මැෂිමයි රෙදි ටිකයි විතරයි..."

"ඔව්... ස්කූල් යුනිෆෝම් මහන්න ලොකු ජුකී මැෂින් ඕන නැහැ... පොඩි මෝටරයක් අපු මැෂිමක් හොඳටම ඇති..."

"මං පටන් ගන්නවා..."

මම ස්ථිර ලෙස කීවෙමි.

මම උදේ වරුව පුරාම නිමි ඇඳුම් අලෙවි කරන සාප්පු කිහිපයකට ගොස් ඒවා වල ඇති පාසල් නිල ඇඳුම් පරීක්ෂා කළෙමි. පාසල් නිල ඇඳුම් අලෙවි කිරීමට තබා තිබුනේ එහෙමත් සාප්පුවකය.

පාසල් නිල ඇඳුම් පමණක් නොව ළමා සාරි ක්‍රීඩා ඇඳුම් ආදී පාසල් දරුවන් සඳහා අවශ්‍ය කරන අනෙක් ඇඳුම්ද ඒවාවල නොතිබිණි.

පහසුවෙන්ම හොඳම තත්වයේ නිල ඇඳුම් මසා ලබාදෙන තැනක් වේනම් එතනට දෙමව්පියන් නිරායාසයෙන්ම එනු ඇත. දහම් පාසල් සහ පාසල්වල විශේෂ පින්කම් අවස්ථා සඳහා අවශ්‍ය වන ළමාසරිද ක්‍රීඩා උත්සව සඳහා අවශ්‍ය වන ක්‍රීඩා ඇඳුම්ද එකම තැනකින් ලබාගතහැකි නම් එය ඉක්මනින්ම පාසැල් දරුවන් අතරද ජනප්‍රිය වෙනු ඇත.

පාසල් නිළ ඇඳුම් සඳහා විශේෂ විලාසිතාවක් නැත. විවිධ ප්‍රමාණයෙන් ඇඳුම් පතරොම් කපාගත් පසු ප්‍රමාණ කිහිපයකට ඇඳුම් සැකසිය හැක.

The Reader's Place Novel..

මම එහෙමම මහරගම පමුණුවේ මහන මැෂින් අලෙවි කරන මැෂින් ටෙක් ආයතනයට ගියෙමි. එහි කුඩා ප්‍රමාණයේ මහන මැෂින් වල සිට විශාල ජුකී මැෂින් ද විය.

"මේ මැෂින් එකක් කීයක් විතර වෙනවද..."

"මේක නෝමල් මැෂින් එක... ටේලරින් වලට මේක තමයි හොඳ... මෝටරයක් හයි කර ගත්තම හොඳයි... පාළොස්දාහකට දෙන්න පුළුවන්..."

"මේක බ්‍රෑන්ඩ් නිව් නෙමේ නේද..."

"නෑ... රිකන්ඩිෂන්... කුරුණෑගල ගාමන්ට් එකකින් ගෙනාපු බඩු... බය නැතුව ගන්න අවුරුද්දක් අපි ගැරන්ටි කරනවා..."

"මේ ඕලොක් එක කීයක් විතර වෙනවද..."



"ඒක දාහතක් විතර වෙනවා... මැෂින් දෙකම අපෙන් ගන්න... අඩු කරලා දෙන්නම්..."

මම සියල්ලම ලියාගෙන ගෙදර ආවෙමි. සුළුවෙන්ම පටන් ගත්තද මේ වැඩේට අඩුම වශයෙන් රුපියල් පනස් දහසක්වත් වැය වන බව මට හැඟුණි. අතේ රුපියල් පනස් දහසක් නොව පන්දහසක් හෝ නැත.

මම කව්ළුවෙන් මිදුල දෙස බැලුවෙමි. අයියා කියූ ලෙස ගෙටම අල්ලා කැල්ලක් ගසාගන්නට මිදුලේ ඉඩ ඇත. බ්ලොක් ගල් දමා හෝ තැනක් හදා ගන්නට රුපියල් දහ පහළොස් දහසක්වත් යයි.

අම්මා හකුරු කෑලි කිහිපයක් සමඟ උණු කිරි තේ එකක් ගෙන ආවාය.

"ඇයි පුතේ ප්‍රශ්නෙකින් වගේ..."

අම්මා ඇසුවේ කරුණාවෙනි.

"ප්‍රශ්නයක් නෑ අම්මේ... නිකං..."

"ඔයාගේ මූණම පරවෙලා වගේ... අයියා කිව්වේ පුතා බිස්නස් එකක් කරන්න යනවා කියලා..."

"එහෙම හිතුව නම් තමා අම්මේ... ඒත් ඒවත් හිතන තරම් ලේසි නෑ..."

"ඇයි පුතේ මොකක්ද කියන්න ප්‍රශ්නේ..."

මම අම්මාට සියල්ල පැහැදුවෙමි.

"ඒ වැඩේ නම් හොඳයි තමා... ගෙදර ඉඳලා කරන එකේ අක්කටයි මටයිත් උදව් කරන්න පුළුවන්..."

"ඒ වගේ බිස්නස් එකක් පටන් ගන්න ලේසියි අම්මේ... ඒත් පොඩි පරහක් තියෙනවා..."

"පුතා කියන්නකෝ..."

"ඒක පටන් ගන්නවානම් අඩුම තරමේ නෝමල් මැෂිමකුයි ඕලොක් මැෂිමකුයි ඕනේ... ඉස්සරහින් පුංචියට කැල්ලක් ගහගන්නත් ඕන..."

"පුතා හිතන විදිහට කීයක් විතර යයිද..."

"පනස් දාහක් වත් යයි... සුදු රෙදි නූල් එහෙමත් ටික ටික හරි ගන්න ඕනනේ..."

අම්මා කල්පනා කරන්නට වූවාය. මා නිසා ඇය හැමදාම මෙසේ ගින්දර ඉහිලුවාය.

"අම්මා ඕක හිතන්නෙපා... මං හිතන් ඉන්නේ හිමිහිට ජොබ් එකක් හොයාගන්න..."

"එපා... ඔයා ආයේමත් රස්සා කරන්න යන්නෙපා..."

අම්මා තදින්ම කීවාය. රැකියාවකට යාම සඳහා මගේ හිතේද කැමැත්තක් නැත.

"පුතා ඔය වැඩේ පටන් ගන්න... මං පුතාට සල්ලි ටික හොයලා දෙන්නම්..."

අම්මා අත සල්ලි නැති බව මම දනිමි.

"අම්මා අතේ සල්ලි නැනේ අම්මේ..."

"මං කිව්වනේ මහත්තයෝ මං සල්ලි ටික හොයලා දෙනවා කියලා... පුතා පටන් ගන්න... මේ වෙලාව තමයි ඔය වැඩේ පටන් ගන්න හොඳම වෙලාව..."

"ඔව් අම්මේ... අම්මා ණය වෙන්නද යන්නේ..."

"පොඩි පුතා ඒ ගැන හිතන්නෙපා... දෙයියන්ගේ පිහිටෙන් ඔය වැඩේ හරියනවා කියලා හිතාගන්නකෝ... එතකොට ණය උනත් කමක් නැනේ... අපි හිමිහිට ගෙවලා

The Reader's Place Novel..



අමු..."

"පොළියටද..."

"නෑ... මට ඒක කරන්න පුළුවන්..."

"එහෙනම් අම්මේ හෙටම මැෂින් දෙක ගෙනාව නම් සාලේ තියාගෙන හරි පටන් ගන්න පුළුවන්..."

"මං හෙටම පුතාට සල්ලි ටික ගෙනත් දෙන්නම්... පුතේ මැෂින් ගන්නකොට බලලා ගන්න ඕන..."

"හරි අම්මේ... අම්මා බයවෙන්නෙපා... මං ඒක හරියටම කරන්නම්..."

හිතට තුනී සතුටක් දැනුණි. ජීවිතය කොතනින් හෝ පටන් ගන්නට ලැබීම සතුටකි. මේ සියල්ල කරන්නේ අපේ අනාගතය වෙනුවෙනි.

අරමුණු පිවිතුරු වූ කල සටනක් පරාජය නොවන බව මම දැන උන්නෙමි. මේ සටන කෙසේ හෝ ජයගෙන මිසක පස්ස නොබලමි යැයි මම දැඩිව සිතාගත්තෙමි.

බිස්නස් එක පටන් ගැනීමට අම්මා මට මුදල් සොයා දුන්නේ ගෙදර තිබූ සියළු රත්තරන් බඩු බැංකුවට තබාය. සිකුරාදා උදයේ බැංකුවට ගොස් රත්තරන් බඩු ටික තබා අම්මා රුපියල් පනස් දහසක් මා අත ගෙනවිත් තැබුවාය.

"බඩුටික තියලා ගන්න පුළුවන් උපරිම ගාණ ගත්තා පුතේ... ඔයාට බිස්නස් එක පටන් ගන්න කියලා කිව්වහම අර කෙල්ලත් කරේ තිබ්බ චේන් එක ගලවලා මට දුන්නා..."

ඉන්දු අක්කා එහෙමය.

"අක්කගේ කර පාළුයිනේ අම්මේ..."

විවාහක ගැහැණියකගේ කර පාළුවට තිබීම හොඳ නැත.

"මාත් කිව්වා... කෙල්ල ඇහුවේ නෑ... අපි හිමිහිට බේරලා දෙමු..."

මේ ව්‍යාපාරය කර ලැබෙන ප්‍රථම මුදලෙන්ම ඇගේ මාලය බේරා දෙනවා යැයි කියා මම සිතාගත්තෙමි.

"මං අදම ගිහින් මැෂින් දෙක ගන්නම් අම්මේ..."

"මැෂින් ගන්නකොට හොඳට බලල ගන්න ඕන පුතේ... ලෙඩ දෙන්න ගත්තොත් අමාරුයි..."

"නෑ අම්මේ... ගාමන්ට් එකක මැෂින් ගැන දන්න මගේ යාළුවෙක් ඉන්නවා... මං එයාව එක්කගෙන යන්නේ... අද මැෂින් එක ගෙනත් හෙට උදේම පිටකොටු යනවා රෙදි ගේන්න... මට මහන්න දන්න පිරිමි ළමයෙකුත් හම්බ උනා... ගාමන්ට් එකක ෂර්ට් මහපු ළමයෙක්... මුලින් ලොකු පඩියක් බලාපොරොත්තු වෙන්නෙත් නෑ... ගාල්ලේ කොල්ලෙක්... මං එයාව මගේ කාමරේම නවත්ත ගන්නවා... කෑම ටික දුන්නාම ඇති... බිස්නස් බලලා පඩියක් දෙනවා... මං කටර්... එයා ඔපරේටර්..."

අම්මා සිනාසුනාය.

"මං අද රෑට හොස්පිට්ල් එකට ගිහින් එයාවත් ටිකක් බලලම එනවා අම්මේ... එයාට නොකියා මේක පටන් ගන්න මට හිතෙන්නෑ... ඊයෙත් ටිකක් අමාරු වෙලා... හරියට ඇඬුවලු..."

"කෙල්ලට හරියට අපල ඇති... බලලා තව බෝධි පූජාවක් වත් තියමු..."



"ඔව් අම්මේ... මං ඉන්නේ හවසක කන්දේ විහාරයට යන්න.."

"ඔව් ඒකත් හොඳයි... මාත් එන්නම් පුතේ..."

ජීවිතය දුකකැයි සිතා අඬ අඬා සිටිනවාට වඩා ජීවිතය කෙසේ හෝ දරාගැනීමට සිතීමෙන් හදවතට අලුත් පණක් ලැබෙයි. ඒ ගන්නා පණ එලෙසම රඳවා ගැනීම ඇත්තටම අමාරුය. සමාධි ගැන සිහිවෙද්දී අප ගතකළ ජීවිතය ගැන සිහිවෙද්දී පපුව එහෙමම කඩා වැටෙයි. ජීවිතයේ වසන්තය නිමා වූ බවක් පපුවට දැනෙයි.

එහෙත් දෙවියන් ඒ තරම්ම අකාරුණික වෙන එකක් නැතැයි සිතා යළිත් මම හිත හදා ගතිමි.

මම උදෙන්ම ඇඳගෙන මැෂින් මිළදී ගැනීම සඳහා පිටත් වූයෙමි. අම්මා කණකර උකස් කර දුන් මුදල් ටික මම පරිස්සමින් ඉදිරිපස කලිසම් සාක්කුවේ දමා ගත්තෙමි.

ජීවිතය ජය ගන්නට හෝ ඇණ ගන්නට ඇත්තේ මේ මුදල් ටික පමණි. එහෙත් මට බියක් නොදැනුණි. දෙවියන් මට බොහෝ දේ අහිමි කළ බව ඇත්තය. එහෙත් තවමත් මම දෙවියන්ව විශ්වාස කරමි. ඒ විශ්වාසයේ බලයෙන් වත් මට හරියා යුතුය.

ජයනාත් මගේ පාසැල් මිතුරෙකි. ඔහු දැන් මැෂින් කාර්මිකයෙකු ලෙස මහරගම හීනටිගල ගාමන්ට් හි සේවය කරයි. ඊයේ මම ගොස් ඔහුව හමුවූයෙමි.

මම මගේ අතීත විස්තර කිසිවක් ජයනාත්ට නොකීවෙමි. ඒවා කියූ කල තව ප්‍රශ්න රැසකට පිළිතුරු දිය යුතුය. මා බැන්ඳා යැයි කිවහොත් වයිෆ් කෝ කියා ඔහු ගත් කටටම අසනු ඇත.

The Reader's Place Novel..

ජීවිතයට මෙලෙස සිදු වූ විට ආගිය අතක් නැති කෙනෙක් ගාණය. අපල කාලයේ විෂ්ණු දෙවියනුත් බටකොළ කෑවා නොවේදැයි සිතා මම සිත හදාගත්තෙමි.

"මං හාෆ් ඩේ එකක්ම දැම්මා... මං දන්න තැන් දෙක තුනක් තියෙනවා... ගාණකට සෙට් වෙන තැනකින් ගමු..."

ජයනාත් මහරගම හන්දියට පැමිණ කීවේය.

"මචං මට ලෙඩ දෙන්නැති මැෂින් දෙකක් බලලා අරන් දීපන්... ලෙඩ දුන්නොත් මං කපෝති... අම්මා සල්ලි ටික හොයලා දුන්නේ රත්තරන් බඩු ටික බැංකුවට තියලා..."

The Reader's Place Novel..

"උඹ බයවෙන්නෙපා... බිස්නස් කරනකොට අවධානමක් ගන්න ඕන... මැෂිමක් කැඩුණොත් මං ඉන්නවා... එක නයිට් එකෙන් මං උඹට මැෂිම ගොඩ දාලා දෙන්නම්... මැෂින් කියන ඒවා කැඩෙනවා... ගාමන්ට් එකේ මැෂින් හාරසිය ගාණක් තියෙනවා... එක නයිට් ෂිෆ්ට් එකට කොහොමත් මැෂින් දහයක් පහළොවක් කැඩෙනවා... ඒත් අපි පැයෙන් හදනවා..."

"උඹ හිටපු එක ලොකු දෙයක්..."

"ගාමන්ට් ෆීල්ඩ් එකට උඹ බය නැතුව බැහැපන්... මේකට බැහැපු උන් මාසයක් දෙකක් යද්දී ඩොල්ෆින් එකක් උස්සනවා... උඹ පළවෙනි පාර පෙටා වලින් රෙදි ගණින්... පස්සේ මං උඹට අඩු ගාණට ගාමන්ට් එකකින් රෙදි අරන් දෙන්නම්..."

"ලොකු දෙයක් ජයා..."

"උඹ කරන්නේ ස්කූල් ෂර්ට් නේ... ඒවට ඕන කරන



කොලර් ස්ටිෆ් බටන් ලේබල් එහෙම එකපාර ටිකක් ගනින්... එතකොට ලාබයි..."

"ඔව්... මං හිතන් ඉන්නේ එහෙම තමයි..."

"මං උඹට පිට පළාත්වල සේල්ස් කරන කෙනෙක්වත් මුණගස්සන්නම්... මිනිහත් එතකොට බඩු අරන් යයි..."

දෙයියන්ගේ පිහිටෙන් මේ ව්‍යාපාරය සාර්ථක වේ යැයි තුනී සතුටක් මට ඇතිවිය. ඒ සතුටෙන්ම ව්‍යාපාරය පටන් ගත යුතුය. සාමාන්‍යයෙන් මට දුක් විඳීම ප්‍රශ්නයක් නොවේ. අවශ්‍යතාවයක් ඒ නම් එක දිගටම රෑවල් දහයක් පහළොවක් හෝ පැයක් වත් නිදා නොගෙන මට වැඩ කළ හැක.

* * * * * * * * *

ජුකී මහත මැෂිමත් කුඩා ඕලොක් මැෂිමත් ගෙනාවේ හවසය. මැෂින් දෙක සාලය මැද තබා මම එය වටේ කැරකි කැරකී එය පිරිමැද්දෙමි. මේ කුඩා මැෂින් දෙක උඩ දහදිය බාල්දි ගණන් හෙළා හෝ ජීවිතය ජය ගනිමි යැයි මම මැෂින් දෙක මත දෑත් තබාගෙනම අධිෂ්ඨාන කරගත්තෙමි.

"කිව්වට මං හිතුවේ නෑ මල්ලී වැඩේට බහියි කියලා..."

හවස ගෙදර ආ අයියා මැෂින් දෙක බලා කීවේ සතුටිනි.

"මේ වැඩේ හරියනවමයි කියලා මට හිතෙනවා

අයියේ..."

"ඒකේ අහන්න දෙයක් නෑ මල්ලී... බයවෙන්නෙපා උඹ හොඳ ගාමන්ට් අයිතිකාරයෙක් වෙලා තමයි පස්ස බලන්නේ..."

මේ ආශිර්වාදය මට කළේ මගේම අයියාය. ඔහුගේ හදවත තුළ අනන්ත වූ සහෝදර ප්‍රේමයක් මා වෙනුවෙන් ඇත. ඒ නිසා මට ඒ ආශිර්වාදය දේව ආශිර්වාදයකි.

"නංගිට කිව්වද මල්ලී මෙහෙම වැඩක් පටන් ගන්නවා කියලා..."

"තව නෑ අයියේ... අද රෑ කියනවා..."

"පව් කෙල්ලගේ මූණ දකින්නත් ආසයි..."

ඉන්දු අක්කා කීවාය.

"එයාගේ මූණ දකිනකොට හරි දුකයි අක්කේ... කෙට්ටු වෙලා ගිහින්... පව්... මං හැමදාම බලලා නවලෝකෙන් බැහැලා එන්නේ අඬ අඬා..."

"හැම දෙයක්ම වගේ ඒකත් හරියයි මල්ලී..."

"ඔව්... මටත් එහෙම හිතෙනවා..."

මම ඉන්දු අක්කා අතින් පුතාව රැගෙන මැෂිම උඩ තැබුවෙමි. පොඩි එකා ආශාවෙන් අත් ගැසුවේය.

"චූටි පැටියා... මාමී එක්ක මහන්න එන්න ඕනේ... හොඳේ... හැබැයි චූ දාන්න බෑ..."

මම මැෂිම උඩ පොඩි එකාව තබාගෙන ඔහුට කිචි කැව්වෙමි. පොඩි එකා කෑ ගසමින් සිනාසුනේය.

අන්තිම දවස්වල සමාධි උන්නේ අපේ දරු පැටියෙකු නලවන්නට ආශාවෙනි.



අපේ ඒ සුන්දර සිහින කවදා නම් සැබෑ වෙයිද...

"ආ මල්ලී... මෙතන තියෙනවා රුපියල් පන්දාහක්... මට මීට වඩා දෙන්න විදිහක් නෑ... රෙදි ගන්න ඒකත් තියාගන්න..."

අයියා කවරයක් මා අත තැබුවේය. මගේ දෑස් කඳුළින් පිරී ගියේය.

"අ..නේ අයියේ... අක්කා මාලෙත් උකස් තියන්න දීලා... අ..යි..ය..ටත් අමාරුයිනේ..."

"හරි අපි ඔක්කොටම අමාරුයි තමයි... ඒත් මල්ලියේ අපි ඔක්කොම ගොඩ එන්න ඕනනේ... උඹට හරිගියොත් උඹ කවදාහරි මගේ කොල්ලට නොසළකා ඉන්නවද... නැනේ..."

මගේ කඳුළු බිම වැටිණ. මම එහෙමම අතේ උන් පොඩි එකා තුරුල් කර ගත්තෙමි.

මධූ මට කතා කළේ හදිස්සියේය.

"නිර්වාන් අ..යියේ.. හදිස්සියේ ගන්නේ..."

මම ඇතුළතින් දැවී ගියෙමි.

"කි..ය..න්..න නංගී... ඇයි හදිස්සියේ... කරදරයක්ද..."

මධූ ටික වේලාවක් යන තුරු කතා කළේ නැත. මගේ පපුවේ හුස්ම තවත් වැඩි විය.

"අ..නේ නංගී ඇයි මේ... කෙල්ලට අමාරුද..."

මම ගැහෙමින් මෙන් ඇසුවෙමි.

"උදේ ටිකක් අමාරු උනා අයියේ... ත..ව ටිකකින් කෙල්ලව ඇපලෝ එකට අරන් යනවා..."

The Reader's Place Novel.

නවලෝක රෝහලෙන් ඇපලෝ රෝහලට සමාධිව රැගෙන යන්නේ ඇගේ තත්වය බරපතල නිසාය. මගේ දෑස් බොඳවී ඇතුළතින් පපුව හිරවෙන්නාක් වැනි හැඟීමක් මට ඇතිවිය.

"ඇ..ප..ලෝ එකට..."

"ඔව්... ඉන්දියන් හාට් ස්පෙෂලිස්ට් කෙනෙක් කෙල්ලට ට්‍රීට් කරන්නේ..."

"ගොඩාක් අමාරුද..."

"බයවෙන්නෙපා අයියේ... ඒත් කෙල්ලට සිහිය නෑ... පුළුවන් තරම් දෙවියන්ගෙන් ඉල්ලන්න කෙල්ලව සනීප කරලා දෙන්න කියලා... ඒ ඇරෙන්න වෙන ක්‍රමයක් නෑ..."

"ම..ට බලන්න අමාරු වෙයිද..."

"ඔව්... කට්ටිය දැනුත් හොස්පිට්ල් එකේ... මං මේ ටොයිලට් එකට ඇවිත් කතා කරන්නේ... මං පස්සෙ විස්තර කියන්නම්... හවස් වෙද්දී කෙල්ල ඉන්නේ ඇපලෝ එකේ..."

"නංගී බබා ගාවම ඉන්නවා නේද..."

"ඔව්... මට ආලා යන්න බෑ..."

මේ සියල්ලම පලක් ඇති දේවල් නොවේයැයි මට සිතුණි. යළි ජීවිතය පටන් ගන්නට සිතුවේ කොතරම් ආශාවකින්ද... දෙවියන් එක් මඟක් පෙන්වද්දී තවත් මඟක් අහුරවාලයි...

සමාධිගේ රෝගය බරපතල බව මම දැන උන්නෙමි. ඒ බව කීවේ සිංගප්පූරුවේ දියුණුම රෝහලක විශේෂඥ වෛද්‍යවරයෙකි.



සිහි නැති වන්නේ රෝගය උත්සන්න වූ විටය. මට සමාධිව බලන්නට නොහැකි වුවද ඇයව ඇපලෝ රෝහලට මාරු කිරීම ගැන මම සැනසුනෙමි. සියළුම පෞද්ගලික රෝහල් වලට වඩා දියුණු පහසුකම් එහි ඇත.

යළිත් මා ඝන අන්ධකාර ලොවක තනිවිය. මගේ දෛවය මට නැගිටින්නට දෙන්නේම නැත. මේ සියළු ප්‍රශ්න මැද මම අමාරුවෙන් ව්‍යාපාරයක් කරන්නට හිත හදාගත්තෙමි. එහෙත් කුමක් කරන්නත් සැනසීමක් තිබිය යුතුය.

මධූ කීවා හරිය. දැන් ඉතිරිව ඇත්තේ දෙවියන්ට කීම පමණි.

The Reader's Place Novel..

පාසල් නිළ ඇඳුම් මැසීම සඳහා ගෙන ආ අලුත් සුදු රෙදි පැත්තකය. අලුතින් ගෙනා මැෂිම තවත් පැත්තකය. ඒ සියල්ල දෙස මම සැහෙන වේලාවක් පමණ බලා උන්නෙමි. මේ සියල්ල පටන් ගන්නට මා උන්නේ කොතරම් ආශාවකින්ද...

"ඇයි පුතේ..."

අම්මා පැමිණ ඇසුවේ මගේ හිසද පිරිමැදය.

"බබාට අමාරු වෙලා අම්මේ... සිහියත් නැලු... දැන් ඇපලෝ එකට මාරු කරනවලු..."

ඒ පණිවිඩය අසත්ම අම්මාගේ පවා දෑස් තෙත් විය.

"මොන දුකක්ද ඒ දරුවා විඳින්නේ..."

"මට ළඟින් ඉන්නවත් තිබ්බ නම් කමක් නෑ... ඒත් මෙහෙම..."

"මට තේරෙනවා... අපට දරුවව බලන්න

දෙන්නෑනේ පොඩි පුතේ... මොනා කරන්නද..."

"අම්මේ..."

මම දැඩි බියකින් අම්මා දෙස බලා කතා කළෙමි.

"පොඩි පුතේ..."

"බබා මැරෙයිද අම්මේ..."

මට හැඬුම් ආවේ ඉබේටමය. කොහොමටත් මට දැඩි පිරිමි හිතක් නැත. අම්මා එහෙමම මගේ හිස ඇගේ වතට තබාගත්තාය.

"එ..හෙ..ම වෙන්නෑ පු..තේ.. පිස්සුද... මේ තරුණ වයසෙන් කෙල්ලෙක් මැරෙනවද..."

"ම..ට බයයි අම්මේ... එයාට තියෙන්නේ හරිම කලාතුරකින් හැදෙන භයානක පපුවේ රෝගයක්..."

"ඇපලෝ එකටනේ පුතේ අරන් යන්නේ... ඒක ඉන්දියන් හොස්පිටල් එකක්නේ... බයවෙන්නෙපා... දරුවට සනීප වෙයි..."

අම්මා කීවේද හඬමිනි.

"එයාට අමාරු වෙලාවේ මට එයා ළඟ ඉන්න බැරි වෙනවනේ... මං දන්නවා... ඒ අමාරුව හැදුනාම මොනවත් කරගන්න එයාට බෑ... ටොයිලට් එකටත් එක්කං යන්න ඕන..."

"මට තේරෙනවා... ඔයා ළඟ හිටියනම් ඒවා කරනවා කියලා කෙල්ල දන්නවනේ පුතේ..."

"මං... මං අම්මෙ ගිහිල්ලා ජයසූරිය සර්ට වැඳලා හරි සමාව ඉල්ලන්නද... කකුල් දෙක අල්ලලා වැඳලා හරි සමාව ඉල්ලලා බබා ගාවට යන්නද..."



අම්මා මා දෙස බලා උන්නේ දැඩි අනුකම්පාවකිනි.

"වෙන කරන්නත් දෙයක් නෑ තමයි පුතේ... අනික දැන් ඔය දෙන්න බැඳලත්නේ ඉන්නේ..."

"මං යනවා... මට බැණලා ගහලා එලව ගත්තත් කමක් නෑ... ඒත් මෙහෙම ඉන්නවට වඩා ඒක හොඳයි..."

අම්මා කිසිවක් කීවේ නැත. මම කඩිනමින් ඇඳ ගත්තෙමි. මට වැරදී ඇඳෙන්නට ගියේ සුදු කමිසයකි. මම ඒ සුදු කමිසය ගලවා වෙනත් කමිසයක් ඇඳගත්තෙමි.

හිත වැඩ කරන්නෙත් මාව බය කරනා තාලයටය.

"මොනවා කිව්වත් අහන් ඉන්න... දෙමව්පියන්ගේ පැත්තෙන් බැලුවාම ඔයා වැරදියි රත්තරන්..."

"මං ඒක දන්නවා අම්මේ..."

පාරට බසිද්දී ගොම්මන් කළුවර වැටී තිබුණි. මේ යන්නේ තීරණාත්මක ගමනකි.

සමහර විට ජයසූරිය මහතා මාව පන්නා ගනු ඇත.

නුගේගොඩට පැමිණි මම යළිත් මධූගේ දුරකතනයට ඇමතුමක් ගත්තෙමි.

"ම..ධූ.. කොහෙද ඉන්නේ කියනවද නංගී..."

"අපි ඇපලෝ එකේ අයියේ ඉන්නේ... කෙල්ල ඉන්ටෙන්සිව්... මං.. මේ ඇන්ටිත් එක්ක ඉන්නේ..."

"ම..ට තවත් මේවා දරාගන්න බැහැ නංගී... මං.. මං..."

"ඔයාට පිස්සුද ඔයා මොනවද මේ කරන්න යන්නේ..."

"මං ජයසූරිය සර්ව හම්බවෙනවා..."

The Reader's Place Novel.

මධූ මොහොතක් නිහඬව උන්නාය.

"අයියට හිතෙනවද වැඩක් වෙයි කියලා..."

"වැඩක් උනත් නැතත් මට වෙන විසඳුමක් නෑ නංගී... මාත් ගොඩ එන්න ඕන... කෙල්ල මැරෙන්න යද්දි මට මෙහෙම ඉන්න බෑ..."

"ඔව්... ඔයා ඔහොම හිතන එක හොඳයි... තනියම යන්නෙපා අයියේ... සුභාෂ්ට කෝල් එකක් දීලා එයත් එක්කම අන්කල්ව හම්බවෙන්න යන්න... ඉන්න මං ඇන්ටිට දෙන්නම්..."

අම්මා දුරකතනය ගත්තේම අඬාගෙනය. ඇගේ දුක මට තේරුම් ගතහැක. තමා හැදූ වැඩූ දියණිය මැරෙනවා බලන් ඉන්නට හැකි මව්වරු ලොව නැත.

The Reader's Place

"අ..නේ ර..ත්..ත..ර..න් මගේ කෙල්ල..."

ඇය සනසා ගන්නට බැරි ලෙස හැඬුවාය. මම දුරකතන කුටියේ බිත්තියට මුවා වී මගේ කඳුළු පිසදා ගත්තෙමි.

Novel..

"ම..ට තේරෙනවා අම්මේ... බබාට මොනවත් වෙන්නෑ අම්මේ... එයාට සනීප වෙනවා... මං දන්නවා..."

"අනේ සුදු පු..තේ... ඔයාවත් මං ගාව නෑ..නේ..."

"මටත් අම්මයි බබයි නැතුව ඉන්න බෑ අම්මේ..."

"ඔයා ළඟ හිටියනම් කෙල්ල මීට වඩා ටිකක් හරි සනීපෙන් ඉන්නවා පුතේ... සිහිය ආපු ගමන් අහන්නේ ඔයා කෝ කියලා..."

අම්මා කියන්නේ ඇත්තය. සමාධි එපමණටම මට ආදරය කළාය. "ඔයාව දැක්කත් මට හරි චූන්



මහත්තයෝ..." මේ සමාධි නිතරම කියූ කතාවකි.

"ම..ට..ත් මෙහෙම පිච්චි පිච්චි ඉන්න බෑ අ..ම්..මේ.. මං.. සර්ව අද හම්බවෙනවා..."

"හම්බවෙන්න පුතේ... ඔයාට පව් නෑ... ඔයා අතේ වරදක් නෑ තමයි... ඒත් වැඳලා හරි සමාව ඉල්ලන්න... ඔයාගෙත් තාත්තනේ පුතේ..."

"මං දන්නවා අම්මේ... මට සර් ගැහුවත් මං තරහ නෑ... මං අද යනවා... සර් ගෙදරද ඉන්නේ..."

"ඔව් දැන් ගෙදර ගියේ... ඔය තදට හිටියට එයත් හිතෙන් තැවෙනවා... දැන් හරියට බොනවා... මේ කරදර ඔක්කොම ඉවරවෙන්න කියලා හිතන් ඔයා යන්න මහත්තයෝ..."

"මං යනවා අම්මේ... අම්මයි බබයි වෙනුවෙන් මං හැම දෙයක්ම කරනවා..."

"ඔයාට වරදින්නෑ පුතේ... ඔයා යන්න..."

"බබාට තාම සිහිය නැත්ද අම්මේ..."

"ඒකනේ වස්තුවේ... මාව ගැහෙනවා රත්තරන්..."

"බබාට කරදරයක් වෙන්නෑ... සර් හා කිව්වොත් මං බබා ළඟ දිගටම ඉන්නවා..."

"ඔයා ළඟට වෙලා ඉන්නවනම් කෙල්ල සැනසීමෙන් බත් කටක් කයි පුතේ..."

"මං දැන්මම යනවා අම්මේ... අම්මා බයවෙන්නෙපා... මං බබාට බෝධි පූජා දෙකක් තිබ්බා... බබාට නරකක් වෙන්නෑ..."

"ඔයාට එහෙම හිතෙන එක කොච්චර දෙයක්ද

වස්තුවේ... එහෙනම් යන්න... සර් බණියි... ඒත් දරාගෙන ඉන්න..."

"මට පුළුවන් අම්මේ... බුදු සරණයි..."

"බුදු සරණයි පුතේ..."

දුරකතනය තබා මම එහෙමම සුභාෂ්ට ගත්තෙමි. සුභාෂ් උන්නේ කාර්යාලයේ සිට රෝහල බලා එමිනි.

"කෙල්ල ඇපලෝ කියලා මධූ මට කතා කරලා කිව්වා... මං මේ එහෙට යන ගමන්..."

"කෙල්ල ඉන්ටෙන්සිව් අරන් මචං..."

"මට තේරෙනවා කොල්ලෝ උඹ විඳින දුක..."

"මට තව එක උදව්වක් කරපන් මචං..."

මම සුභාෂ්ට බැගෑපත් උනෙමි.

"කියපන් මචං..."

"ජයසූරිය සර්ව හම්බවෙන්න වරෙන් මා එක්ක යන්න..."

"මොනවා අන්කල්ව..."

"ඔව්.. මට වෙන විසඳුමක් නෑ මචං..."

සුභාෂ්ද එය අනුමත කලේය.

"උඹ බයවෙන්නෙපා... මං එන්නම් අන්කල් ගාවට උඹව එක්කන් යන්න... මං අන්කල්ට වේලාසන කතා කරන්නද මචං..."

"එපා මචං... සර් ගත් කටටම එපා කියයි... අපි ගිහිල්ලම හම්බවෙමු..."

"ඔව් ඒක හොඳයි තමයි..."



සුභාෂ් මාව නුගේගොඩින් ඔහුගේ වාහනයට නග්ගා ගත්තේය. කොතරම් හිතේ ධෛර්යයක් තිබුණද ඇතුළතින් මම ඇඩි මානසික කම්පනයකට පත්ව උන්නෙමි.

"උඹට බයයි නේද..."

"බය නැත්තෙමත් නෑ මචං... මේ අවස්ථාව මට නොලැබුණොත් මං මොනවා කරන්නද..."

"ඒත් මචං ඒකත් උඹ අමතක කරන්නෙපා... උඹ නංගිගේ කසාද මිනිහා... තේරුණාද..."

"ඔව්... ඒත් මගේ කසාද ගෑණි වෙන්න කලින් එයාට සමාධිව දුව උනේ..."

"තාත්තටත් නැති අයිතියක් කසාද බැඳපු මිනිහට තියෙන්නේ මචං... බයවෙන්නෙපා අන්කලුත් වැටිලා ඉන්නේ... මං ඉන්නවනේ..."

සමාධිගේ නාවල නිවස අසළ වාහනය නවත්වද්දී මම සියළු දෙවියන් වාහනය තුළට වී යැද්දෙමි.

මේ නිවසට ආ ප්‍රථම දවස මට සිහිවිය. හඟුරන්කෙතට යන ප්‍රථම දවසේ මහා පාන්දර බෑගයක්ද රැගෙන මේ ගේට්ටුවෙන්ම මා ඇතුළු වූ අයුරු මට සිහිවිය.

එදා මෙදාතුර ගෙවී ගියේ කොතරම් අඩු කාලයක්ද... එහෙත් ඒ කුඩා කාලය තුළ ජීවිතයේ කොතරම් නම් දේ සිදුවුනිද...

එදා ජයසූරිය සර් මාව හඟුරන්කෙත මල් වත්තට යවන්න තීරණය නොකළා නම්... අපිත් සමගම සමාධිත් හඟුරන්කෙත වත්තේ නවතින්නට තීරණය නොකළා නම්... හඟුරන්කෙත සීත කඳුකරයේදී අපට අප ගැන

The Reader's Place
Novel..

ආදරයක් නොඉපදුනා නම්... මේ ගින්දර කිසිවක් නැතැයි සිතිය හැක.

එහෙත් මේ අද මා විඳින මහා ගින්දර ටික පැත්තකට දමා සමාධිගේ ආදරේ අනෙක් පැත්තට දමන්නේ නම් මට සියල්ලටම වඩා ඇයව වටී. අප ආදරය කරන්නට පටන් ගත්තේ හඟුරන්කෙත ගෙදරදීය... මල් වත්තේදීය... හිරුපීල්ලේදීය... අපට කසාද බඳින්නට වූයේ අනුරාධපුරයේදීය... පවුල් කන්නට වූයේ සිංගප්පූරුවේදීය... අවසානයට කටුනායක ගුවන් තොටුපළේදී අපට වෙන්වන්නට සිදුවිය.

දෛවය අප දෙදෙනාට මෙහෙම කළේ ඇයි දැයි මම දෛවයෙන් නොඅසමි. ඒ අප දෙදෙනා එක් කළේද ඒ දෛවයම නිසාය.

The Reader's Place Novel..

අපව එක් කළ දෙවියන් අපව සදාකාලිකවම වෙන් කරාවි යැයි මම කෙදිනකවත් නොහිතමි.

අප වෙන්වී ඇතැයි මට ඇත්තටම නොහිතෙයි. අප ආදරය කළේ එසේ වෙන්වන්නට ඉන්නා පෙම් යුවළක් ලෙසින් නොවේ. එසේ වෙන්වන්නට සිදුවේ නම් මේ ලොව පාලනය කරන දෙවියෙකු නැත.

එහෙත් එවැනි දෙවියෙකු ඇතැයි මම විශ්වාස කරමි.

ජයසූරිය මහතා හමුවන්නට මේ ගමන එන්නට ප්‍රථම වැල්ලවත්තේ ශ්‍රී ගණපති කෝවිලට මා බාරයක් ගැට ගසා ආවේ ඒ නිසාය.

"නිර්වාන්... බැහැපන් කොල්ලෝ..."

සුභාෂ් මගේ කරට අතක් තබා කීවේය.



"බයවෙන්නෙපා... මාත් ඉන්නවනේ..."

"යන්..."

වාහනයෙන් බැස නිවසේ ගේට්ටුව අසළ වූ සීනුව නාද කරන්නට ප්‍රථම මම සුභාෂ්ගේ අතකින් අල්ලා ගත්තෙමි.

"මං ඇවිත් කියලා කිව්වොත් සර් මාව ඇතුළටවත් ගන්නැතිවෙයි..."

"ඒකත් ඇත්ත... උඹ ටිකක් කවර් වෙලා හිටපන්... සර්වන්ට්නෙ එන්නෙ... මං කියන්නම් මං ඇවිත් ඉන්නවා කියලා කියන්න කියලා..."

සුභාෂ් ගේට්ටුවේ වූ සීනුව නාද කර සේවකයා අත පණිවිඩයක් ඇරියේය. මොහොතකින් ගේට්ටුවේ කුඩා දොර විවෘත විය.

"වරෙන් නිර්වාන්..."

මාව දැක වීරසේන පුදුමයෙන් මෙන් බලා උන්නේය. ඔහු ජයසූරිය මහතාගේ රියදුරාය.

"නි..නිර්වාන් මහත්තයා..."

"ඔව් වීරසේන අන්කල් මං..."

"අනේ මහත්තයා... දැන් ගිහින් කලබලයක් දාගන්නෙපා..."

"මං කලබල දාන්න නෙමේ ආවේ වීරසේන... සර්ගෙන් සමාව ඉල්ලන්න..."

වීරසේන පුදුමයෙන් මෙන් බලා උන්නේය.

මම නිවසට ඇතුල් නොවී දොරකඩ අසළ වූ දිය පොකුණ අසළ නතර උනෙමි. ප්‍රථම දවසේ සමාධි මට

ගස්සාගෙන ගියේද මෙතන මා ඉන්නා විටය.

ඒ අතීතය සිහිවී හදවත අළුතින් පත්තු විය.

"මම මෙහෙම ඉන්නම් සුභාෂ්..."

"එහෙනම් හිටපන්... මං අන්කල් එක්ක කතා කරලා එන්නම්..."

සුභාෂ් ඇතුළට ගියේය. මම අසරණව දිය පොකුණේ වූ කළු පැහැගත් කාෆ් මාළුවෙක් දෙස බලා උන්නෙමි.

තත්පර ගෙවී යන්නේ ඉතා හෙමින් යැයි මට සිතුණි. මගේ ඇතුළු පපුව දැන් දැන් පිපිරේ යැයි මට සිතුණි.

සුභාෂුත් ජයසූරිය මහතාත් කතා කරන කිසිවක් මට ඇසෙන්නේ නැත. ජයසයූරිය මහාතගේ පැජරෝව අසළ උන් වීරසේන මාදෙස බලා අසරණව සිනාසුනේය.

සමහර විට මේ නිවසට මට එන්නට ලැබෙන අවසාන දිනය අද වීමට පුළුවන. මේ දෛවය මට දෙන අවසාන අවස්ථාව යැයි මට සිතුණි. ජයසූරිය මහතා ගුවන් තොටුපළේදී මට බැණ බැදුන ආකාරය මට සිහිපත් විය. එදා එහෙම කතා කළ ඔහු අද මට සමාව දේ යැයි සිතීම අමාරුය.

අඩුම තරමින් සමාධිව බලන්න යන්න එන්නවත් මට ලැබේනම් ඒ ටිකවත් ඇතිය.

"නිර්වාන්..."

සුභාෂ් දොරකඩට පැමිණ මට කතා කළේය. මම මොහොතක් ඔහු දෙස බලා උන්නෙමි.

"ව..රෙ..න්..."

ඔහු කතා කළේ රහසින් මෙනි.



"ස..සර් මොනවද කියන්නේ..."

"ගිහින් කතා කරපන්..."

සුභාෂ් මගේ පිටට අතක් තබා කීවේය. මගේ දෙපා වෙව්ලන්නට මෙන්විය.

"පලයන් ඉතින් උඩට..."

සුභාෂ් පහළ තිබූ සැටියේ වාඩිවෙන ගමන් කීවේය.

"උඩ බැල්කනියේ අන්කල් ඉන්නෙ..."

මම හෙමින් හෙමින් ඉහළ මාලයට නැග්ගෙමි. බැල්කනියට යන්නට නම් සමාධි උන් කාමරය පසුකර යා යුතුය.

වෙනදා එහි උන් සුන්දර යුවතිය අද නැත. එක අතකට මේ මිනිසා මේ තරම් කේන්ති ගැනීම අසාධාරණ නැත. සියල්ල කළේ මා යැයි මම මටම කියා ගත්තෙමි.

ඔහු උන්නේ බැල්කනියේ කළුවරේය. පුටුව අසළ වූ ටීපෝවේ බාගයක්ම බී හිස්කළ විස්කි බෝතලයක් විය.

ජයසූරිය මහතා දකිත්ම මගේ මුළු ඇතුලාන්තයම දැවී ගියේය. ඔහු පිළිගත්තද නොපිළි ගත්තද මේ මගේ මාමාය. දෙවෙනි තාත්තාය.

"ස...ර්..."

මට ඇඬුණි. ජයසූරිය මහතා හිස ඔබාගෙනම උන්නා මිස හිස එසවූයේ නැත.

ජයසූරිය මහතා දැන් දැන් බැණ වැදී මාව එලවා ගනිතැයි මට සිතුණි. ඔහු මට කාමරයට එන්නයැයි කියන්නට ඇත්තේ ඔහුගේ අවසාන තීරණය දැනුම් දෙන්නට විය යුතුය.

The Reader's Place Novel..

මිය යන්නට හෝ ජීවත් වන්නට මට ඇත්තේ එකම බලාපොරොත්තුවක් පමණි. මගේ දෛවය මාව ජීවත් කරනවාද නැද්ද කියා තීරණය කරන අවසාන මොහොත මේ යැයි මට සිතුණි. සමහර විට කෙනෙකුගේ දෛවය දෙවියන්ටවත් වෙනස් කළ නොහැක.

ජයසූරිය මහතා උන්නේ මේසයේ දෑතම තබාගෙන නළලතේ ඇඟිලි තුඩු ගසාගෙනය.

"ස..ර්..."

මම බිඳුනු හඬින් ඔහුට ඇමතුවෙමි. ජයසූරිය මහතා හිස එසවූයේ නැත.

"ස..ර්... ස..ර්..ට හිතෙන දෙයක් මට කරන්න... මට බණින්න... බල්ලෙකුට වගේ බණින්න... නැත්නම් ගහන්න... ඒත්... ම..ට ම..ට..."

මට හැඬුණි. ඔහු අභියස මට හැඬේ යැයි මම ඇත්තටම නොසිතුවෙමි.

"ම..ම..ට එ..ක පාර..ක් සර්ගෙන් සමාව ගන්න ඉඩ දෙ..න්..න... ඊට ප..ස්..සේ සර්ට කැමති දෙයක් කරන්න..."

මම සෙමෙන් සෙමෙන් ගොස් ඔහු ඉඳගෙන උන් පුටුව පාමුල දණ ඔබා ඔහුගේ දෙපා අල්ලා වැන්දෙමි.

"ම..ට ස..මා..වෙ..න්..න ස..ර්... මං.. මං සර්ට ලොකු වැරැද්දක් කළා... මං... මං ඒකට දඬුවම් විඳින්න ලෑස්තියි... ස.. ස..ර්ට කැමති දෙයක් කරන්න... ම..ම..ට..ත් මෙහෙම ජීවත් වෙන්න බෑ... ස..ර්.. මං.. මං..."

මම ඔහුගේ දෙපා වැළඳගෙන මෙන් ඇඬුවෙමි.

"නිර්වාන් නැඟිටින්න..."

The Reader's Place Novel..



ඔහුගේ කටහඬින් මම එවන් මෘදු බවක් බලාපොරොත්තු නොවුනෙමි.

"ස..ර්..."

"නැගිටලා ඉඳගන්න..."

ඔහු මට පුටුව පැවද මම හිටගෙනම උන්නෙමි. විශාල වරදක් කළ ළමයෙකු ප්‍රින්සිපල් සර් අසළ සිටගෙන ඉන්නාක් බඳුව මම ජයසූරිය මහතා අසළ සිටගෙන උන්නෙමි.

"කිව්වම අහල ඉඳගන්න..."

මම පුටුවේ යාංතමට ඉඳගත්තෙමි. මගේ දෙනෙත් වලින් නොනවත්වා කඳුළු ගලා එයි.

ජයසූරිය මහතා බොහෝ වේලා යනතුරු කතා කළේ නැත. මමද ඔහු කතා කරන තෙක් උන්නෙමි.

"මොනාවද මේ උනේ නිර්වාන්..."

දැඩි වෙහෙසට පත් වූ හඬකින් ඔහු ඇසුවේය. සිදුවූයේ කුමක්දැයි මටද තේරුම් ගත නොහැක.

"ම..ම..ට..ත් තේරුම් ගන්න බෑ ස..ර්... අ..අපි වරදක් කළා... ඒ..ක..ට අපිට දඬුවම් ලැබුණා කියලයි මට හිතෙන්නේ ස..ර්..."

මට එසේ සිතුණ වාර අනන්තය. නැත්නම් දෛවය මේ තරමම අපව අසරණ කරන්නේ නැත.

"මං ඔය දරුවා ගැන හරියට බලාපොරොත්තු තියන් හිටියේ..."

මටද කියන්නට ඇත්තේ එයමය. මට ඇය හැරෙන්නට අන් බලාපොරොත්තුවක් නොවිණ.

"එ..යා ස..ර්... මං.. මං ගාව හොඳට හි..ටි..යා..."

ඇයට මහා සැපක් දෙන්නට මට බැරිවූ බව ඇත්තය. එහෙත් මම මගේ ඇස්දෙක මෙන් ඇයව බලා ගත්තෙමි. ඇය ළඟින්ම උන්නෙමි.

"දරුවගේ ජීවිතේ අනතු..රේ..."

දිග සුසුමක් හෙළ ජයසූරිය මහතා කීවේය. මගේ ඇඟ හිරිවැටිණ.

"එ..හෙ..ම වෙන්නෑ ස..ර්... එයා ස..නී..ප වෙනවා... එ..යා..ට එ..හෙම නරක දෙයක් වෙන්නෑ..."

"ඩොක්ටර්ස්ලා කියන්නේ මීට කලින් බැලුවනම් සනීප කරගන්න තිබ්බා කියලා..."

ජයසූරිය මහතා කියන්නේ වරද මා අත බවද...

"මං.. මං... සර් සිංගප්පූරුවේ හොඳම හොස්පිට්ල් එකක එයාව නැවැත්තුවේ..."

"මං ඒක නිසා කියනවා නෙමේ... ඒ..ත් අනේ මන්ද..."

"එයාව බේරගන්න පුළුවන් ස..ර්.. මං.. මං.. සා..ස්..ත..ර..යකුත් ඇහුවා..."

ඒ සාස්තරයට සිදුවූ දේවල් හරියටම කීවේය. මා විෂ්ණු කෝවිලට ගොස් බාර වූයේ ඒ සාස්තරය ඇසූ පසුය.

"කොහෙදිද දෙන්න කසාඳ බැන්දේ..."

මා බලාපොරොත්තු නොවූ ප්‍රශ්නයක් හිටි හැටියේම ජයසූරිය මහතා ඇසුවේය. ඒ දවස මට කිසි කලෙකත් අමතක නොවේ.



"අ.. අනුරාධපුරේදී..."

ඔහු එය හදිස්සියේම ඇසුවේ ඇයි... මම දිගටම ජයසූරිය මහතා දෙසම බලා උන්නෙමි. අනුරාධපුරයේදී එක්වූ අපට කටුනායකදී වෙන්වන්නට සිදුවිය. එය වෙන්වීමක් නොව වෙන්කිරීමකි.

"එතකොට අසනීප ගතියක් තිබ්බේ නෑ..."

"අ..නේ නෑ.. ස..ර්... හොඳට හිටියා.. අ..පි ශ්‍රී මහ බෝධියට ගියා... වැවේ නෑවා... එයා සතුටින් සනීපෙන් හිටියා... ඇ..ත්..ත..ම..යි..."

"සිංගප්පූරුවට ගියේ ඇ..යි..."

ඔහු ප්‍රශ්න කළේ විනිශ්චයකරුවෙකු මෙනි. මෙසේ අසන්නේ මොනවා කරන්නට සිතාගෙන දැයි මම ඇත්තටම නොදනිමි. එහෙත් දැන් කිසිවක් සඟවා පලක් නැත.

"සල්ලි හොයන්නද..."

මම නැතැයි කියන්නට මෙන් හිස වැනුවෙමි.

"මං අනුරාධපුර මොනා හරි කරන්න හිතන් උන්නේ... පොඩි බිස්නස් එකක්..."

"එහෙනම්..."

"අපට කරදර තිබුණා..."

"මොනවද..."

මම මොහොතක් බිම බලාගෙන උන්නෙමි.

"සු..දේ..ශ් ගෙන්... මා.. මාව මරන්න ආ..වා... ජය ශ්‍රී මහ බෝධිය වැඳලා එද්දී මගේ ඔළුවට පිස්තෝලේ තිබ්බා... බ..බා..ව අරන් යන්නත් හැදුවා..."

The Reader's Place Novel..

ඔහු බලා උන්නේ පුදුමයෙන් මෙනි.

"සුදේශ් අනුරාධපුර පීර පීර අපිව හෙව්වා... යන්න වෙන තැනක් තිබ්බෙ නෑ... ගියත් අපිව වෙන් කරයි කියලා බය හිතුණා... ඒ තත්වය උඩ ජීවත් වෙන්න මොනා හරි කරන්නත් බැරි තත්වයක් තිබ්බෙ... සමාධි මට එළියට වත් යන්න දුන්නෑ..."

"ප..ස්..සේ..."

"සිංගප්පූරුවේ ජොබ් එකක් හොයාගෙන යන්න තීරණය කළා... වෙ..න කරන්න දෙයක් ති..බ්..බෙ නෑ ස..ර්... අ..පිව වෙන් කරයි කියලා අපි දෙන්නම බයෙන් හිටියේ... ඒ වෙද්දී අ..අ..පි ක..සා..ද බැ..දලා හිටියේ... ම..ම කොහොමද එයාව දාලා යන්..නේ..."

මට යළිත් වරක් හෝ ගා ඇඬුණි.

"අඬන්නැතුව ඉන්න..."

ඔහු ඒ තරම්වත් කාරුණික වීම ගැන මම ඇත්තටම සතුටු වුනෙමි.

"සිංගප්පූරු යනවට දුව කැමති උනාද..."

"ඔ..ව් ඒත් එයාව එක්කන් ගියේ මම... එයා වරදක් කළේ නෑ..."

මම සමාධිව හැකි තරම් බේරාගත්තෙමි. තාත්තා කෙනෙකුගේ හිතේ දුවෙක් ගැන වෛරයක් උපද්දවිය යුතු නැත.

"එයාව ගෙදර නවත්තලා ඔයාට රට යන්න තිබ්බනේ... ගිහිල්ලා සල්ලි ටිකක් එකතු කරගෙන ඇවිත් මගෙන් අවසර ගන්න තිබ්බනේ..."



මම නිහඬ වීමි. දෛවයේ සමහර දේවල් එසේ සිදුවූවා නම් හොඳ යැයි හිතෙනා මුත් එසේ වන්නේ නැත.

"ඔ..ව්.. එහෙම කරන්න තිබ්බා... ඒත් ඒ වෙලාවේ අ..පි..ට වෙන්වෙන්න බය හිතුණා... එ..හෙ..ම උ..නො..ත්..."

"ඇයි මොනාද වෙන්නේ..."

"අපි දෙන්නට දෙන්න නැතුව ඉන්න බැරි තත්වෙක සර් හිටියේ..."

මම කඳුළු ගිලගෙන මෙන් කීවෙමි.

ජයසූරිය මහතා මා දෙස බලාගෙනම උන්නේය. හිස ඔසවා ඔහුගේ දෙනෙත් දෙස හැල්මේ බලන්නට තරම් මට ශක්තියක් තිබුණේ නැත.

"ඇයි දරුවෙක් ගැන හිතුවේ නැත්තේ..."

මට එක පැත්තකින් පුදුම සිතුණි. මේ මා ජයසූරිය මහතාගෙන් බලාපොරොත්තු වූ ප්‍රශ්න නොවේ.

"මං බොරු කියන්නෙ නෑ සර්... අපි හිටියේ අමාරුවෙන්... සිංගප්පූරුවට ගියෙත් සල්ලි ටිකක් හොයාගෙන ලංකාවට ඇවිත් මොනවා හරි කරන්න හිතාගෙන... කාලයක් යනතුරු මේ දුක දරාගෙන ඉන්න වෙනවා කියලා අපි තේරුම් ගත්තා... අනික..."

"ඔව්..."

"බබා තාම පොඩියි... ළමයි එහෙමත් හදලා එයාව තවත් අසරණ කරන්න මට බැහැ... කොච්චර හිතාවෙලා හිටියත්... ජීවිතේ ගැන ලොකු බයක් අපිට තිබුණා...

The Reader's Place Novel..

ඒ...යා...ට...ත් ඒක ති...බු...ණා... තේරුම් ගන්න බැරි බයකිනුයි හිටියේ..."

"මං නිසාද..."

වෙනස්ම හඬකින් ජයසූරිය මහතා ඇසුවේය.

"නෑ... ස...ර්... මං සර්ට ගොඩක් ගෞරව කරනවා... ඒ...ක දන්නේ මගේ මේ පපුව විතරයි ස...ර්... මට ගැහුවත්... මැරුවත් මට බෑ සර්ට වෛර කරන්න..."

"එහෙනම්..."

"සුදේශ් වෙඩි බෙහෙත් ගඳ එන පිස්තෝලේ මෙන් මෙතනටම තිබ්බා... ඒ වෙලාවේ මට ජීවිතේ ගැන ලොකු බයක් ආවා... මං... නිසා කෙල්ලගේ ජීවිතේ අඳුරු වෙයි කියලා... තව ටික දවසක් ලංකාවේ හිටියා නම් සුදේශ් මාව මරනවා... අපි අනුරාධපුරේ ඉඳලා මහා පාන්දර හැංගිලා වගේ කොළඹ ආවේ... හරි බයෙන් කටුනායක ගියෙත්... ඒ වෙලාවේ සමාධි ඇඬුවා... සර්ගේ කකුල් දෙක අල්ලලා වැඳලා රටෙන් පිටවෙන්න තියෙනවා නම් හොඳයි කියලා මං කිව්වා... ඒත්... ඒ වෙලාවේ රටින් පිටවෙනවා ඇරෙන්න වෙන දෙයක් තිබ්බේ නෑ..."

එයින් පසු ජීවිතයේ සිදුවූ සියල්ල ඒ ලෙසම මම ඔහුට කීවෙමි. වංක වීමට අවශ්‍යතාවයක් නැත. මේ සමහර විට ජීවිතයේ අවසානයද විය හැක.

"සිංගප්පූරුවේ මොනවද කළේ..."

"කාගෙත් කම්පැනියක වැඩ කළා... ක්ලියරින් සෙක්ෂන් එකේ..."

"පඩි..."



"රුපියල් හැටදාහක් විතර ලැබුණා..."

"හිටියේ..."

"කාගෙත් කම්පැනි එකේ ක්වාටස් වල... අපිට වෙනමම රූම් එකක් ලැබුණා... ගොඩක් පොඩියි... ඒත්..."

"ඇයි..."

"අපි සිංගප්පූරුවට ගිය මුල් මාස දෙකේ සතුටින් ජීවත් උනා... සල්ලි නම් එහේ ඉතුරු කරන්න අමාරුයි... බඩු හරි ගණන්... මට තිබ්බ එකම දුක එයාව දවල්ට තනිකරලා යන්න වෙච්ච එක... ඒත් මං දවසට තුන් පාරක් එයාව බලලා යන්න එනවා..."

"ඒ දවස් වල අසනීප උනේ නෑ..."

"හිසේ කැක්කුමක්වත් තිබ්බේ නෑ... අපි ඊ දොළහ එක දෙක වෙනකල් සිංගප්පූරු සිටි එකේ ඇවිදිනවා..."

ඒ දවස් සිහිවී මගේ ඇස් යළි කඳුළින් තෙත් විය. නිල් ජීන්ස් කලිසමත් සැහැල්ලු අත් දිග ටී ෂර්ට් එකත් ඇඳ නිල් පැහැගත් කැප් තොප්පියත් දමාගෙන මගේ අතේ එල්ලී සිංගප්පූරුවේ මැනිලා බීච් වල ඇවිද්ද සමාධිව මට සිහිවිය.

"ඔයාට දුවගෙන් වෙන්වෙන්න පුළුවන්ද..."

කුළු ගෙඩියකින් පපුවට දමා ගැසුවාක් වැනි කම්පනයක් මට ඇතිවිය. නැත. එවැනි දෙයක් මේ ජීවිතය පවතින තුරු විය නොහැක.

"එහෙනම් මං මැරෙන්න ඕන..."

මම හඬමින්ම කීවෙමි. ආදරය කළේ වෙන්වන්නට නොවේ. විවාහ වූයේ දික්කසාද වන්නට නොවේ. එක

The Reader's Place Novel..

කියලා බය හිතුණ නිසා... අන්ඩර්ස්ටෑන්ඩ්..."

එදා ඒ ටික කියා සමාධි මගේ මුහුණ හැපුවාය. එදා කම්මුලට දැනුණ මිහිරි වේදනාව දැනුදු දැනෙන්නාක් බඳුය.

"අ..යියේ.. කෙල්ලව ගේනවා..."

මධූ රෝහල් කාමරයේ සඳළුතලයට පිවිස කීවාය. එවිට රාත්‍රී දෙකට ආසන්නය.

සමාධිව රැගෙන ආවේ ට්‍රොලියකය.

මට හීල්ලින. ඇය මළකඳක් බඳුය. එහෙත් කමක් නැත. හෙට සිට මේ මළකඳට මම ජීවිතය දෙමි.

නිර්වින්දක බෙහෙත් ලබා දී තිබූ නිසා සමාධිට සිහිය එන්නට ටික වේලාවක් ගතවිය. ඇය උන්නේ ඇයටවත් ඔරොත්තු නොදෙන තරම් දුර්වල අඩියකය.

තවමත් මා ළඟ ඉන්නා බව සමාධි නොදනියි. ඇය තොල් පට සොලවමින් යමක් කියන්නට උත්සාහ කළද ඇගේ දෙනෙත් තවමත් පියවී ඇත.

පිරී තිබූ ඇගේ කම්මුල් වල ඉතිරි වී ඇත්තේ කටු ටික පමණි. එහෙත් මට හැමදාමත් ඇගේ මුහුණින් දුටු ලස්සන සදාතනිකව විය. එය මේ ලෙඩට දුකට වෙනස් කළ නොහැක.

"අ..ම්..මේ.. ව..තු..ර ටි..ක..ක්..."

වියළී ගිය තොල් පට අමාරුවෙන් සොළවා ඇය කීවාය. මගේ පපුව හෝස් ගා දැවී ගියේය. මගේ මුළු ශාරිරය පුරාම විහිදී ගියේ මේ දෙතොල්ය.

"ඉන්න මැණික..."



මම ඇගේ හිස අතගා කීවෙමි. සමාධි තොල් පට මුව තුළට ගෙන තෙතමාගෙන කලබලයෙන් දෑත සෙලෙව්වාය.

"අ..ම්..මේ..."

මා ළඟ ඉන්නා බව ඇය තවමත් විශ්වාස නොකරයි.

"ඇයි මගේ පු..තේ..."

"මේ.. මේ.. සු..දූ.. කතා කරනවා වගේ මට ඇහුණා..."

මගේ දෑස් තෙත්ව ගියේ ඉබේටමය.

"උඹේ සුදු පැටියා තමයි කෙල්ලේ කතා කළේ... ඇස් ඇරලා බලපන් රත්තරන් කවුද ඉන්නේ කියලා..."

මධූ සමාධිගේ ළඟටම ළංව කීවාය.

"සු..දූ ආවා..."

සමාධි දෑස් ඇරියේ අමාරුවෙනි. දවසකට දෙන බෙහෙත් ප්‍රමාණය නිසාම ඇගේ දෑස් සුදු මැලි වී ඇත. එහෙත් ඇය දෑස් ඇර මා දෙස බලා උන්නාය. වියළී ගිය දෑස් තෙත්ව ගියේ බලා ඉඳිද්දීය.

"අ..නේ... ඔයා ඇවිත්..."

මම සමාධිගේ හිස අතගෑවෙමි.

"ඔව් බබා මං ආවා..."

මහා අනර්ඝ දෙයක් ලැබුණාක් මෙන් සමාධි මගේ අත ගෙන හැම තැනම පිරිමැද්දාය.

"අනේ අත කෙට්ටු වෙලා..."

"ඒවා මහත් කරගන්න පුළුවන් බබා... අපි ඉක්මනට සනීප වෙමු..."

The Reader's Place Novel..

"මං තාත්තට කතා කළා..."

සමාධි පුදුමයෙන් අම්මා දෙස බැලුවාය.

"කරදරයක් නෑ පුතේ... තාත්තා පුතාට ඔයා ගාව ඉන්න කියලා..."

"අනේ ඇත්තද... කොච්චර හොඳද... එහෙනම් මට ඉක්මනටම සනීප වෙයි..."

මගේ ආදරයට එවැනි බලයක් වෙතැයි මටද විශ්වාසයක් විය.

"දැන් පුතේ ඔයා මොනවත් හිතන්නෙපා... ඔයාගේ මහත්තයත් දැන් ඔයා ගාවනේ... හිත සතුටින් තියාගෙන බෙහෙත් ටික බීලා සනීප වෙන්න..."

The Reader's Place

"බලන්න මහත්තයෝ... මගේ අතට ඉන්ජෙක්ෂන් කටු ගොඩාක් ගහලා... හරියට රිදෙනවා..."

Novel..

"මට තේරෙනවා බබා... ඩොක්ටර්ස්ලා හදන්නේ බබාව සනීප කරන්නනේ..."

"කවදද මාව එක්කං යන්නේ..."

ඇත්තටම යළි සමාධිව මට එක්කං යන්නට ලැබේ යැයි මම නොසිතුවෙමි. එහෙත් දැන් එවැනි බලාපොරොත්තුවක් ඇත.

"ඉක්මනටම..."

"නිකං ඉදිද්දී තාම සිංගප්පූරුවේ හිටපු දවස් මතක් වෙනවා..."

"මටත්..."

"සනීප උනාම ආයේ මාව එක්කං යන්න හොඳේ..."



"ඉස්සෙල්ලා සනීප වෙමු..."

එකවරම සමාධි මගේ අත තද කර හීල්ලුවාය.

"මට සනීප වෙන්නැති වෙයිද..."

"පිස්සුද බබා... මෙච්චර දියුණු හොස්පිටල් එකක ඉඳලා සනීප නොවී තියෙනවද..."

"ම්..."

ගිලන් වූ කෙනෙකුට ජීවිතය ගැන ස්ථිරවම බලාපොරොත්තුවක් තබා ගත නොහැක. කොහොමටත් ඒ ගැන ඇත්තේ බියෙනි.

"කෑවද සුදූ..."

අසනීප පිටත් ඇය අසන්නේ මගේ කෑම ගැනය.

"මං කන්නම්... බබා මොනාද අම්මේ කන්නේ..."

"හොස්පිටල් එකෙන් දෙන ඒවා විතරයි පුතේ කන්න පුළුවන්..."

"ඒවා කන්න බෑ මහත්තයෝ... මොනවද ජරා පාන් එකක් එක්ක..."

"කමක් නෑ... මං කවන්නම්..."

"ඔයත් නොකා ඉන්නෙපා..."

තවම අද දවසටම මා කෑමක් ගෙන නැත. දැන් නම් බඩගින්නක් ඇත්තේම නැත.

"සුදූ..."

"ම්..."

"තාත්තා කවදාහරි ඔයාව පිළිගනී කියලා මං දැනං උන්නා..."

"අපි වරදක් කළා බබා... මං ඒකට තාත්තගෙන් සමාව ගත්තා..."

ජීවිතය ගැන දැන් මට දැනෙන්නේ සංසිඳී ගිය හැඟීමකි. සමහර විට ඉදිරියට තව මොනවා වන්නට ඇත්දැයි මම නොදනිමි.

එහෙත් ජීවිතයේ කවර දුකක් ආවද ඒ දුක උපේක්ෂාවෙන් බාර ගත යුතු බව පමණක් අද මම දන්නෙමි.

ජීවිතය යනු එයයි...

ජීවිතයේ දුකද සැපක් යැයි සිතා විඳිය යුතුය.

The Reader's Place Novel..

"බබා නිදාගන්න... මං පැය දෙකකට ගෙදරට ගිහින් චේන්ජ් එකක් දාගෙන එන්නම් හොඳේ..."

කෑම ටික කැවූ පසු මම සමාධිගේ හිස අතගා කීවෙමි.

"ඉ..ක්..ම..න..ට එන්න.. පරිස්සමින්..."

"ම්... හැම වෙලාවෙම හිතන්න මට සනීප වෙනවමයි කියලා..."

"එහෙම හිතන්නම්..."

අම්මාටද වැඳ මම ඇපලෝ රෝහලින් පිටවෙද්දී රාත්‍රී දොළහටත් කිට්ටු කර තිබුණි. ගෙදර ගොස් පැය දෙක තුනක්වත් නිදාගෙන නාගෙන උදෙන්ම එන්නට මම සිතාගත්තෙමි.

හිතේ තිබූ විශාල බරක්... දුකක් අඩු වී ගියාක් වැනි හැඟීමක් මට ඇතිවිය.

ජීවිතයේ මොන සැපය තිබුණද ආදරය කරන අය



ළඟ දැවටෙන්නට නැති එක දුකකි. එය වේදනාවකි. සිංගප්පූරුවේ සිට ලංකාවට ආ මොහොතේ සිට මම ඒ දුක පතුලේම උන්නෙමි.

සිය ගණන් විදුලි බුබුළු දල්වා තිබුණද ඇපලෝ රෝහල අවට තිබුනේ තරමක පාළු ස්වභාවයකි. නාරාහේන්පිට හන්දියට ගොස් ත්‍රීවීලරයක්වත් අල්ලා ගන්නවා යැයි මම සිතාගත්තෙමි.

දැන් මට මගේ පුංචි ව්‍යාපාරය නිදහසේ හිතේ සතුටින් පටන් ගත හැක. සමාධිව උදේ හවස බලන්නට හිතට මහා සැනසීමක් විය.

මම ඇපලෝ රෝහලින් පිටවී නාරාහේන්පිට හන්දිය දෙසට ඇවිදගෙන ගියෙමි.

එකවරම ඩබල් කැබ් රියක් පැමිණ මා යන මඟ හරස් කර නැවැත්විණ. හිතාගන්නටවත් බැරි මොහොතක ඉන් හතර පස් දෙනෙක් දඩිබිඩි ගා බැස ආවෝය.

"සද්ද නොකර වාහනේට නැගපන් බල්ලා... දැඟලුවොත් තියනවා ඔළු කට්ටට කුඩු වෙන්න..."

ඔවුන් අතර උන් එකෙක් මගේ හිසට තුවක්කුවක් එල්ල කර කීවේය. මම නොසැලී උන්නෙමි.

"උඹලා කවුද... මං මොකට උඹලා එක්ක යන්නද..."

මම එකෙකුගේ අත ගසා දමා කීවෙමි.

"එහෙමද බල්ලා... උඹට හොඳින් කියලා වැඩක් නෑ..."

මගේ හිසට පහරවල් තුන හතරක් වැදුණි. ඉදිරිපිට උන් එකා තුවක්කු බඳින් මගේ යටි බඩට ගැසුවේය.

"දාගනින් මූව..."

එකෙක් කෑ ගසා කීවේය. ඒත් සමඟම මගේ ඇටකටු කුඩු වී යන සේ මාව අල්ලා කබ් රිය තුලට දැම්මේය.

මට මතක එපමණකි.

මේ කවුද... මාව මේ කොහේ ගෙනියනවාද... කිසිවක මට නිච්චියක් නොවීය.

එහෙමම මට සිහි නැතිව යන්නට ඇත.

* * * * * * * * *

The Reader's Place Novel..

මට සිහිය එද්දී මා උන්නේ කපරාරු නොකළ බිත්ති සහිත අලුතින් තැනූ අලුත් නිවසක කාමරයකය.

එහි වූ වැලි ගොඩක මාව දමා තිබුණි. මම හිස අතගා බැලුවෙමි. මගේ අතට හසු වූයේ කැටි ගැසී ඇති ලේ කැටිය.

මම අමාරුවෙන් නැඟිටින්නට වෙර දැරුවෙමි. එහෙත් යළිත් මාව කඩාගෙන වැලි ගොඩටම වැටුණි.

"ආ... ප්‍රේමවන්තයට සිහිය ආවද..."

මට රයිෆල් එක මුහුණට තැබූ එකා පැමිණ රයිෆලය කරකවමින් කීවේය.

"මොකටද යකෝ මාව ගෙනාවේ..."

මම කෑ ගසා වේදනාවෙන් ඇසුවෙමි.

"ගෙනාවෙද... උඹව ටිකක් ආශ්‍රය කරන්න..."

"මට යන්න දීපල්ලා..."



"අනේ ඇයි යන්න හදන්නේ... තේකක් එහෙම බීලා ඩ්‍රින්ක් එකක් අරගෙන හෙමිහිට යමු... මොකද හදිස්සිය..."

පැය දෙක තුනකින් එන බවට මම සමාධිට පොරොන්දු වූයෙමි.

"ආ... කෙල්ල බලන් ඉන්නවනේ නේද..."

"උඹලට හොඳක් වෙන්නෑ යකෝ..."

"අපට හොඳට හොඳ වෙලා තියෙන්නේ... කටවහගනින්... උඹව අතගාන්න ගෙනාවේ නෑ පරබල්ලා... දැනගනින්..."

ඔහු මගේ කට පොඩිවන සේ ඇල්ලුවේය. ඒවා යකඩ අඩු මෙනි.

"උඹ උඩ ගියා වැඩියි..."

මේ සියල්ල කරන්නේ සුදේශ්ය. ඔහු හැර මට වෙන සතුරෙක් නැත.

"උඹලගේ බොස්ට ගිහින් කියපන් මට ගහලා මැරුවත් ඌට සමාධිව ලැබෙන්නෑ කියලා..."

ඔහු මාව විසිවී යන්නට පයින් ගැසුවේය. මාව ගොස් දඩාස් ගා බිත්තියේ වැදුණි.

"හා.. උඹ කියන එක මං ගිහින් කියන්නම්... මරනවා තෝව‍ා..."

"ඉතින් මරපන්..."

"උඹව මරන්නේ ටිකෙන් ටික... ටි..කෙ..න් ටි..ක ආයේ කවදාවත් උඹට උඹේ කෙල්ලව බලන්න ලැබෙන්නේ නෑ... තේරුණාද..."

එය විය නොහැක. දෙවියන් ඒ තරම් අකාරුණික

නොවනු ඇත. සුදේශ් හදන්නේ මාව සදහටම මේ ජවනිකාවෙන් අයින් කරන්නටය. එවිට කැමැත්තෙන් හෝ අකමැත්තෙන් සමාධිව ඔහුට ලැබෙතැයි ඔහු හිතයි.

ඒත් සමගම එක මැරයෙකුගේ ජංගම දුරකතනය නාද විය.

"ඔව් බොස්... මිනිහා අපි ළඟ... දැන් බොස් බොස්ගේ වැඩ ටික කරගන්න... මෙහෙ ගැන කරදර වෙන්නෙපා... අපි මෙයාව බලාගන්නම්... නේද මචං..."

ඔහු මගේ බඩට පා පහරක් ගසා කීවේය. මේ වැනි තිරිසනුන් පය ගසනා ලොවක බුදු පිළිම දෙව් පිළිම ඉතිරි වූයේ කෙසේද...

මම වැලි ගොඩෙන් නැගිටින්නට වෙර ගත්තෙමි. එහෙත් දෙපා කැඩී ගියාක් බඳුව කකියන්නට විය. සුදේශ් එක් වරකුත් මෙසේම මාව සොහොනකට ගෙන ගොස් පහර දුන්නේය. එහෙත් ඔහුට බලාපොරොත්තු වූ දේ නොලැබිණි.

මට තදබල විශ්වාසයක් විය. දැස් පියවී ගොස් සිහි නැතුව යන්නට මෙන් හදද්දී මම මගේ ආත්ම ශක්තියෙන් නැගී සිටියෙමි.

එහෙත් ඒ පාළු කාමරයේ වැලි ගොඩ මතදී එක් වරක් පමණක් මට හැඬුම් ආවේය. ඒ සමාධි ගැන සිහිවීය.

උදේ වන්නට ප්‍රථම රෝහලට යන්නට මම බලාගෙන උන්නෙමි. ජීවිතයේ ප්‍රශ්න විසඳන්නට පටන් ගත්තා පමණි.

සමාධි මගේ කසාද බිරිඳය. නීතියෙනුත් ආදරයෙනුත් අප අතර බිඳිය නොහැකි සම්බන්ධයක් ඇති කල සුදේශ්



මෙසේ කරන්නේ ඇයි... ඔහුට මේවා කර කිසිවක් ලබාගත නොහැක.

එහෙත් පච්චකාරයා මෝඩයෙක් යැයි කියමනක් ඇත. සුදේශ් උපන් ගෙයි පච්චකාරයෙකි. ඒ නිසාම ඔහු මෝඩයෙකි.

මේ ලෝකයේ බොහෝ දේවල් බලෙන් ලබාගත හැක. එහෙත් කෙල්ලෙකුගේ ආදරයක් එසේ ලබා ගත නොහැක.

සමාධි අසනීප නොවුනා නම්... අපට දිගටම සිංගප්පූරුවේ ඉන්නට ලැබුණා නම්... ලංකාවට නොආවා නම් ජීවිතය මීට වඩා ලස්සනය.

මට ඇඬුණේ ඒවා සිහිවීය. සිංගප්පූරුවේ සෙරන්ගූන් පාරේ අපේ කුඩා නිවස මට සිහිවිය. මහා රාත්‍රියේ අත්වැල් පටලාගෙන සිංගප්පූරුවේ ඕර්චාඩ් උයනේ ඇවිද ගිය අයුරු මට සිහිවිය. මැක්ඩොනල්ඩ් අවන්හලකින් ස්ට්‍රෝබෙරි කැන්ඩි අයිස් ක්‍රීම් එකක් ගෙන මාරුවෙන් මාරුවට ලෙවකමින් පාරවල් දිගේ ගිය අයුරු මට සිහිවිය.

ඒ දවස් යළිත් ජීවිතයේ උදා නොවෙතැයි මට බියක් දැනුණි. මට ඇඬුණේ ඒ නිසාය.

පාන්දර ප්‍රථම අරුණැල්ල මාව දමා උන් කාමරයට යාංතමට ආවේය. මට හීල්ලින. තියටර් එකට යන්නට පෙර එන්න යැයි සමාධි කීවාය.

එකවරම ලැලි දොර ඇරිණි.

"උඹත් එක්ක ටිකක් කතා කරන්න ඕන..."

ඇතුළට ආ එකා කීවේය.

The Reader's Place Novel..

"මට උඹලා එක්ක කිසිම කතාවක් නැහැ... උඹලට ඕන නම් දැන්මම මාව මරලා දාපන්... උඹලා අම්මා කෙනෙක්ගේ බඩකින් නම් ආවේ මගේ මිනිය ගිහිල්ලා ගේ ඉස්සරහා දාපන්... තේරුණාද..."

මම එපමණක් කීවෙමි.

"මේ අහපන් පරයා..."

ආ එකා මගේ බඩට වැරෙන් පා පහරක් දුන්නේය. පුරා රැයක් දුක් විඳි මා ඒ පහරත් සමගම වැලි ගොඩේ යළිත් කඩා වැටුණෙමි.

"අ..ම්..මේ..."

මම බඩ අල්ලාගෙනම බිම වැතිරුනෙමි. එහෙත් ආ එකා මට එසේවත් ඉන්නට දුන්නේ නැත. ඔහු මගේ කමිසයෙන් අල්ලා මාව නැඟිට්ටවා බිත්තියට තල්ලු කළේය.

"මෙ බලපන්..."

"මා..ව මරපන්..."

"උඹට මැරෙන්න ඕනද..."

"මං මැරෙන්න බය එකෙක් නෙමෙ යකෝ..."

මම අමාරුවටම කෑ ගැසුවෙමි.

"මේ අහපන්... උඹ ආවේ සිංගප්පූරුවේ ඉඳලා නේද..."

මම කතා නොකර උන්නෙමි.

"උඹ කතා කරන්නේ නැනේ... මං කියන්නම්... උඹට තෝරගන්න චාන්ස් දෙකක් තියෙනවා..."

ඔහු තියුණු බැල්මකින් මා දෙස බලා උන්නේය.

The Reader's Place Novel..



"එක්කෝ උඹට අද රෑ දහයට කලින් මැරෙන්න පුළුවන්... උඹව අපි මරලා හංගන්නේ උඹේ මිනියවත් හොයාගන්න බැරි විදිහට... ඇට කටු ටිකවත් හොයාගන්න බැරිවෙයි..."

"නැත්නම්..."

මම කෑ ගසා ඇසුවෙමි.

"නැත්නම්... උඹට පුළුවන් අද රෑ දහයයි පහස් පහට සිංගප්පූරු ෆ්ලයිට් එක තියෙනවා... අපි උඹට ටිකට් එක ෆ්‍රී දෙනවා... උඹට තියෙන්නේ සිංගප්පූරුවට ලස්සනට ලෑන්ඩ් කරලා ආතල් එකේ උඹ කරගෙන ගිය රස්සාව කරගෙන යන්න... හැබැයි ආපහු ලංකාවට එන්න බෑ... තේරුණාද... උඹ දැන්මම වචනයක් දුන්නොත් හතර වෙද්දී උඹේ අතට ටිකට් එක දෙනවා... රෑ අටට උඹව අපි ගිහින් එයාර් පෝට් එකට ඇරලනවා... තේරුණාද... උඹට කාටවත් හම්බවෙන්න බැහැ... වියදමට උඹට ඩොලර් දාහකුත් දෙනවා..."

මම ඇඩ් වෛරයකින් කේන්තියකින් ඔහු දෙස බලා උන්නෙමි.

"බලපන් ඩෝ... මට මෙහෙම චාන්ස් එකක් ආවනම් මං දැන්මම යනවා... ආතල්නේ ඩෝ... මේ ගෑණු වගේද එහෙම ආතල් එකක් ගන්න එක... මෙහේ මොනාද ඩෝ බඩු... සිංගප්පූරු වලනේ බඩු ඉන්නේ..."

දැන් මට සියල්ල පැහැදිලිය. සුදේශ් හදන්නේ මාව බිය ගන්වා රටින් පිටමන් කරන්නටය. මම කල්පනා කළෙමි.

"උඹට පැයක් දෙනවා... හරියට කියපන්..."

මෙතනින් පැනගන්නට ඇති එකම උපාය මුන්ගේ තීරණයට කැමති වී කෙසේ හෝ එයාර් පෝට් එකට යාමය. එතැන් සිට කරනා දෙයක් කළ හැක.

ජීවිතය වෙනුවෙන් හුස්මක් ගන්නට පටන් ගත්තා පමණි. යළිත් කරදර කාලය ජීවිතයට ආවේය.

සුදේශ් දැන් සමාධි ළඟට ගොස් කුමක් කියනවා ඇත්ද... මා ගෙදර නොපැමිණි කල අම්මාත් තාත්තාත් අයියාත් කුමන තීරණයක් ගනු ඇත්ද...

මට සිංගප්පූරු යන්නට යැයි යෝජනා කළ එකා යළිත් ආවේ පැය දෙකකට පමණ පසුය.

"කොහොමද යාළුවා... මොකද කියන්නේ..."

The Reader's Place

"උඹලට කැමති දෙයක් කරපන්..."

"අපිටත් ඕන නෑ උඹව මරන්න..."

"එහෙනම් ඕන තුත්තුකුඩියකට මාව ගිහින් දාපන්... ඇයි මට වද දෙන්නේ..."

Novel..

"එහෙනම් බුවා ටිකට් එක රෙඩි කරන්නද..."

ඔහු මගේ ළඟ ඇණ තබාගෙන ඇසුවේය.

"මං කිව්වනේ උඹලගේ කැමැත්තක් කරපන් කියලා..."

"හරි... තව එකක්..."

ඔහු මට දඹරැගිල්ල දිගු කළේය.

"උඹව සිංගප්පූරු යවන්නෙ තනියම නෙමේ... අපේ එකෙක් එක්ක..."

මම සිනාසුනෙමි. කා එක්ක ගියද ගුවන් තොටුපළේ



මේ හයිකාරකම් කළ නොහැක.

"හොඳයි..."

ඉන් පසු මට බොන්නට වතුර වීදුරුවක් ලැබුණි. තව එකෙක් පැමිණ වැලි ගොඩ උඩට බත් පැකට් එකක් විසි කර ගියේය. අපට ජීවත් වන්නට සිදුවී ඇත්තේ මේ වැනි තිරිසනුන් වෙසෙන බිමකය.

* * * * * * * * *

"අපට උඹේ පාස්පෝට් එක ඕනේ..."

දහවල් පැමිණ මුලින් ආ එකා කීවේය. මටද එය අමතකය.

"පාස්පෝට් එක ගෙදර තියෙන්නේ..."

මම ඒ තරම් ගණන් නොගෙන කීවෙමි.

"උඹව යවන්න බැනේ ගේන්න..."

"මං නැතුව අම්මා දෙන්නෙත් නෑ..."

"එහෙනම් ඉතින් අවසන් ගමන් යන්න ලෑස්ති වෙයන්..."

"උඹලා කැමති දෙයක් කරපල්ලා..."

ඔහු කල්පනා කළේය.

"උඹේ යාළුවෙක් නැද්ද..."

"ඉන්නවා..."

"උගේ නම්බර් එකට කෝල් එකක් දීලා කියපන් ගේන්න කියලා..."

"මෙතනට..."

"මෙතනට නෙමේ..."

"එහෙනම්..."

"අපි කියන තැනට... උඹ කියපන් අපට දෙන්න කියලා... දීපන් නම්බර් එක..."

මම සුභාෂ්ගේ නම්බර් එක ඔහුට දුන්නෙමි.

ඔහු ඔහුගේ අතේ තිබූ ජංගම දුරකතනයෙන් සුභාෂ්ගේ අංකය එබුවේය. මුත් චණ්ඩි වුවද මෝඩ තකතීරු චණ්ඩිය. අපරාධ කරන්නන් මෙසේ ආවාට ගියාට තම ජංගම දුරකතනය භාවිතා කරන්නේ නැත.

"හරි රින්ග් වෙනවා... වෙන ටෝක්ස් ආලා තිබ්බොත් උඹ ඉවරයි කියලා හිතාගනින්..."

මම ජංගම දුරකතනය කණට තබාගත්තෙමි.

"සු..භා..ෂ් මං නිර්වාන්..."

"නිර්වාන්... මචං උඹට මොනාද උනේ... ඔක්කොම කලබල වෙලා... උඹ කොහෙද ඉන්නේ... හැමෝම උඹව හොයනවා... උඹට කරදරයක්ද..."

"මචං ම..ම.."

මම කියන්නට ආ දේ ගිල ගත්තෙමි. ඒත් සමගම පිස්තෝලයේ කට මගේ නළල අද්දරට ආවේය. ඔහු උන්නේ දත්මිටි කමින් මට රවාගෙනය.

"උඹට කරදරයක් නේද... කවුද උඹ ගාව ඔය ඉන්නේ... කියපන් බං..."

"මට ඒ මොනාත් කියන්න බැහැ මචං..."

මම එපමණක් කීවෙමි.



"හරි උඹට කවුරු හරි ගේමක් දීලද..."

"එහෙම කියල හිතපන් මචං..."

"හරි මට තේරෙනවා... උඹට දැන් ඔතන කතා කරන්න බැහැ... මං හොයාගන්නම්... මොකද්ද කෙරෙන්න ඕන..."

"මචං... අම්මගෙන් පාස්පෝට් එක ඉල්ලන් වරෙන්..."

"උඹේ පාස්පෝට් එක..."

"හරි මං ඉල්ලන් එන්නම්... කොහොමද මං ගෙනත් දෙන්නේ..."

එවර මට අවස්ථාවක් ලැබුණි.

"කොහොමද උඹලට පාස්පෝට් එක ගෙනත් ඕන..."

මේ දෙබස් සුභාෂ් අසාගෙනය. ඔහු එවිට සියල්ල තේරුම් ගනු ඇත.

"අතේ තියාගන්න කියන්න... අපි කෝල් කරන්නම්..."

"මචං... උඹ පාස්පෝට් එක අරගෙන අතේ තියාගනින්... කෝල් එකක් දෙයි..."

ඒත් සමගම සහචරයා මගේ අතින් ජංගම දුරකතනය උදුරාගෙන එය ක්‍රියා විරහිත කොට දැම්මේය.

"හරි... තව පැයක් දෙකක් ඇතුළත පාස්පෝට් එක ලැබෙයි... ඊට පස්සේ..."

"ඊට පස්සේ කතා කරගත්ත විදිහට උඹව එහෙට යවනවා..."

මා යළිත් තනිවිය. අඩුම වශයෙන් මට වූ දේ දැන් සුභාෂ් දනී. ඔහු සියල්ලන්ටම මේ ගැන කියනු ඇත.

The Reader's Place Novel..

මට හතුරන් උන්නේ නැත. මා ජීවත් වූයේ ඒ තරම් අහිංසකවය. මට උන් එකම සතුරා සුදේශ්ය. මට යමක් වුනාද කෙළින්ම එවිට සැක කරන්නේ සුදේශ්වය.

"ඔයාට මොනා හරි උනොත් මං ඌව තියන්නෑ... මරාගෙන මැරෙනවා..." සමාධි මේ කතාව කීවේ අනුරාධපුරයේදීය. ඒ ශ්‍රී මහ බෝධියට යන පාරේදී සුදේශ් මගේ හිසට පිස්තෝලය තබා තර්ජනය කරද්දීය.

මට සැනසීමක් දැනුණි.

කොහොමත් අපව වෙන් කරන්නට කිසිවෙකුට බැරි බව මම දැන උන්නෙමි. මම එය ඇදහුවෙමි. ඒ නිසා මගේ හිතට බරක් නැත. මීටත් වඩා දුෂ්කර කුණාටු සමයකට මාත් සමාධිත් මුහුණ දුන්නෙමු.

අපට අපේ ආදරය රැක ගන්නට සත් සමුදුරෙන් එපිටට පවා යන්නට සිදුවිය. අපි ගියෙමු. යළිත් ආවෙමු. එහෙත් අපේ ආදරයට කිසිවක් කරන්නට කිසිවෙකුටවත් නොහැකි විය.

ඒ නිසා මට මේ සියල්ල විහිළුය.

කිසිම දිනයක ආදරය නොකළ සුදේශ් වැනි කාලකණ්ණියන් ආදරයක ගැඹුර දන්නේ නැත. සැබෑ ආදරයකට විශාල ශක්තියක් ඇත. මා තවමත් ජීවත් වන්නේ ඒ ශක්තියෙනි.

සමහර විට මේ සියළු සැළසුම් හරි නොගියහොත් පාපයෙන් අන්ධ වී සිටින සුදේශ් මාව මරා දමන්නට පුළුවන. මා මරා දමා මගේ මිනිය කිසිවෙකුටවත් සොයාගන්නට බැරි තැනක දමන්නටද පුළුවන.

එහෙත් මේ කතාව එතනින් නතර වන්නේ නැත.



අප ආදරයෙන් බැඳුනේ එක ආත්මයක් උදෙසා නොවේ. ආත්ම ගණනාවක් වෙනුවෙනි.

මරණයෙන් අපව තාවකාලිකව වෙන් කළ හැක. එක ආත්මයකදී වෙන් කළ හැක.

එහෙත් ආදරයට ඊට වඩා දීර්ඝායුෂ ඇත. සැබෑ ආදරයකට දීර්ඝායුෂ ඇත.

සුභාෂ් කුමක් හෝ සැළසුමක් ක්‍රියාත්මක කරන බව මට විශ්වාසය. ඔහු එහෙම හොඳ හදවතක් ඇති කොල්ලෙකි. සාමාන්‍ය කොල්ලෙක් නොවේ. මට ඇත් නිවනක් ඇත. මාව මෙතනම මරා දමා උසාවි ගානේ බඩගාන්නට සුදේශ් කැමති නැත. ඔහු හදන්නේ මාව බයකර සමාධිගෙන් වෙන්කර සිංගප්පූරුවට යවන්නටය. සුදේශ් ආදරය ගැන දන්නා කෙංගෙඩියක් නැත. දන්නවා නම් මෙහෙම කරන්නේ නැත. ශරීරවලින් වෙන්කර ආදරවන්තයන්ව ඈත්කරන්නට සිතන්නේ ඒ නිසාය.

ආදරය සදාකාලයට හදවතේ දැල්වෙනා පහනකි. ඒ පහන නිවෙන්නේ නැත. නිවෙන්නට දෙන්නේ නැත. ළඟක උන්නද දුරක උන්නද ජීවතුන් අතර උන්නද මළවුන් අතර උන්නද ආදරයේ පහන දැල්වෙයි. සුදේශ්ට ඒ ටික කියාදෙන්නට කෙනෙක් ඇත්නම් ඔහු නිහමානීව අපගෙන් ඈත්වෙනු ඇත. එහෙත් මේ ලෝකය ඊට වඩා දරුණුය. සුදේශ් මේ කෙළ හලන්නේ සමාධිට පමණක් නොවේ. ඇයට උරුමවෙන්නට ඇති කෝටි ගණනක දේපොළ ටිකටද ඔහු බැල්ම දාගෙන ඉඳියි. එවන් වස්තු කන්දරාවක් සමඟ මලක් වැනි කෙල්ලෙක් ලැබෙන්නේ කළාතුරකිනි. මේ ඔහුගේ අතේ තිබූ ගොදුරය. සුදේශ් මේ තරම් පරල

The Reader's Place Novel..

වී ඇත්තේ අතේ තිබූ ඒ ගොදුර කටේ දාගන්නට බැරිවීම නිසාය.

මම කෙදිනකවත් සමාධිට උරුමවෙන මේ වස්තු කන්දරාව ගැන අබමල් රේණුවක තරමින්වත් හිතා නොමැත්තෙමි. කෙල්ල සිංගප්පූරුවේදී මට කිව්වේ වස්තු කියාය. මගේ සන්තකයමද ඇයමය. මේ සියළු වස්තුව ගෙන කෙල්ලව පමණක් මට දෙන්නයැයි මම ජයසූරිය මහතාට කීවේ ඒ නිසාය. ඇත්තටම මට ඇය පමණක් ඇතිය.

ඇයව ලැබෙනම් යළිත් සිංගප්පූරුවට ගොස් අපේ කුඩා ඇනෙක්ස් කැල්ලෙන් මට ජීවිතය පටන් ගන්නට පුළුවන. එහෙත් ජයසූරිය මහතා තවම මට කෙල්ලව දුන්නේ නැත. ඔහු කීවේ කෙල්ලව මරණයෙන් මේ පැත්තට ඇදගන්න කියාය. මගේ ආදරයට එය කළ හැකි යැයි ඔහු තුළ අල්ප මාත්‍ර හෝ විශ්වාසයක් තිබෙන්නට ඇත. ඔහු අරම කතාවක් කීවේ ඒ නිසාය. තම දුවගේ ජීවිතයේ පණ නළ ඇත්තේ ලංකා හොස්පිට්ල් හී හෘද විශේෂඥ වෛද්‍යවරුන් අත නොව ඇයගේ මහත්තයාගේ ආදරය තුළයැයි ඔහු සිතන්නට ඇත.

මට කෙල්ල ළඟ ඉන්නට දුන්නේ ඒ නිසාය.

එහෙත් එය මට ඔප්පු කර පෙන්වන්නට සුදේශ් ඉඩක් දෙන්නේ නැත. ඔහු මාව ගෙනවිත් මෙහේ හිරකරගත්තේ ඒ නිසාය. හාස්කමක් වෙනතුරු මම බලාගෙන උන්නෙමි.

දැන් උදෑසන අටට පමණ වෙන්නට ඇතැයි මට සිතුනේ මාව හිරකර අත් තැනට එහායින් වැටී තිබූ



උදෑසන හිරු එළියේ කහ පාට නිසාය. මැරයන් කියන්නේ ගමන් බලපත්‍රය ලැබුනොත් අද රෑට ඇති ෆ්ලයිට් එකෙන් මාව සිංගප්පූරුවේ යවනා බවය. ඔවුන් කොතරම් මෝඩ මැරයන්ද කියා මම සිතුවෙමි. ගමන් බලපත්‍රය ඉල්ලන විටම සුභාෂ් යමක් සිතාගන්නට ඇත. හදිස්සියේ රහස් පොලීසියට මේ ගැන කිවහොත් ඔවුන් නිසැක වශයෙන්ම සිතන්නේ එක දෙයකි. පැයක් ඇතුළත මේ ගමන් බලපත්‍රයේ ඇති නමට ගුවන් ටිකට් පතක් නිකුත් වූවාද කියා බලන්නට පුළුවන. ශ්‍රී ලංකාවට එසේ ගුවන් සේවා දහයක් දොළහක් එන්නේ නැත. ගමන් වාර පවත්වාගෙන යන ගුවන් සේවා දෙක තුනක ඇති දත්ත ඇදීමෙන් පමණක්ම එය සොයාගන්නට පුළුවන.

රහස් පොලීසියට කරන්නට ඇත්තේ එය සොයාගෙන ඒ වෙලාවට ගුවන් තොටුපළට ඇවිත් ඉන්න එක පමණය. සියල්ලන්වම ලස්සනට කොටුකරගන්නට පුළුවන. සුභාෂ් කරනා දෙයක් කරනු ඇත. මට ඇත්තේ මගේ ආදරය නාමයෙන් මගේ දුප්පත් දෙමව්පියන්ගේ නාමයෙන් මේ වැළි ගොඩ මැදට වී සත්‍ය ක්‍රියාවක් කරන්නට පමණි.

කෙල්ල දැන් මාව ඇස් කරකවමින් සොයමින් සිටින බව මම දනිමි. ඇය එහෙමය. ලෝකය කියා දැක්කේ මාවය. ජීවිතය කියා දැක්කේද මාවය. ඒ ඇස්වල මා හැර අන් කෙනෙක් අන් යමක් නැත. අවසන් වරට ගිලන් ඇඳ මත තිබූ සමාධිගේ කෝටු වී ගිය වත මට සිහිවිය. ඒත් සමඟම මගේ දෑස් අසාමාන්‍ය ලෙස තෙත්ව ගියේය. දෙවියන් අපව සොය සොයා වදදෙයි.

The Reader's Place Novel..

සුභාෂ් හා මධු ගොස් මේ ගැන ජයසූරිය මහතාටද කියන බව මම දනිමි. ජයසූරිය මහතා මේ වෙන දේවල් පිටුපස ඇතැයි මම අබ මල් රේණුවක් තරමින්වත් නොසිතමි. ඔහු එහෙම බාල අදහස් ඇති මිනිසෙක් නොවන බව මම දනිමි.

සියල්ල ඇත්තේ දෙවියන් අතය. ඕනානම් තව ටිකක් දුක් දී බලන්නට පුළුවන.

කොහේදෝ යන පූස් පැටියෙක් පැමිණ මැරයන් මට විසිකර ගිය බත් මුල ඉව කළේය. එය පිළුණු වී ගඳ ගසමින් තිබිණ. පූසාද එය කෑවේ නැත. මට හීල්ලින. මම ඇස් පියා ගත්තෙමි. අමාරු දුෂ්කර වෙලාවකදී සිත සන්සුන්ව තබාගත යුතුය. දුෂ්කර වෙලාවකදී මුලින්ම නැතිවෙන්නේ සිහියය. රැකගත යුත්තේද එයමය. බුදුන් වහන්සේ කියා ඇත්තේ එයය. මම ඇස් පියාගෙන 'සබ්බ පාපස්ස අකරණං' ගාථාව සෙමෙන් මැතිරුවෙමි.

* * * * * * * * *

දෙපැයක් ගතවිය. මැරයන් යළිත් මා කරා ආවේ උදේ නමයට දහයට පමණය. වේලාව එහෙම වෙන්නට ඇතැයි මට සිතුණි. එකෙක් අතේ බ්‍රවුන් පේපර් බෑගයක ඔතා තිබූ යමක් විය. එය නිසැක වශයෙන්ම මගේ ගමන් බලපත්‍රය වෙන්නට ඇතැයි මම අනුමාන කළෙමි. අම්මා එය දෙද්දී ඇවිලෙන්නට ඇත. එහෙත් මගේ අම්මා ලේසි පාසු ගැහැණියක් නොවේ. දසතින් එන දහසක් අකම්පා අතරත් ආත්ම ශක්තියෙන් ඉන්නා අම්මා කෙනෙකි. ඒ



ගැන මට විශ්වාසය. තමාගේ පුතාට එහෙම අනතුරක් කරන්නට බැරිබව ඇය දනී. ඒ ඇගේ විශ්වාසයය.

"උඹගේ යාළුවා ආවා..."

ප්‍රධාන මැරයා යැයි සිතිය හැකි එකෙක් කීවේය. මම බලාගෙන උන්නෙමි. කුසගින්නක් නැතද මාව හාමත්වී තිබුණි. මගේ ඇස් අරින්නට පවා අමාරුය.

"පා..ස්..පෝ..ට් එ..ක උ..ඹ..ලා..ට ලැබුණද..."

මම ඇසුවෙමි. ඔහු සිනාසුනේය. පව්කාරයෙක්ට ලස්සනට සිනාසෙන්නටවත් දන්නේ නැතැයි මට සිතුණි. හදවත පැහැදිළි නැති කෙනෙක්ට ලස්සන සිනාවක් ලැබෙන්නේ නැත.

"මේ බඩු... ඌ හොඳ එකා... ලස්සනට අපිට පාස්පෝට් එක දීලා ගියා... අපි ඌට කියලා තියෙන්නේ... සද්ද නොකර හිටියොත් යාළුවා සනීපෙන් ඉඳී කියලා..."

මම යටි සිතින් සිනාසුනෙමි. සුභාෂ් එහෙමය. ඔහුට රඟපාන්නට හොඳට පුළුවන.

"හ..රි.. උඹ අපි කියන විදිහට වැඩේ කළානේ... එහෙනම් අපිත් අපේ යුතුකම කරනවා... රට ලෑස්තිවෙයන් ල..ස්..ස..න සිංගප්පූරුවට යන්න... ගිහින් එහෙට වෙලා ආතල් එකේ ඉඳපන් ඩෝ..."

ඔහු කීවේය. මම අමාරුවෙන් හිස වැනුවෙමි. මේ පව්කාරයන් ළඟ සිටිය යුත්තේ එහෙමය.

"උඹට අපි කිටක් අරන් දෙන්නම්... අරගෙන යන්න උඹට තව මොනවද ඕනේ... කියපන්..."

මැරයා ඇසුවේය.

The Reader's Place Novel..

"ම..ගේ එ..හේ යාළුවට එයාපෝට් එකට එන්න කියන්න ඕන... මාව ගන්න... මගේ අතේ සල්ලිත් නෑ... සිංගප්පූරු ඩොලර්... යාළුවා ඉන්නවානම් සල්ලි ඕන වෙන එකක් නෑ..."

"හ..රි අපි උඹට යනකොට කෝල් එකක් අරන් දෙන්නම්... දැන්මම බෑ බුවා... හරි..."

මගේ ඒ සැළසුම හරි ගියේ නැත. රවීට ඇමතුමක් ගත්තානම් රවී එහෙමම සුභාෂ්ට ගන්නා බව මම දැනගෙන උන්නෙමි.

"දැන් ටිකක් රෙස්ට් එකේ ඉඳපන්... අපි වෙලාවට උඹව එයාපෝට් එක්කගෙන යන්නම්..."

මම හිස වැනුවෙමි. දැන් සුභාෂ් ක්‍රියාත්මක විය යුතුය. එළියේ වෙන කිසිවක් මා දන්නේ නැත.

"කාපන්..."

එකෙක් පැමිණ මට මාළු පාන් ගෙඩි දෙකක් විසිකර ගියේය. මම ඒ පැත්තවත් නොබැලුවෙමි. එහෙත් වතුර උගුරක් දෙකක් බිව්වෙමි. මට බඩගින්නේ ඉඳ පුරුදුය. පුරුදු නැත්තේ මගේ ආදරය නැතුව ඉන්නය. මධූ කෙල්ලට දැන් දහසක් බොරු කියන බව මම දන්නෙමි. කරන්නට දෙයක් නැත. මේ අමාරු වෙලාව පන්නා ගත යුතුය. අද රෑට මට කෙල්ල ළඟ ඉන්නට හැකිබව මම දන්නෙමි. එහෙම නොවේනම් මේ ලෝකයේ දෙවියන් කියා කෙනෙක් නැත. කුමන හෝ බලපෑමකට යටත්ව මට ෆ්ලයිට් එකට නඟින්නට සිදුවුවහොත් මම එය යන්නට පෙර පපුවේ අමාරුවක් හෝ ගන්නෙමි. හාට් ඇටෑක් එකක් ආ රෝගීයෙක්ව ෆලයිට් එකේ තබාගෙන



ඔවුන් යන්නේ නැත. හැකි ඉක්මනින් මෙඩිකල් ඉමර්ජන්සි දමා මාව රෝහලකට රැගෙන යන බව මම දන්නෙමි. එසේ කළ හැකි සියල්ල ගැන මම සිතාගෙන උන්නෙමි.

ඇරත් ගුවන් තොටුපළ ඔවුන්ගේ නොවේ. මට පැන ගන්නට පුළුවන. ගුවන් තොටුපළේ වොෂ් රූම් එකක හෝ සැඟවී සිට මට උදේ පාන්දර පැන ගන්නට පුළුවන. සියල්ලටම වඩා පොඩි කලබලයක් කර මට ගුවන් තොටුපළ ආරක්ෂක නිළධාරීන්ට මේ ගැන කියන්නට පුළුවන. මාත් සමඟ උන්ගේ කෙනෙක්ව එවන බව මැරයා කීවේය. එවිට ඔහුව ගුවන් තොටුපළ ආරක්ෂකයන්ට එහිදීම අල්ලා දෙන්නට පුළුවන.

මේ සියල්ල කරන්නට වෙන්නේ සුභාෂ් සැළසුමක් ක්‍රියාත්මක කර නැත්නම්ය. එසේ නොකර ඉන්නේ නැති බව මම දනිමි. දැන් කොල්ලාට සියල්ලට පැහැදිලිය. මාව හිරකරගෙන ඉන්නේ කවුද කියා සුභාෂ් ඉන්තේරුවෙන්ම දනී. ගමන් බලපත්‍රය ඉල්ලද්දී වෙන්නට යන දේ ඔහු සිතාගනු ඇත. රහස් පොලීසියේ ඉන්නේ බබාලා නොවේ. අපරාධ ගැන හොඳට අත්දැකීම් ඇති අයය.

සුභාෂ් ගමන් බලපත්‍රය අහිංසකයෙක් සේ ගෙනවිත් දී ඇත්තේ තවමත් මා ඉන්නේ උන්ගේ අත් අඩංගුවේ බව දන්නා නිසාය. මගේ ජීවිතයට තරකක් වී මැරයන් පොලීසියට කොටුකර දී එලක් නොවන බව සුභාෂ් හොඳින්ම දනී.

කොහොමත් මහ වෙලාවක් නැත.

වේලාව දහවල් එක පමණ විය. තව පැය හත

The Reader's Place Novel..

අටකින් මැරයන් මාව ගුවන් තොටුපළට එක්කාගෙන යනු ඇත. සියල්ල කළ යුත්තේ මේ පැය හත අට තුළදීය.

මම ශක්තිය ඉතුරු කරගන්නට ඇස් පියාගෙන උන්නෙමි. පැන යන්නට හෝ ශක්තිය අවශ්‍යය.

"බුවා නිදි... දැන් ඌ සැනසිල්ලේ ඉන්නේ බොස්.."

මගේ ළඟ උන් මැරයෙක් කාටද දුරකථනයෙන් කියනවා මම අසාගෙනය. මම දිගටම එසේ උන්නෙමි.

"හරි බොස්... හතට අපි පිටවෙනවා... අට වෙද්දී එයාපෝට් එකේ... ඕ..ව්..."

කතාකරන්නේ සුදේශ් කියා මම සිතුවෙමි.

"හරි බොස්..."

ඇස් පියාගෙනම සිටිද්දී මට මැවී මැවී පේන්නේ කෙල්ලවය. ඇගේ එන්නත් කටු ගැසූ කෝටු අත් දෙකය. පියාගත් ඇස් යටින් තෙත්වෙගෙන එනවා මට දැනෙයි. වැඩි වෙලාවක් නොගොස් පියවී ගිය ඇස් අතරින් තෙත කඳුළක් පැන්නේය. ජීවිතය මේ තරම් දුකය. ඒතරමටම කරදරය.

* * * * * * * * *

වේලාව හවස පහය. මැරයන් මට නාගන්නට ඉඩක් දුන්නෝය. මම අමාරුවෙන් ඇඟට වතුර ටිකක් දාගත්තෙමි. ශරීරයේ තැන තැන සීරී තිබුණි. ඒවාට වතුර වැටෙද්දී දැවිල්ලක් දැනුණි. එහෙත් සියල්ලම මම දරාගෙන උන්නෙමි. ජීවිතයේ වේදනාව ගැන සිතද්දී මේ සීරීම්



නිසා ඇතිවෙන වේදනාව මහ දෙයක් නොවේ.

"හ..රි කිට මරාගනින් දැන්... බුවා ලස්සනට යන්න ඕනනේ..."

එකෙක් පැමිණ කීවේය. මේ එකෙක්වත් සාමාන්‍ය පෙළ තරමටවත් පාසල් ගොස් නැතැයි මට සිතුණි. මේ අසික්කිත රස්තියාදුකාර භාෂාව කියන්නේ ඒකය. කෙනෙක්ව හදන්නේ ඔප මට්ටම් කරන්නේ ඔහුගේ අධ්‍යාපනයය.

මම අමාරුවෙන් ඇඳගත්තෙමි. තෙත් කොණ්ඩය අතින් හදාගත්තෙමි. තව පැයකින් මාව ගුවන් තොටුපළට රැගෙන යන බව මම දැන් දන්නෙමි. හිත සන්සුන්කරගෙන සිටිය යුත්තේ දැන්ය. අමාරුම මෙහෙයුම පටන් ගත්තේ දැන්ය.

ටික වෙලාවකින් මැරයන් සියල්ලන්ම මාව වටකර ගත්තෝය. මම ගොඩගසා තිබූ බ්ලොක් ගල් ගොඩක ඉඳගෙන උන්නෙමි.

"උඹ දැන්නේ ලස්සන... කොහොමද දැන් ලෑස්තිද එයාපෝට් යන්න..."

"ම..ම ලෑස්තියි... අතේ සතයක් නැතුව සිංගප්පූරුවේ ලෑන්ඩ් කරන්න බෑ... මට සල්ලි ඕන..."

මම එසේ කීවේ මම සතුටින් සාමධානයෙන් සිංගප්පූරු යන බව අඟවන්නටය. කලබලයක් නොකර මාව ගුවන් තොටුපළට ඇරලවන්නේ එවිටය.

"උඹත් මාර පොරක්නේ බං... හරි.. අපි උඹට දෙන්න ඩොලර් ටිකක් ගත්තා... ඩොලර් සීයක්... ඇතිනේ..."

The Reader's Place
Novel..

"ඇ..ති..."

"අපේ එකා ෆ්ලයිට් එකට නඟින වෙලාවට උඹට යාළුවට කෝල් එකක් අරන් දෙයි... ඒ වෙලාවට කියපන්... හරි..."

මම හිස වැනුවෙමි. දැන් සියල්ල සූදානම්ය.

"උඹ ගොනා වගේ හිතනවා ඇති එහේ ගියා අනිත් ෆ්ලයිට් එකේ ආවා කියලා.. ඒවා වානා සනා... අපේ එකා එහේදී උඹේ පාස් පෝට් එක ගන්නවා... ඒක තියෙන්න් ඌ ළඟ ටික දවසක්... හරි... උඹට ඒක ආයෙත් ලැබෙන්නේ මෙහේ කතන්දරයක් ගියාම තමයි..."

The Reader's Place

"හ..රි... මම එකඟයි..."

"උඹ මරුනේ..."

මම යටි සිතින් සිනාසුනෙමි.

Novel..

"එයාපෝට් යනකොට සද්ද බෑ හරිද සනා... කට වහගෙන යන්න ඕන... නැ...ත්..නා..ම් එයාපෝට් එකට යන්න කලින් උඹට පරලොව යන්න පුළුවන්..."

මගේ මුහුණටම පිස්තෝලට තබා එකෙක් කීවේය. මම දෙනෙත් බරකරගත්තෙමි.

"මම කිව්වනේ මම යනවා කියලා... ඇයි උඹලා මට වදදෙන්නේ..."

ඔහු සිනාසුනේය. තමාගේ ගේම හරි කියා ඔහු දැන් සිතනු ඇත. බොහෝ අපරාධකරුවන් සිතන්නේ එහෙමය.

* * * * * * * * *



මාව පිටතට ගත්තේ මගේ මුහුණ වසාය. වෑන් රියේ බිම මාව දමාගෙන උන් එකා මගේ මුහුණටම පිස්තෝලය තබාගෙන උන්නේය. අතුරු පාරවල් දෙක තුනකින් වාහනය හැරවෙනවා මම නිරීක්ෂණය කළෙමි. ඊටත් පසු රේල් ගේට්ටුවක් අසළ වාහනය නතර විය. ටිකකින් දුම්රියක් වේගයෙන් යන හඬ ඇසුණි. මා ඉන්නේ කොළඹ කිට්ටුවමය. මට එය දැනෙයි. එක්කෝ වැල්ලවත්තේය. නැත්නම් බම්බලපිටියේය. ඒත් නැත්නම් නාරාහේන්පිටය.

තරමක වැස්සක් අවට වැටෙන හඬ මට ඇසෙයි. මේ වෙලාවට ආරක්ෂක බැරියර්ස් වලින් වාහන නවත්වන්නේ නැත. එය මගේ අවාසියට හේතුවිය. ටිකකින් පොදය වැස්සක් වූ බව මට හැඟිණ.

"මෙහෙන් දාපන් බං... බේස්ලයින් දාලා යන්..."

එකෙක් කීවේය. මාත් සමඟ 'මැරයන් හතර පස් දෙනෙක් ඉන්නා බව මට දැන් දැනෙයි. මගේ මුහුණට පිස්තෝලට තබාගෙන උන් එකා ළඟින් එන්නේ ඉවසගන්නට අමාරු මත්පැන් ගඳකි. බාල මිනිසුන් ළඟින් මේ එන අපුල මත්පැන් ගඳ ඉවසන්නට අමාරුය. ටිකකින් ඔහු දුම් වැටියක්ද දල්වා ගත්තේය. දැන් ගඳ දෙගුණ වී දැනෙයි.

දැන් වාහනය යන්නේ බේස්ලයින් පාරේ බව මට දැනෙයි. තරමක් වේගයෙන් යන්නේ ඒ නිසාය. සුහාෂ් කවරාකාරයේ සැළසුමක් දියත්කර ඇත්දැයි මට සිතාගන්නට නොහැක. එහෙත් ඔහු යමක් කරන බව පැහැදිළිය. අයියාත් ඔහුගේ ජීවිතයෙන්ම එයට එක්වෙන්නට ඇත. ඔහු මට කොතරම් ආදරය කරනවාද

කියා මම දන්නෙමි.

මට කිසිවක් කරන්නට නොහැක. තමන්ගේ සැළසුම වතුරේ යන බව සිතුනහොත් මේ ඇමරිකයන් මට වෙඩිතබා මගේ සිරුර කැළණි ගඟට දමා යන්නටත් බැරි නැත. සාහසිකයන් ඉන්පසු වෙන දේ ගැන සිතන්නේ නැත. සිතන්නේ ඒ මොහොත ගැන පමණකි.

කොහොමටත් ඉදිරි පැය දෙක තුන තීරණාත්මකය. වෙන දෙයක් වෙන්නේ මේ විනාඩි එකසිය අසූව තුළය. ඒත් දෙවියන්ට යමක් කරනවානම් විනාඩි එකසිය අසූවක් ඕනා නැත. තත්පර තිහක් හොඳටම ඇතිය.

වාහනය එක දිගට මීගමුව කොළඹ පාරේ ඇදීගෙන යන්නට විය. වත්තල කඳාන කඩ සාප්පුවල දල්වා ඇති නියොන් පුවරුවල එළිය මගේ ඇස් වසා ඇති කළු රෙද්ද අතරින් මට පෙනෙන්නට විය.

මහ වෙලාවක් ගියේ නැත. වාහනය සීඝ්‍රව පසු කළේය. ඉන්පසු කටුනායක ගුවන් තොටුපළ පාරට ඇමිණි. එය මා දැනගත්තේ එක දිගට ආ වාහනය දකුණට හරවද්දීය. එසේ හරවන්නේ ගුවන් තොටුපළ ළඟදීය.

මට දුකය. සමාධිත් මාත් සිංගප්පූරුවට ගිය රෑ මට සිහිවිය. එදා හදවතේ තිබූ සතුට අදටත් එහෙමමය. එහෙත් දෛවය අපට එකට ඉන්නට දුන්නේ නැත. එදා සිට මේ රෑ දක්වා දුන් දුක නිමක් නැත. මෙසේ දුක් දිදී දෙවියන් තවමත් මාව පරීක්ෂා කරනවාද කියා මම නොදනිමි. එහෙත් දෙවියන්ට විනිවිද පෙනන ඇසක් ඇත. එහෙම බලනවානම් මේ දුප්පත් නිර්වාන්ගේ හදවත ඔහුට පෙනිය යුතුය.



"මූව දැන් ලෙහපන්... මෙතන එයාපෝට් බැරියර් එක..."

මගේ හුස්ම නතරවිය. එකෙක් මගේ මුහුණ වසා තිබූ කළු රෙදි කඩ ඉවත් කළේය. ඒත් පිස්තෝලය දිගටම එහෙමමය.

"උඹට ඕනෙන්ම මෙතනදී දඟලලා පනින්න පුළුවන්... හරි.. ඒත් බුවා එහෙම බෑ... උඹේ කෙල්ල ඉන්න රූම් එක ළඟ මේ වෙලාවේ අපේ එකක් ඉන්නවා... ලංකා හොස්පිට්ල් එකේ රූම් එක ළඟ... හරි... උඹ මොනවාහරි කළොත් ඒකීත් ඉවරයි.. අපිට මහ දෙයක් කරන්න නෑ... කරන්න තියෙන්නේ උඹේ කෙල්ලගේ සේලයින් බටේ ෂේප් එකේ ගලවන්න විතරයි..."

මම තනිවම සිනාසුනෙමි. මේ හදන්නේ මාව බයකරන්නටය. කොළඹ ඇති දියුණුම පුද්ගලික රෝහලකදී එහෙම කරන්නට නොහැක. මොවුන් හිතන්නේ මා ඒතරම් මෝඩයෙක් කියාය.

"කෙ..ල්..ල..ට මොනවත් කරන්න එපා... මම මොනවත් කරන්නේ නෑ... මම කිව්වනේ..."

"ෂේප්... එහෙම කතාකරපන්... අපිට උඹත් එක්ක ගේමක් නෑ..."

ඔහු කීවේය. ගුවන් තොටුපළ ආරක්ෂක බැරියර් එක ළඟදී වාහනය නතර කෙරිණ. එතන ඉන්නේ ගුවන් හමුදාවය.

"කොහෙද යන්නේ..."

ඔහු වාහනයට එබී ඇසුවේය.

The Reader's Place Novel..

"අපි මේ මල්ලිව බස්සන්න යනවා..."

"කොහෙද යන්නේ..."

"සිංගප්පූරුවට..."

"කෝ ගන්න පාස් පොට් එකයි ටිකට් එකයි..."

මැරයන් එය දුන්නේය. පසුව ඔහු මගේ මුහුණ දෙසද බැලුවේය.

"ම්.. යන්න..."

ගුවන් හමුදා සෙබලා සාමාන්‍ය ලෙස කීවේය. එහෙත් ඔහු මගේ මුහුණ දෙස අවසන් වරට බලා යන්නමට සිනාසුනේය. ඔහු යමක් දන්නා බව මට ඉවෙන් මෙන් දැනුණි. මගේ හිතට තුනී සැනසීමක් දැනුණි. සුභාෂ් මේ කොහේ හෝ සිටිය යුතුය.

"ගේමක් නෑ බොස්... අපි එයාපොට් එකේ... ආ හරි... දැම්මා ආවා... ඔ..ව්... රංජියා යනවා උඹ එක්ක..."

කතාකරන්නේ කවුරු හෝ මේකට අණ දෙන කෙනාය. මොවුන්ට ඉහළින් තවත් ලොකු මැරයෙක් සිටිනවා විය යුතුය.

පිටවීමේ පර්යන්තය අසළ වාහනය නතර විය.

"සද්ද බෑ මල්ලී.. හරි... හොඳ බුවා වගේ යන්නයි තියෙන්නේ... මොනවාම හරි කරලා තිබ්බොත්... උඹේ අම්මයි තාත්තයි සදහටම දෙනෙත් පියාගත්තා කියලා හිතාගනින්... හරි... ඩුෂුම් ඩුෂුම්... සත්තරං දෙම්ව්පියෝ තත්තපරෙන් නිසළයි... හරි... ඒක හොඳට මතක තියාගනින්... අපි එහෙමයි..."

මගේ හිතට දුකය.

The Reader's Place
Novel..



"හරි එහෙනම් බැස්සා... චෙක් ඉන් වුණා ගියා... හරි..."

මම අවසන් වතාවට ඔවුන් දෙස බැලුවෙමි. දවසක හඳුනාගැනීමේ පෙරට්ටුවකදී මොවුන්ව හඳුනාගත යුතුය. මගේ දෛවයේ හමුවූ සාහසිකම මැරයන් හතර දෙනාගේ මුහුණුවර මට හොඳට මතකය. ඒත් මම බලාගෙන උන්නෙමි.

"මොකද ඩෝ බලාගෙන ඉන්නේ..."

ඔහු ඇසුවේය.

"මම එහෙනම් යනවා... කෝ මාත් එක්ක එන උඹලගේ එකා..."

"රංජියා එහෙනම් පලයන් මූ එක්ක..."

මම අවසන් වතාවටත් බැලුවෙමි. කිසිවක් වූයේ නැත.

"හරි පලයන්..."

ඔහු කීවේය. මම හැරුනෙමි. ඒත් සමගම සිවිල් පිට උන් පොලිසියේ යැයි සැක කළ හැකි දහදෙනෙක් පමණ විත් මැරයන් සියල්ලන්වම අල්ලාගත්තෝය.

"මේ මො..ක..ද මේ... අපි මේ මල්ලිව බස්සන්න ආවේ..."

එකෙක් කීවේය.

"ආ මල්ලිව බස්සන්නද ආවේ... අපි ගිහින් ටිකක් අයියවත් බලාගෙන එමුකෝ..."

එතන සිට තරුණ පොලිස් නිළධාරියා කීවේය. ඒත් සමගම සුභාෂුත් අයියාත් දුවගෙන ආවෝය. මට පුදුම

සිතුණි.

"ම..ල්..ලී..."

අයියා මාව වැළඳගත්තේ අඬමින් මෙන්ය.

"උඹට කරදරයක් නෑ නේද කොල්ලෝ..."

සුභාෂ් මගේ හිස අතගා ඇසුවේය. මම සිනාසුනෙමි. කඳුළු අතරින් සිනාසුනෙමි.

"උඹ එනවා කියලා මම දැනගෙන උන්නා... උ..ඹ..ට පින් කොල්ලෝ..."

"මරු ගේමක් දුන්නේ..."

සිවිල් පිට ආ පොලිස් ඉන්ස්පෙක්ටර් අපි අතරට ආවෝය.

"නිර්වාන්ට කරදරයක් නැනේ..."

"නෑ ස..ර්.. සර්ලට ගොඩක් පින්..."

ඔහු සිනාසුනේය.

"අපි ආවේ නැත්නම් එහෙනම් ඔයා සිංගප්පූරුවේ යනවා...නේ..."

"එහෙම වෙන්නේ නෑ සර්... මම ඩිපාච හෝල් එකේ වෙනම ගේමක් දෙන්න හිටියේ... සුභාෂ් ආවේ නැත්නම්..."

ඔහු සිනාසුනේය.

"සුභාෂ් කිව්වා... ලේසියෙන් එහෙම පැරදෙන කොල්ලෙක් නෙමෙ කියලා..."

ඒත් සමගම සුභාෂ්ගේ දුරකථනයට ඇමතුමක් ආවේය.

The Reader's Place Novel..



"ඔ..ව් සර්... අපි කොල්ලව බේරගත්තා... ඔ..ව් මෙ අපි එක්ක ඉන්නවා... ඉන්න මම දෙන්නම්..."

මට පුදුම සිතුණි. කතාකරන්නේ කවුද..?

"ජයසූරිය සර් කතාකරන්නේ... ගනින්..."

මට පුදුමය.

"ස..ර්..."

"ඔයාට කරදරයක් නෑ නේද නිර්වාන්..."

"න්..නෑ සර්... ස..ර් මේ..වා ද..න්..න..ව..ද..."

"අපි ඔක්කොම හිටියේ බයෙන්.. මේ ඔයාගේ අම්මයි තාත්තයිත් මම ළඟ..."

මට පුදුමය.

"මම ඩීඅයිජීටම කතාකරලා ඔක්කොම ඇරේන්ජ් කළා... බයවෙන්න එපා... හිමිහිට එන්න..."

ජයසූරිය මහතා කීවේය.

"ස..ර්..ට ගොඩක් පින් ස..ර්... ම..ට.."

පර්යන්තය ළඟදී මට හැඬුණි. සුභාෂ් මගේ හිස පිරිමැද්දේය. පොලිස් ඉන්ස්පෙක්ටර් මා දෙස බලාගෙන උන්නේ දුක්බරවය.

"හා සර්... ම..ම එනවා... අම්මටයි බබාටයි කියනවද මට කරදරයක් නෑ කියලා..."

මම දුරකථනය පොලිස් ඉන්පෙක්ටර්ට දුන්නෙමි.

"හරි මිස්ටර් ජයසූරිය... කොල්ලා දැන් අපි ළඟ ආරක්ෂිතව ඉන්නවා.. බයවෙන්න එපා... මම එක්කගෙන එන්නම්... ම්..."

හැමදේම විසඳිනා. මැරයන් පොලිස් ජීප් රියේ නංවාගන්නවා මම සතුටින් බලාගෙන උන්නෙමි. පච්කාරයන්ට මෙහෙම වී මදිය.

"යමු..."

සුභාෂ් මගේ කරට අතක් දා කීවේය. මම අයියා දෙසත් සුභාෂ් දෙසත් මාරුවෙන් මාරුවට බැලුවෙමි.

"යන ගමන් ගේම ගැන කියන්නම් මචං... දැන් යන්..."

"ඔයාලා කා එකේ යන්න... මම පිටිපස්සෙන් එනවා..."

ඉන්ස්පෙක්ටර් අසිත් කීවේය. මම වාහනයට නැඟින්නට පෙර ඔහුගේ අතක් අල්ලාගත්තෙමි.

"ස..ර්..ට පින්... මම ස්තුතියි කියන්නේ නෑ..."

ඔහු මගේ උරතලයට තට්ටුවක් දැම්මේය.

"නිර්වාන් යන්න දැන්... අපි පස්සේ දවසක හම්බවෙමු... ම්... ඔයාගේ අම්මලා දෙන්නයි මිස්ටර් ජයසූරියයි ඔයාගේ බබයි ඔයා එනකල් බලාගෙන ඉන්නවා... දැන් යන්න..."

ඔහු කීවේය.

* * * * * * * * *

අයියා මගේ හිස පිරිමැද්දේය.

"උඹට මම මෙච්චරම ආදරෙයි කියලා මාත් දන්නේ



අද..."

අයියා කීවේය. ඔහුගේ ඇස් බොඳවී ඇත.

"ම..ට සමාවෙන්න අයියේ.. ම..ම නිසා හැ..ම..දා..ම කරදර..."

අයියා සිනාසුනේය.

"ජීවිතේ මේවත් තියෙන්න ඕන... නැද්ද සුභාෂ් මල්ලී..."

"නියම ගේම අපි දුන්නේ මචං..."

"ආ..."

"ඔක්කොටම කළින් අයියයි මායි හම්බවුණා... නුගේගොඩදී... අපිට මුළින්ම දැනගන්න ඕනවුනේ මේ ගේම පිටිපස්සේ ජයසූරිය සරුත් ඉන්නවද කියලා..."

"ස..ර් එහෙම කරන්නේ නෑ මචං කවදාවත්... ප්‍රතිපත්ති තියෙනවා සර්ගේ..."

"අපි ඒක දන්නවා.. ඒත් හැමදේටම වඩා දුවව වටිනවනේ.. ඒත් පස්සේ අපිට සුදේශ් කාරයගේ හැසිරීම් ඇල්ලුවේ නෑ... අපි ටිකක් ෆලෝ කළා උඹ..ව.."

"ම්..."

"උඹ ලංකා හොස්පිටල් එකේ කා පාක් එකේදී එකෙක් එක්ක කතාව... මම අහගෙන හිටියා ෂේප් එකේ... කතාකලේ උඹව ගත්ත එකෙක් එක්ක... මූ කියනවා කියනකල් උඹව එළියට ගන්න එපා කියලා එයාපෝට් යන්න... එතකොට වැඩේ අපි අල්ලගත්තා... ඒ ගමන්ම අපි ගියා ජයසූරිය සර්ව හම්බවෙන්න... කෙල්ල සූ ගාලා උඹව අහනවා.. මේ කෙල්ලට දැන් කියන්නද උඹව

The Reader's Place Novel..

උස්සලා කියලා..."

"අ..නේ..."

"අපි කිව්වා උඹ මහනුවර ගිහින් අපිටත් නොකියා දළඳා මාළිගාවට බාරයක් වෙන්න කියලා... උඹ එහෙමනේ... දෙයියන්ගේ පිහිටෙන් කෙල්ල ඒක විශ්වාස කළා..."

"ඉ..ති..න්..."

"ඊට පස්සේ අපි ගේම ප්ලෑන් කළා... ජයසූරිය අන්කල් කතාකළා ඩී අයි ජීට... හරි දුකෙන් කතාකළේ... කතාකරලා මොනවද දන්නවද කිව්වේ..."

"ම..චං..."

"මගේ පුතාව උස්සලා කියලා... අපිට පුදුමයි නේද අයියේ..."

මගේ ඇස් තෙත්විය.

"ඩී අයි ජී එහෙමම එව්වා ඉන්ස්පෙක්ටර් අසිතව... කොල්ලා මරු පොරක් බං... රත්නපුරේ කේස් එක බාරව හිටියේ අසිත තමයි... නියම බුලට් පොර... කොහොමහරි දොළහ වෙද්දී අපි හොයාගත්තා උඹේ පාස්පෝට් එකට ටිකට් එකක් ඉෂූ කරලා කියලා සිංගප්පෝරුවලට..."

"හා..."

"ඉතින් දැන් ගේම දන්නවනේ... වාහන හතරක් ආවා උඹව අරන් ආපු වෙහිකල් එක පිටිපස්සේ.. ඒත් අපි කලබල වුනේ නෑ.. උන් ළඟ ආයුධ තියෙනවා කියලා අපි දැනගෙන හිටියා... එයාපෝට් බැරියර් එකේ ඩියුටි හිටපු නේවි ඔෆිසස්ලට ඉන්ස්පෙක්ටර් අසිත් හැමදේම



කියලා තිබුනේ... එතනින් පාස්වෙනවත් එක්කම අපි ගේමට සෙට් වුණා..."

මට සියල්ල පැහැදිළිය.

"උඹට පින්..."

"හැමෝම එක දෙයක් විෂ් කළේ මචං... නේද අයියේ..."

"උඹ කාලා නෑ නේද..."

"දැන් බඩගිනි නෑ..."

සුභාෂ් වාහනය මඟ නතරකර ක්‍රීම් සෝඩා දෙකක් අරගෙන ආවේය.

"මේක බීපන්.. අපි ගිහින්ම කමු..හැමෝම බලාගෙන ඉන්නේ..."

"ක..ට්..ටි..ය එහෙද මචං..."

"ම.. මගේ කෙල්ල සමාධි ළඟ... මම පණිවිඩේ කිව්වා... කෙල්ල අඬනවා... අපි හිමිහිට නංගිට කියමුකෝ කතාව... දැන්ම හොඳ නෑ කම්පනය වගේනේ..."

"එ..යා..ට කොහොමද මචං..."

"කෙල්ල හිමිහිට සනීපවෙනවා මචං..."

මම මීගමු පාර දෙස මොහොතක් බලාගෙන උන්නෙමි. මගේ ඇස් තෙමාගෙන මෙන් කඳුළක් ගලාගෙන ගියේය.

* * * * * * * * *

The Reader's Place Novel..

“ඇ..යි මේ ර..ත්..තා..රං...”

සමාධි ඇසුවේ මධූ අඬන දෙස බලාගෙනය. මධූ මගේ මුහුණ මත ඇගේ දෑතම තමා සිනාසුනාය.

“මේකී ජීවත්වෙනකල් ඔයාට කරදරයක් කරන්න බෑ... ඔයා ජීවත්වෙනකල් මේකිට කරදරයක් වෙන්නෙත් නෑ... මේ ආ..ද..රේ පුදුමයි...”

ඇය කීවාය. කෙල්ලගේ දෑස් තෙත්ව යනවා මම බලාගෙනය.

“ඇ..යි සු..දූ මේ...”

මම මධූ දෙස බැලුවෙමි.

“උඹට කිව්වේ නැති දෙයක් පසුගිය පැය විසි හතරේ වුණා පැටියෝ...”

මධූ කීවාය.

“ඇ..යි මොකක්ද වුනේ සුදූ... නුවර නේද ගියේ... මාළිගාවට ගිහින් එනකොට ඇක්සිඩන්ට් එ..ක..ක් වුණාද... ආ...”

සමාධි ඇසුවාය. මම සිනාබරව ඇය ළඟට පැමිණ ඇගේ කෝටු අත් දෙකම අල්ලාගත්තෙමි. මට බැලුවේ ඇයගේ වමතට ගැසූ සේලයින් බටය දෙසය. මැරයන් ගලවනවා කිව්වේ එයය. සේලයින් නැතිවුවද කෙල්ල මා එනතුරු ජීවත්වෙන බව මම දනිමි. ඇය ජීවත්වෙන්නේ අපේ ආදරේ විෂ් එකෙනි.

“කි..ය..න්..න.. ඇයි මේ ඇස්වල කඳුළු...”

“ඔයා බයවෙයි මැණික...”

“එහෙම බයවෙන්නේ නෑ... මගේ මහත්තයා දැන්

The Reader's Place Novel



මම ළඟනේ... කියන්නකෝ...”

මම සමාධිගේ අතක් අල්ලාගෙන සියල්ලම කීවෙමි. නැත්නම් මගේ හිතටද හරි නැත. අපේ ආදරය කොතරම් බලගතුද කියා ඇයත් තේරුම් ගතයුතුය. කෙල්ල සනීප වෙන්නට ආත්ම ශක්තියක් ගන්නේ එවිටය.

“බ..ල්..ලා... ඌට පුළුවන්ද මගේ දේව දූතයෙක් වගේ ඉන්න කොල්ලට එහෙම කරන්න... ඌ දන්නේ නෑ අපේ ආදරේට දෙවියොත් ආශිර්වාද කරනවා කියලා.. පව්කාර බල්ලා....”

සමාධි බැන්නේ අඬමිනි.

“ඔ..යා..ට ගැහුවද සු..දූ...”

“මා..ව එහෙම ගහලා වට්ටන්න බෑ බබා...”

ඇය දුර්වල අතින් මගේ මුහුණ පිරිමැද්දාය. කෝටු අත්ල මුහුණ පුරා යද්දී දුකය.

“හැ..ම..දේ..ම හරි.. ඌ අපිට කළේ ලොකු උදව්වක් බබා..”

“ඇ..යි..”

ජයසූරිය මහතා කියූ සියල්ල මම සමාධිට කීවෙමි. ඇය කඳුළු අතරින් සිනාසුනාය.

“තාත්ති දවසක මේක කියනවා කියලා මම දැනගෙන උන්නා... එයාගේ බෑණා ළඟ ආදරේ හාස්කම් තියෙනවා... එයා ඒක තේරුම් ගත්තා එහෙනම්...”

ඇය කීවාය. මම ඇගේ අතක් පහත් වී සිපගත්තෙමි.

“ඒ බ..ල්..ල..ව ඇරෙස්ට් කළේ නෑ...”

“ඒවා පොලීසියෙන් ලස්සනට කරයි...”

"මම සාක්ෂි දෙන්නේ ඌ කරපු දේවල් ගැන.. මේ මම..."

"ඔයාව උසාවි ගෙනියන්නේ නෑ මම..."

මම කීවෙමි.

"ඔයා වෙනුවෙන් උසාවියට නෙමේ සුදූ... මම අපායට හරි යනවා.. මේ අපේ ජීවිතේ... අ..පේ චු..ට්..ටං අහිංසක ජීවිතේ..."

සමාධි කීවාය.

"ම..ට දැ..න් සනීපයක් දැනෙනවා මහත්තයෝ... අ..ර පපුවේ වේදනාව අඩුයි... හුස්මත් හිමිහිට ගන්න පුළුවන්.."

මට සැනසීමක් දැනුණි. දෙවියන් ඔහුගේ පරීක්ෂණය දැන් නිමාකරනවානම් හොඳය.

"අපි ඉක්මනට සනීපවෙලා ගෙදර යන්..."

"ම්...දැ..න් ජීවත්වෙන්න හරි ආ..ස..යි.."

සමාධි ලෝබකමින් කීවාය.

"මගේ මැණික තුණුරුවන් සරණින් සනීප වෙන්නකෝ... ජීවත්වෙන හැටි මම පෙන්නන්නම්... ම්..."

"ම්... දන්නවා... මගේ ජීවිත කතාවේ පුංචි වීරයා ඔයානේ... දහසක් බාධක කරදර අභියෝග මැදත් මාව රැකගත්ත මගේ වීරයා... මනුස්සකමින් සටන් කරපු මගේ රත්තරං ස්ටැලෝන්... දැන් හරි ආසයි ඔයාගේ පුතෙක්ව මේ බඩට ගන්න... ඔයා වගේම... පුංචි නිර්වාන් කෙනෙක්ව... මොකද මේ ලෝකයට ඕනේ ඔයා වගේ තව හතර පහක්..."

"එ..ච්..ච..ර බබාලා හදන්න හොඳ නෑ දැන්මම



බබාට..."

මම කීවෙමි. සමාධි සිනාසුනාය.

"බලන්නකෝ... මට දැන් දැනෙන ශක්තිය කියන්න තේරෙන්නේ නෑ... මෙතන ඉඳලා ජීවිතේ හැඩ බලන්නයි මට ඕන..."

මම සැනසුම් සුසුමක් හෙළුවෙමි. කෙල්ලව සනීපකරගෙන ගෙදර යනතුරු මටද නිවනක් නැත.

* * * * * * * * *

The Reader's Place Novel..

ඊටත් සති දෙකකට පසු සමාධිව ලංකා හොස්පිට්ල් එකෙන් ටිකට් කප්පවාගෙන මම රැගෙන ගියෙමි. කෙල්ල හොඳටම කෙට්ටු වී උන්නාය. කොළ පැහැගත් සායට සුදු පැහැගත් බ්ලවුස් එකක් අන්දවාගෙන මම ඇයව ගෙදර එක්කාගෙන ගියෙමි. කෙල්ලව එක්කාගෙන ගියේ ඇගේ නිවසටය.

එදා ගෙදර පුංචි සාදයක් මෙන්ය. හැමෝම පැමිණ උන්නෝය. ඒත් කෙල්ල උන්නේ මා ළඟමය. රෑ මම කැරකුනෙමි. නිවසේ රැයක් ඉන්නවානම් ජයසූරිය මහතා අවසර දිය යුතුය.

ඔහු උන්නේ සැනසීමෙන් මෙන් මිදුලේ ඇවිදිමිනි.

මම ගියෙමි.

"සර්..."

මගේ වදන් ආවේ උගුරෙන් මෙන්ය.

"මො..කෝ මේ තාම උදේ ඇඳුම පිටින්..."

ඔහු ඇසුවේය. දැන් සියල්ලන්ම පිටව ගොස්ය. අම්මා ගියේ මාව දහස් වතාවක් සිපගෙනය. 'මහත්තයා මොනවාහරි කියන්න ඉන්නේ මහත්තයෝ... කියන විදිහක් කරන්න...' ඇය කියා ගියාය. මම හිස වැනුවෙමි.

"බ..බා..ට බෙහෙත් ටිකත් දුන්නා සර්..."

ඔහු සිනාසුනේය.

"ඉතින් නිර්වාන්..."

ඔහු සිනාබරව මා දෙස බැලුවේය.

"ය..න්..න ගිහින් වොෂ් එකක් දාගෙන ඔයත් නිදාගන්න..."

මට පුදුමය.

"අද ඉඳලා මේ ගෙදර ඔයාගෙත් ගෙදර... හොඳද... ඒක මතක තියාගන්න..."

මගේ කඳුළු වැටුණි.

"මම පිළිවෙලට වෙඩින් එකක් අරන් දෙන්නම්..."

"හො...ඳ..යි සර්..."

මම අඬමින් කීවෙමි. ඔහු පැමිණ මගේ උරතලයට අතක් තැබුවේය.

"ඔ..යා හොඳ කොල්ලෙක් කියලා මම දන්නවා... ඒත් වටින කොල්ලෙක් කියලා ඔප්පු කරලා පෙන්නුවා... මට ඔයාව මගේ බෑණා කරගන්න ඕන නෑ..."

ඔහු කීවේය. මගේ පපුව රත්විය.

"මෙහේ ඉන්නවානම් මගෙයි අම්මගෙයි පුතා වෙලා ඉන්නෝන... බෑණා නෙමේ..."



මට ඉකි ගැසිණ.

"ම..ම ම..ගේ අම්මවයි තා..ත්..ත..ව..යි වගේ සර්වයි අම්මවයි බලාගන්නම් සර්..."

ඔහු හැඟීම්බරව බලාගෙන උන්නේය.

"මම ඒක දන්නවා... ම් යන්න නිදාගන්න... කෙල්ලටත් මහන්සියි..."

මම මිදුලේම දණගසා ඔහුට වැන්දෙමි.

"ම් නිදාගන්න... අපි උදේ කතාකරමු..."

මම හිස වැනුවෙමි.

The Reader's Place
Novel..

* * * * * * * * *

ඉනුත් මාස දෙකකට පසු සමාධිගේත් මගේත් විවාහ මංගල උත්සවය කොළඹ තරු පන්තියේ හෝටලයකදී පැවැත්විණ. කෙල්ල මලක් වගේ මා ළඟ උන්නාය.

අප මධුසමයට ගියේ සිංගප්පූරුවටය. ඒ කෙල්ලගේ බලකිරීමටය. අපි අපේ ලෝකය තැනුවේ ඈත පෙරදිගන්තයේ ඒ සුන්දර රටේය.

"දෙන්නා එක්ක එහේ නතරවෙනවා එහෙම නෙමේ... හොඳද.. මේ බලාගන්න අම්මලා දෙන්නෙක් ඉන්නවා තාත්තලා දෙන්නෙක් ඉන්නවා... හරි..."

ජයසූරිය මහතා කීවේය. අපි සිනාසුනෙමු.

"අපිටත් බලාගන්න බබාලා ඉන්නවා තාත්ති..."

කෙල්ල කටකාරකමට කීවාය. හැමෝම

සිනාසුනෝය. අපි කටුනායක ගුවන් තොටුපළේ පිටවීමේ පර්යන්තයේදී සියල්ලන්ටම වැඳ සමුදුන්නෙමු.

ගුවන් යානයට බෝඩින් කරන්නට තව පැය තුනක් ඇත. කෙල්ල මගේ වතට බරවී ගුවන් තොටුපළ දෙස බලාගෙනම උන්නාය.

"සු..දූ..."

"ම්..."

"ඇ..යි කතාකරන්නේ නැත්තේ..."

ඇය ඇසුවාය.

"දැන් කතාකරන්න බෑ බබා..."

"ඇ..යි..."

"කතාකරන්න තව අවුරුදු පනහක් විතර තියෙන්නේ..."

"ඒත් අපරාදෙනේ එක දවසක් අඩුකරගන්නේ..."

"ම්..."

මම ඇගේ අතක් අල්ලාගත්තෙමි. දැන් ඒ අත ඉස්සර වාගේම ලස්සනය. මම ඇයව ළඟ තියාගෙන මාස දෙකක් කැව්වෙමි.

"ඇ..යි ම්..."

"සුදු අත මට ලැබුණා..."

"තව ටිකෙන් සුදු අතට සුදු මේස් දාලා පස් යට වැළලෙනවා..."

මම ඇගේ කටට ගැසුවෙමි.

"උඹයි රිදුනත් එක්ක..."



ඇය මාව කොනිත්තා, කීවාය.

"මහත්තයෝ..."

"ම්..."

"ජීවිතේ ලස්සන නේද..."

"ඒකනේ කට වහගෙන ඒකේ හැඩ බලපන්කෝ... වද දෙන්නේ නැතුව..."

මට කියවිණ.

"ඉතින් බං එච්චර හැඩ මම නිසානේ..."

ඇය සිනාසී කීවාය. මම ඒ මුහුණ දෙස බැලුවෙමි.

"ඇත්තටම හැඩ උඹ නිසා තමයි..."

සමාධි එයාපෝට් එකේ කියා නොසිතා මාව වැළඳගත්තාය.

"අ..නේ නෑ... මෙච්චරම හැඩ මගේ සුදූ නිසා... මම වගේ කෙල්ලෝ ලක්ෂ ගාණක් ඉන්නවා... නිකං බාබන්ඩේසියා මල් වගේ... පොකුරට පිපිලා තියෙන්නේ... ඒත් ඔයා වගේ අය ඉන්නේ එක්කෙනයි දෙන්නයි... මටනම් ඒත් සැකයි දෙන්නෙක් ඉන්නවද කියලත්..."

සමාධි කීවාය.

"ජීවිතේ සැනසීම තියෙන්නේ ඔයා ළඟ...."

ඇය එසේ කියා සැනසීමෙන්ම මගේ උරතලයට බරවූවාය.

"බ..බා..."

"ම්..."

"තව ටිකකින් අපි අඩි තිස් තුන් දාහක් උඩ බබා..."

The Reader's Place Novel..

"ම්... නිලම්බරේ තිතක් වෙනවා..."

"එච්චර උඩදීත් මම පතන්නේ ඔයාව විතරයි..."

"මම දන්නවා... මට ආත්ම සීයක් විතර දෙන්න හොඳේ..."

"ආත්ම සීයක් මොකටද.. ගනින් මගේ සංසාරෙම..."

"මම උඹටත් නොකියා අරන් තියෙන්නේ බං..."

ඇය සිනාබරව කීවාය. මම කෙල්ලව තදින් ළංකරගත්තෙමි. මොකක්දෝ හේතුවක් නිසා මගේ දෑස් තෙත්විය. සමහරවිට මේ ආත්ම භවයේ ගලන අවසන් කඳුළත් අදම ගලාගෙන යනවා වියයුතුය.

නිමි.

ආදරයේ දෙවිඳුන් ඇත්තේ
යහපත් පුණ්‍යවන්ත වූ හදවත්වල පමණක් යැයි
ඔබට ඔප්පුකර පෙන්වනු වස්
සුජීව ප්‍රසන්න ආරච්චි වන මා විසින් ලියන ලද
නිලම්බරේ වෘතාන්ත නවකතාව
මෙසේ නිමා කරමි.

The Reader's Place
Novel..

සුජීව ප්‍රසන්න ආරච්චි ලියූ
අලුත්ම නවකතා...

**දෙනෙත් - ආදර දෑසක්**

**නිම්නා - සුදු අරලිය**

දැන් පිටවී ඇත.